77 වන කාණ්ඩය
14 වන කලාපය

සඳුදා
1968 මාර්තු 25

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන [තී. 2409]

ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව [තී. 2413]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 2414]

නින්දගම් ඉඩම් පනත් කෙටුම්පත [තී. 2427] :
දෙවන වර කියවා "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

කල් තැබීමේ යෝජනාව [තී. 2530]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 2545]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 77
இல. 14

திங்கட்கிழமை
25 மார்ச் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்


அறிவிப்புக்கள் [ப. 2409]

கணக்காளர் நாயகத்தினது அறிக்கை [ப. 2413]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2414]

நிந்தகமக் காணிகள் மசோதா [ப. 2427] :
இரண்டாம் மதிப்பிடப்பெற்று நிலையற்குழு " பி " க்குச் சாட்டப்பட்டது.

ஒத்திவைப்புப் பிரேரணை [ப. 2530]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 2545]


---

Volume 77
No. 14

Monday
25th March 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS [Col. 2409]

REPORT OF THE AUDITOR-GENERAL [Col. 2413]

ORAL ANSWERS TO QUESTIONS [Col. 2414]

NINDAGAMA LANDS BILL [Col. 2427] :
Read a Second time, and allocated to Standing Committee " B "

ADJOURNMENT MOTION [Col. 2530]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 2545]



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිවේදන

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

## House of Representatives

**1968 මාර්තු මස 25 වැනි සඳුදා**

திங்கட்கிழமை, 25 மார்ச், 1968.

*Monday, 25th March 1968*

---

**අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.**

சபை, பி.ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 2 P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] in the Chair.*

---

## නිවේදන

அறிவிப்புக்கள்

ANNOUNCEMENTS

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I have to make the following Announcements :

I

HENDALA SUSITHA WADANA SAMITHIYA (INCORPORATION) BILL

"Hendala Susitha Wadana Samithiya (Incorporation) Bill" නමැති කෙටුම්පත් පනත සලකා බැලීම පිණිස 136 වැනි ස්ථාවර නියෝගය යටතේ නියෝජ්‍ය කථානායක තැන්පත් එම්. සිවසිතම්පරම් මයා. "ඒ" ස්ථාවර කාරක සභාවේ සභාපති වශයෙන් මා විසින් පත්කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

තවද, මෙම කෙටුම්පත් පනත සලකා බැලීම පිණිස "ඒ" ස්ථාවර කාරක සභාවට මතු පළවන මන්ත්‍රීන් අතිරේක සාමාජික යන් වශයෙන් මා විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි :

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල
එස්. ද එස්. ජයසිංහ මයා., ඕ.බී.ඊ.
ගාමිනී ජයසූරිය මයා.
ආර්. ප්‍රේමදාස මයා.
සුගතදාස අරඹවල මයා.
ටී. බී. ඉලංගරත්න මයා.
එච්. කුලරත්න මයා.
ප්‍රින්ස් ගුණසේකර මයා.
ලක්ෂ්මන් ජයකොඩි මයා.
රාජ්‍යනීතිඥ වර්නන් ජොන්ක්ලස් මයා.
වී. එන්. නවරත්නම් මයා.
ආර්. එස්. පෙරේරා මයා.
පී. බී. විජේසුන්දර මයා.
පී. බී. ඒ. වීරකෝන් මයා.
එස්. කේ. කේ. සූරියාරච්චි මයා.

In terms of Standing Order No. 136, I have appointed Mr. M. Sivasithamparam, Deputy Speaker, Chairman of Standing Committee "A" for the consideration of the Hendala Susitha Wadana Samithiya (Incorporation) Bill.

I have also nominated the following additional Members to serve on Standing Committee "A" for the consideration of the Bill:

The Hon. I. M. R. A. Iriyagolle
Mr. S. de S. Jayasingha, O.B.E.
Mr. Gamani Jayasuriya
Mr. R. Premadasa
Mr. Sugathadasa Arambewala
Mr. T. B. Ilangaratne
Mr. H. Kularatne
Mr. Prins Gunasekera
Mr. Lakshman Jayakody
Mr. Vernon Jonklaas, Q.C.
Mr. V. N. Navaratnam
Mr. R. S. Perera
Mr. P. B. Wijesundara
Mr. P. B. A. Weerakoon
Mr. S. K. K. Suriarachchi.

II

GALLE MUNICIPAL STAFFS BENEVOLENT ASSOCIATION (INCORPORATION) BILL

"Galle Municipal Staffs Benevolent Association (Incorporation) Bill" නමැති කෙටුම්පත් පනත සලකා බැලීම පිණිස 136 වැනි ස්ථාවර නියෝගය යටතේ නියෝජ්‍ය කථානායක තැන්පත්, එම්. සිවසිතම්පරම් මයා. "ඒ" ස්ථාවර කාරක සභාවේ සභාපති වශයෙන් මා විසින් පත් කරණ ලද බව දන්වනු කැමැත්තෙමි.

තවද, මෙම කෙටුම්පත් පනත සලකා බැලීම පිණිස "ඒ" ස්ථාවර කාරක සභාවට



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කථානායකතුමා]

මතු පළවන මන්ත්‍රීන් අතිරේක සාමාජිකයන් වශයෙන් මා විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල
එස්. ද එස්. ජයසිංහ මයා., ඕ.බී.ඊ.
ගාමනී ජයසූරිය මයා.
ආර්. ප්‍රේමදාස මයා.
සුගතදාස අරඹවල මයා.
එච්. ජී. ඇල්බට් කාරියවසම් මයා.
එච්. කුලරත්න මයා.
ප්‍රින්ස් ගුණසේකර මයා.
රාජනීතිඥ වර්නන් ජොන්ක්ලස් මයා.
එල්. සී. ද සිල්වා මයා.
වී. එන්. නවරත්නම් මයා.
ඩී. ටී. පස්කුවල් මයා.
ජෝර්ජ් රාජපක්ෂ මයා.
පර්සි වික්‍රමසිංහ මයා.
පී. බී. ඒ. වීරකෝන් මයා.

II

In terms of Standing Order No. 136, I have appointed Mr. M. Sivasithamparam, Deputy Speaker, Chairman of Standing Committee "A" for the consideration of the Galle Municipal Staffs Benevolent Association (Incorporation) Bill.

I have aslo nominated the following additional Members to serve on Standing Committee "A" for the consideration of the Bill :

The Hon. I. M. R. A. Iriyagolle
Mr. S. de S. Jayasinghe, O.B.E.
Mr. Gamani Jayasuriya
Mr. R. Premadasa
Mr. Sugathadasa Arambewala
Mr. H. G. Albert Kariyawasam
Mr. H. Kularatne
Mr. Prins Gunasekera
Mr. Vernon Jonklaas, Q.C.
Mr. L. C. de Silva
Mr. V. N. Navaratnam
Mr. D. T. Pasqual
Mr. George Rajapaksa
Mr. Percy Wickremasinghe
Mr. P. B. A. Weerakoon.



III

NORTHERN PROVINCE TEACHERS' ASSOCIATION BENEVOLENT FUND (INCORPORATION) BILL

"Northern Province Teachers' Association Benevolent Fund (Incorporation) Bill" නමැති කෙටුම්පත් පනත සලකා බැලීම පිණිස 136 වැනි ස්ථාවර නියෝගය යටතේ නියෝජ්‍ය කථානායක තැන් පත් එම්. සිවසිතම්පරම් මයා. "ඒ" ස්ථාවර කාරක සභාවේ සභාපති වශයෙන් මා විසින් පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

තවද, මෙම කෙටුම්පත් පනත සලකා බැලීම පිණිස "ඒ" ස්ථාවර කාරක සභාවට මතු පළවන මන්ත්‍රීන් අතිරේක සාමාජිකයන් වශයෙන් මා විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල
එස්. ද එස්. ජයසිංහ මයා., ඕ.බී.ඊ.
ගාමනී ජයසූරිය මයා.
ආර්. ප්‍රේමදාස මයා.
ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
සුගතදාස අරඹවල මයා.
එම්. සී. අහමඩ් මයා.
එච්. කුලරත්න මයා.
රාජනීතිඥ වර්නන් ජොන්ක්ලස් මයා.
පී. එම්. කේ. තෙන්නකෝන් මයා.
වී. එන්. නවරත්නම් මයා.
කේ. බී. රත්නායක මයා.
පී. බී. ඒ. වීරකෝන් මයා.
එස්. කේ. කේ. සූරියාරච්චි මයා.
ටී. බී. එම්. හේරත් මයා.

III

In terms of Standing Order No. 136, I have appointed Mr. M. Sivasithamparam, Deputy Speaker, Chairman of Standing Committee "A" for the consideration of the Northern Province Teachers' Association Benevolent Fund (Incorporation) Bill.

I have also nominated the following additional Members to serve on Standing Committee "A" for the consideration of the Bill.

The Hon. I. M. R. A. Iriyagolle
Mr. S. de S. Jayasingha, O.B.E.
Mr. Gamani Jayasuriya
Mr. R. Premadasa
Mr. A. L. Abdul Majeed
Mr. Sugathadasa Arambewala
Mr. M. C. Ahamed
Mr. H. Kularatne

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Mr. Vernon Jonklaas, Q.C.
Mr. P. M. K. Tennekoon
Mr. V. N. Navaratnam
Mr. K. B. Ratnayake
Mr. P. B. A. Weerakoon
Mr. S. K. K. Suriarachchi
Mr. T. B. M. Herath.

## ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව

கணக்குப் பரிசோதனை அதிபரின் அறிக்கை

## AUDITOR-GENERAL'S REPORT

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I present the third instalment of the Report of the Auditor-General, under Article 71 (2) of the Ceylon (Constitution and Independence) Orders in Council, 1946 and 1947, on the Accounts of the Government of Ceylon for the Financial Year 1966-67 (Part I).

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

I move,

"That the third instalment of the Report of the Auditor-General, under Article 71 (2) of the Ceylon (Constitution and Independence) Orders in Council, 1946 and 1947, on the Accounts of the Government of Ceylon for the Financial Year 1966-67 (Part I), be printed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.

அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

*Ordered that the Report be printed.*



## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### බණ්ඩාරවෙල මහපලාත වි. සේ. ස. සමිති සංගමයේ පාලක මණ්ඩලය

பண்டாரவளை மஹபலாத்த ப. கூ. ச. ச. நிர்வாகக் குழு

### BOARD OF MANAGEMENT, BANDARAWELA MAHAPALATA M.P.C.S. UNION

2. **ආර්. එම්. අප්පුහාමි මයා.** (බණ්ඩාරවෙල)
(திரு. ஆர். எம். அப்புஹாமி—பண்டாரவளை)
(Mr. R. M. Appuhamy—Bandarawela)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බණ්ඩාරවෙල මහපලාත විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ පාලනය සඳහා පත් කර ඇති පාලක මණ්ඩලයේ මහතුන්ට එම සමිති සංගමයෙන් යම්කිසි දීමනාවක් ගෙවනවාද? (ආ) එසේ ගෙවන්නේ නම්, එක් එක් මහතාට එම ගෙවීම් කරනු ලබන්නේ කෙසේද? (ඉ) පාලක මණ්ඩලය පත්වූ දින සිට 1967.12.15 දින දක්වා එම මණ්ඩලයේ සභාපති මහතා ඇතුළු අනිකුත් සාමාජික මහතුන්ට ගමන් ගාස්තු වශයෙන් හෝ වෙනත් දීමනාවක් වශයෙන් කොපමණ මුදලක් ගෙවා තිබෙනවාද? (ඊ) එසේ ගෙවා තිබේ නම් එක් එක් මහතාට ගෙවා ඇති මුදල් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරනවාද?

விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) பண்டாரவளை மஹபலாத்த பலநோக்குக் கூட்டுறவுச் சங்கத்தின் நிர்வாகத்திற்காக நியமிக்கப்பட்டுள்ள நிர்வாகக் குழுவினருக்கு அச்சங்கம் ஏதாவது பணம் கொடுக்கிறதா: (ஆ) அவ்வாறு கொடுப்பதாயின் ஒவ்வொருவருக்கும் எவ்வாறு கொடுக்கப்படுகிறது: (இ) நிர்வாகக்குழு நியமிக்கப்பட்ட தேதியிலிருந்து 15.12.1967 வரை அக்குழுவின் தலைவருட்பட ஏனைய அங்கத்தவர்களுக்குப் பிரயாணக் கட்டணமாகவோ வேறு கட்டணமாகவோ எவ்வளவு பணம் கொடுக்கப்பட்டுள்ளது? (ஈ) அவ்வாறு கொடுக்கப்பட்டிருப்பின் ஒவ்வொருவருக்கும் கொடுக்கப்பட்டுள்ள பணத்தை வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. අප්පුහාමි මයා.]

asked the Minister of Agriculture and Food: (*a*) Are the members of the board of management of the Bandarawela Mahapalata Multi-purpose Co-operative Societies Union paid an allowance by the said societies union? (*b*) If so, how are payments made to each such member? (*c*) How much of money has been paid as travelling expenses or as other allowance to the chairman and other members of this board from the date of its appointment till 15.12.1967? (*d*) If payment has been made, will he state the amounts paid to each such person?

**ගරු ජේ. ආර්. ජයවර්ධන (කෘෂිකර්ම හා ආහාර ඇමති වෙනුවට)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—விவசாய, உணவு அமைச்சர் சார்பாக)*

(The Hon. J. R. Jayawardene—on behalf of the Minister of Agriculture and Food)

(*a*) Yes. (*b*) Payments are made as follows: (i) Subsistence allowance of Rs. 12 per day for working in the area of the union, or Rs. 15 per day for working outside the area of the union, and Rs. 5 per day in respect of lodging expenses. (ii) Travelling allowance of 35 cts. per car-mile, or bus fare or second class train fare depending on the mode of conveyance. These payments are subject to a maximum limit of Rs. 300 per mensem for the president and Rs. 75 for other members of the board. (*c*) Rs. 10,159.15 (*d*):

| | |
|---|---|
| Mr. N. G. S. Panditharatne—President .. | 9,345.55 |
| Mr. K. G. N. H. Wijesinghe .. | 390.00 |
| Mr. N. A. Liyanage .. | 18.40 |
| Mr. L. A. Perera .. | 231.00 |
| Mr. J. Herath .. | 165.20 |
| | 10,150.15 |



## ධීවර කටයුතු

கடற்றொழில்

FISHERIES

**ආර්. ජේ. ජී. ද මෙල් මයා. (දෙවිනුවර)**

*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*

(Mr. R. J. G. de Mel—Devinuwara)

කර්මාන්ත හා ධීවර කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ධීවර කටයුතු පිළිබඳ ව්‍යාප්ති වැඩ දැනට විධිමත් ලෙස සංවිධානය වී නැති බව එතුමා දන්නේද? (ආ) ධීවර කටයුතු කැරෙන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කෘෂිකර්ම කාරක සභාවලට සමානව ප්‍රාදේශීය ධීවර කාරක සභා පත් කිරීම ගැන එතුමා සලකා බලන්නේද? (ඉ) එසේ නම්, කවදාද?

கைத்தொழில், கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) கடற்றொழில் விஸ்தரிப்பு வேலை இப்போது மிகவும் மோசமாகத் திட்டமிடப்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா? (ஆ) மாவட்டக் கமத்தொழில் குழுக்களைப் போன்று மீன் பிடிக்கப்படும் மாவட்டங்களில் மாவட்டக் கடற்றொழில் குழுக்களை நியமிப்பதுபற்றி அவர் ஆலோசிப்பாரா? (இ) அங்ஙனமாயின், எப்பொழுது?

asked the Minister of Industries and Fisheries: (*a*) Is he aware that extension work with regard to fisheries is badly organized at present? (*b*) Will he consider the appointment of district fisheries committees in fishing districts, more or less on the lines of district agricultural committees? (*c*) If so, when?

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**

*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

(*a*) No. (*b*) Action has already been taken to set up Special Fisheries Sub-Committees of the District Co-ordinating Committees in the coastal districts on the same lines as the sub-committees handling food production and the implementation of the Agricultural Plan in each administrative division. (*c*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

ධීවර කාර්මික අනුකාරක සභා පත් කිරීම ගැන ගරු ඇමතිතුමාට ස්තුති වන්ත වන අතර එක අතුරු ප්‍රශ්නයක් අහන්නට කැමතියි. මාතර දිස්ත්‍රික්කයේ ධීවර කාර්මිකයන්ට ධීවර කාර්මික ආම්පන්න සලාක කාඩ් පත් ලබා ගැනීම සඳහා හම්බන්තොටට යන්නට සිදු වී තිබෙනවා. මේ අනුව දෙවිනුවර ප්‍රදේශයේ ධීවර කාර්මිකයන්ට ඒ සලාක කාඩ්පත් ලබා ගැනීමට හැතැප්ම 50ක් පමණ දුර යාමට සිදු වී තිබෙන නිසා එම ධීවර කාර්මිකයන්ට ඒ කාඩ් පත් මාතර ශාඛාවෙන් ලබා ගැනීමට පහසුකම් සලස්වනවාද කියා දැන ගන්නට සතුටුයි.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

ඒ කාරණය ගැන සලකා බලා ඒ අවස්ථාව සලසා දෙන්නට විරිය කරනවා.

### පළාත් පාලන සේවා විශ්‍රාමිකයින්

உள்ளூராட்சி இளைப்பாற்றுச் சம்பளம் பெறுபவர்

LOCAL GOVERNMENT PENSIONERS

6. ටී. බී. ඉලංගරත්න මයා. (කොලොන්නාව)
(திரு. ரி. பி. இலங்கரத்ன—கொலொன்னாவ)
(Mr. T. B. Ilangaratne—Kolonnawa)

පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) 1964.2.1 දිනට අවුරුදු 12½ කට වැඩි කාලයක් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ලාභීන්ව සිටි සහ තම විශ්‍රාම වැටුප් පරිවර්තනය කළ අයට, රජයේ සේවයේ විශ්‍රාම වැටුප් ලාභීන්ට ගෙවන අන්දමට 1964.2.1 දින සිට සම්පූර්ණ විශ්‍රාම වැටුප් ගෙවා නැති බව එතුමා දන්නවාද ? (ආ) 1964.2.1 දින සිට මෙම විශ්‍රාම වැටුප් ලාභීන්ට ඔවුන්ගේ සම්පූර්ණ විශ්‍රාම වැටුප් වහාම ලබාදීමට එතුමා කටයුතු කරනවාද ?

உள்ளூராட்சி அமைச்சரினதும் தகவல், ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) 1.2.1964 இல் 12½ ஆண்டுகளுக்குமேல் இளைப்பாற்றுச் சம்பளம் பெறுபவர்களும் தமது இளைப்பாற்றுச் சம்பளங்களை மாற்று முறையாகப் பெற்றவர்களுமான உள்ளூராட்சிச் சேவை ஊழியர்களுக்கு, அரசாங்க இளைப்பாற்றுச் சம்பளம் பெறுபவர்களுக்குக் கொடுக்கப்படுவதுபோல 1.2.1964 முதல் முழு இளைப்பாற்றுச் சம்பளம் இன்னமும் கொடுபடவில்லையென்பதை அவர் அறிவாரா ? (ஆ) 1.2.1964 இலிருந்து இவர்களுக்குக் கொடுபடவேண்டிய முழு இளைப்பாற்றுச் சம்பளத்தை உடனடியாகக் கொடுப்பதற்கு அவர் ஆவன செய்வாரா ?

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting : (*a*) Is he aware that local government service pensioners of over 12½ years standing on 1.2.1964 and who had commuted their pensions have not yet been paid their full pensions with effect from 1.2.1964 as done in the case of government pensioners ? (*b*) Will he see that these pensioners are immediately granted their full pensions with effect from 1.2.1964 ?

එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)
(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி—உள்ளூராட்சி அமைச்சரதும் தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி சார்பாக)
(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance—on behalf of the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

(අ) ඔව්. (ආ) අභිනව පළාත් පාලන සේවා ව්‍යවස්ථා කෙටුම්පත නීතිගත වූ පසු මෙකී කරුණ සැළකිල්ලට භාජනය කරනු ඇත.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

දැනට තිබෙන නීතිරීති අනුව ඒක කරන්නට බැරිද කියා මා අහන්නට සතුටුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විමලසේන මයා.**

*(திரு. விமலசேன)*

(Mr. Wimalasena)

දැනට තියෙන නීති අනුව ඒක කරන්නට බැහැ.

**එල්. එල්. බෝගහවත්ත මහතා, විශ්‍රාම ලත් විදුහල්පති**

*திரு. எல். எல். போகாவத்தை, இளைப்பாறிய அதிபர்*

**MR. L. L. BOGAHAWATTA, RETIRED PRINCIPAL**

7. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මාර/තලහගම විදුහල්පති එල්. එල්. බෝගහවත්ත මහතා 1967.6.1 සිට සේවයෙන් විශ්‍රාම ලැබූ බව එතුමා දන්නවාද? (ආ) මෙම ගුරුවරයාට තවම විශ්‍රාම වැටුපක් නොලැබුණු බව එතුමා දන්නවාද? (ඉ) විශ්‍රාම වැටුප් සකස් කර දෙන තෙක් මෙම ගුරුවරයාට මාසික අත්තිකාරම් මුදලක් දීමට ක්‍රියා නොකරන ලද්දේ මන්ද? (ඊ) මාස හතක් ගතවන තුරු විශ්‍රාම වැටුප හෝ මාසික අත්තිකාරම් මුදලක් හෝ දීමට ප්‍රමාද වීමට හේතුව කුමක් දැයි එතුමා පැහැදිලි කරනවාද? (උ) මෙම ගුරුවරයාගේ විශ්‍රාම වැටුප් ලබා දෙන්නේ කවදාද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) மாத்தறை/தலஹகமை கல்லூரி அதிபர் திரு. எல். எல். போகாவத்தை 1.6.1967 இலிருந்து இளைப்பாறினர் என்பதை அவர் அறிவாரா? (ஆ) இவ்வாசிரியருக்கு இன்னும் இளைப்பாற்றுச் சம்பளம் கிடைக்க வில்லை என்பதை அவர் அறிவாரா? (இ) இளைப்பாற்றுச் சம்பளத்தைக் கணித்து வழங் கும்வரை, இவ்வாசிரியருக்கு மாதந்தோறும் முற்பணம் வழங்குவதற்கு நடவடிக்கை எடுக் காததேன்? (ஈ) ஏழு மாதங்கள் கழியும்வரை இளைப்பாற்றுச் சம்பளமோ, மாத முற்பண மோ வழங்குவதில் காலதாமதமேற்படக் காரணம் யாதென அவர் விளக்குவாரா? (உ) இவ்வாசிரியரின் இளைப்பாற்றுச் சம்பளத் தைப் பெற்றுத் தருவதெப்போது?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that Mr. L. L. Bogahawatta, Principal of MR/Thalahagama Vidyalaya retired from service with effect from 1.6.1967? (*b*) Is he aware that this teacher has not yet received a pension? (*c*) Why was no action taken to pay this teacher a monthly advance until his pension is prepared? (*d*) Will he explain why the payment of the pension or an advance has been delayed for seven months? (*e*) When will this teacher's pension be paid?

**ගාමණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(අ) ඔව්. විශ්‍රාම ලැබුවේ 1967.6.1 නොව 1967.7.1 දිනය. (ආ) 1968.2.16 වැනි දින රු. 40.00ක තාවකාලික විශ්‍රාම වැටුපක් අනුමත කර ඇත. (ඉ) ක්‍රියාකර ඇත. (ඊ) පැන නොනඟී. (උ) විශ්‍රාම වැටුප් ඉක්මණින් ලබා දීමට ක්‍රියා කරනු ලැබේ.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රාජකාරි කොට විශ්‍රාම යන ගුරුවරුන්ට විශ්‍රාම වැටුප් ලබා දීම ප්‍රමාද වී තිබෙන බව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා දන්නවාද? ඒ සම්බන්ධයෙන් එතුමා ගන්න පියවර මොනවාද?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

නොයෙක් නොයෙක් කරුණු නිසා සමහර ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාද වෙනවා. පුළුවන් තරම් ඉක්මනින් විශ්‍රාම වැටුප් ලබා දෙන ලෙස නියෝග කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 9.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
I want time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 10.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මාසයක් කල් ඉල්ලනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 11.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)
සතියක් කල් ඉල්ලනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 12.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)
සතියක් කල් ඉල්ලනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## අධ්‍යාපන පරීක්ෂක නිලධාරීන් : දෙමළ ප්‍රවීණතා පරීක්ෂණය, 1963

கக்கல்விப் பரிசோதனை உத்தியோகத்தர் : தமிழ்மொழி தகுதிகாண் தேர்வு, 1963.

EDUCATION INSPECTING OFFICERS : TAMIL PROFICIENCY EXAMINATION 1963

13. **ජෝර්ජ් අබයගුණසේකර මයා.** (හඟුරන්කෙත)
*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர—ஹங்குரங்கெத்த)*
(Mr. George Abeyagoonasekera—Hanguranketa)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පරීක්ෂක නිලධාරීන් සහ එවැනි ශ්‍රේණිවල නිලධාරීන් සඳහා දෙමළ ප්‍රවීණතා පරීක්ෂණයක් 1963 දී හෝ එයට නුදුරු වර්ෂයක දී පවත්වන ලද්දේද? (ආ) ඉහත සඳහන් පරීක්ෂණයට ඉදිරිපත් වූ සමහර අපේක්ෂකයින් කොපි කරන ලද බව හෝ වෙනත් අයුරකින් වංචා සහගතව හෝ කටයුතු කරන ලද බව එතුමා දනියිද? (ඉ) මෙසේ කොපි කරන ලද හෝ වංචනික ක්‍රියාවල යෙදුන තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම් එතුමා දන්නවාද? (ඊ) මෙසේ යෙදුන බවට වාර්තා කරන ලද තැනැත්තාගේ නම හෝ තැනැත්තන්ගේ නම් එතුමා සඳහන් කරන්නේද? (උ) මේ ගැන පරීක්ෂණයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් අබයගුණසේකර මයා.]

පවත්වන ලද්දේද? එසේ නම් කවරෙක් විසින්ද? කුමන දිනයකදීද? (ඌ) පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් අනාවරණය කරන ලද කරුණු කවරේද? (එ) එම වාර්තාව ඉදිරිපත් කරනවාද? (ඒ) පරීක්ෂණය පැවැත් වූ නිළධාරියාගේ වාර්තාව ක්‍රියාත්මක කිරීමට පියවරක් ගන්නා ලද නම් ඒ කුමක්ද? (ඔ) විරුද්ධව වාර්තා කරනු ලැබූ නිළධාරීහු දැනට කොහි සිටිත් ද? ඒ අයගේ වර්තමාන තනතුරු කවරේද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினு: (அ) கல்வித் திணைக்களத்திலுள்ள பரிசோதிக்கும் உத்தியோகத்தர்களுக்கும், அதே போன்ற தரங்களில் உள்ளோருக்கும் 1963 ஆம் ஆண்டில் அல்லது அவ்வாண்டின் அண்மையில் தமிழ் மொழியில் தகுதி காண் தேர்வொன்று நடாத்தப்பட்டதா? (ஆ) அத்தேர்வுக்குத் தோற்றிய தேர்வுநாடிகளில் சிலர் பிரதி பண்ணிஞர்களெனவும் அல்லது வேறுவிதமாக ஏமாற்றிஞர்களெனவும் அறிக்கை செய்யப்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா? (இ) பிரதி பண்ணிஞர்களெனவும் அல்லது வேறு விதமாக ஏமாற்றிஞர்களெனவும் அறிக்கை செய்யப்பட்ட ஆள் அல்லது ஆட்களின் பெயர் அல்லது பெயர்களை அவர் அறிவாரா? (ஈ) அறிக்கை செய்யப்பட்ட ஆள் அல்லது ஆட்களின் பெயர் அல்லது பெயர்களை அவர் கூறுவாரா? (உ) அவ்வறிக்கை பற்றி ஒரு விசாரணை நடைபெற்றதா? அப்படியாயின் யாரால்? எப்பொழுது? (ஊ) விசாரணை உத்தியோகத்தரின் முடிபுகள் யாவை? (எ) அவ்வறிக்கையை அவர் சமர்ப்பிப்பாரா? (ஏ) விசாரணை உத்தியோகத்தரின் முடிபுகளைச் செயற்படுத்த என்ன நடவடிக்கைகள் எடுக்கப்பட்டிருக்கின்றன? (ஐ) எதிரான அறிக்கை சமர்ப்பிக்கப்பட்டுள்ள உத்தியோகத்தர்கள் எங்கு உள்ளார்கள்? அவர்களின் தற்போதைய நியமனங்கள் எவை?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Was a proficiency examination in the Tamil language for inspecting officers and similar grades of the Education Department held in or about the year 1963? (*b*) Is he aware that certain candidates who sat for this examination were reported to have copied and or otherwise cheated? (*c*) Is he aware of the names of the person or persons reported to have copied and or otherwise cheated? (*d*) Will he give the name or names of the person or persons so reported? (*e*) Was an inquiry held into this and if so by whom, and when? (*f*) What were the findings of the inquiring officer? (*g*) Will he table that report? (*h*) What steps, if any, have been taken to implement the report of the inquiring officer? (*j*) Where are the officers against whom the report was made and what are their present appointments?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

(*a*) Yes. In August 1961. (*b*) A report was received to the effect that certain candidates copied at the examination. (*c*) I am aware of the names of the accused officers. (*d*) The Public Service Commission has decided that all the officers against whom the allegations were made are not guilty. As these officers are in service at present and as the Public Service Commission has decided that they are not guilty, I feel it is not desirable, on administrative grounds, to divulge their names. Therefore, permission is sought not to give out these names. (*e*) Yes. An inquiry was held on 25.5.1962 and 26.5.1962 by an officer who had been delegated for the purpose by the Public Service Commission. The accused officers were proved not guilty. (*f*) Does not arise in view of (*e*). (*g*) As this is purely a matter coming within the powers of the Public Service Commission this request is not proper. (*h*) The Public Service Commission has decided that all the accused officers are not guilty. (*j*) Please see reply at (*d*).

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 4.

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. சி. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளு மன்றக் காரியதரிசி)*

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

I want two weeks' time to answer that Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

කථානායකතුමා

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 5.

**ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. பி. வெலகெதர—தேசிய மய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. D. B. Welagedara—Parliamentary Secretary to the Minister of Nationalized Services)

මාසයක් කල් ඉල්ලනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*



**ඩී. එම්. ආරියරත්න මහතා, ශිෂ්‍ය ගුරු, කැටයාපතන විදුහල**

*திரு. டீ. எம். ஆரியரத்ன, மாணவ ஆசிரியர், கெடயாபத்தன கல்லூரி.*

MR. D. M. ARIYARATNE, PUPIL TEACHER, KETAYAPATHANA VIDYALAYA

**8. එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ—ටී. බී. එම්. හේරත් මයා. —වලපනේ—වෙනුවට)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. ரி. பி. ஹேரத்—வளப் பனே—சார்பாக)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. T. B. M. Herath—Walapane)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නු/ කැටයාපතන විදුහලේ ඩී. එම්. ආරියරත්න නමින් ශිෂ්‍ය ගුරුවරයෙකු සේවයේ යෙදී සිටින බව එතුමා දන්නවාද? (ආ) මොහු මහනුවර මහේස්ත්‍රාත් උසාවියේ අංක 45018 දරණ, වැඩි මිළට බඩු විකිණීම ගැන චෝදනා නගා තිබූ නඩුවකින් ඩී. එම්. අභයරත්න නමින් පෙනී සිට 1965.10.27 යන දින රු. 500 දඩයක් සහ එක් දිනක සිර දඬුවමක් ලැබූ බව එතුමා දන්නවාද? (ඉ) මේ පිළිබඳව 1967.10.7 දා ලියාපදිංචි තැපෑලෙන් නුවර එළියේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට වී. එම්. ඒ. වීරසිංහ නැමැත්තෙක් පැමිණිලි කළේද? (ඊ) මේ පැමිණිල්ල ගැන මෙතෙක් කුමක් කර තිබේද? (උ) එහි ප්‍රතිඵල කවරේද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) கண்டி/கெடயாபத்தன கல்லூரியில் டீ. எம். ஆரியரத்ன என்ற பெயருடைய ஒருவர் மாணவ ஆசிரியராகப் பணியாற்றுவதை அவர் அறிவாரா? (ஆ) இவர் கண்டி நீதவான் நீதிமன்றத்தில் கூடுதல் விலைக்குப் பொருட்கள் விற்றதாகக் குற்றஞ் சாட்டப்பெற்றுத் தொடரப்பட்ட 45018 ஆம் இலக்க வழக்கில் டீ. எம். அபயரத்ன என்ற பெயரில் தோன்றி, 27.10.1965 அன்று 500 ரூபாய்த் தண்டமும், ஒரு நாள் சிறைத் தண்டனையும் பெற்றதை அவர் அறிவாரா? (இ) இதுபற்றி 7.10.1967 அன்று திரு. வீ. எம். ஏ. வீரசிங்க நுவரேலியாக் கல்வி அதிபருக்குப்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

பதிவு அஞ்சல் வாயிலாக முறைப்பாடு செய் தாரா? (ஈ) இம்முறைப்பாடு பற்றி இதுவரை எந்நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that a pupil teacher by the name of D. M. Ariyaratne is serving on the staff of නු/Ketayapathana Vidyalaya? (*b*) Is he aware that a fine of Rs. 500 and one day's imprisonment was imposed on this individual on 27.10.65 when he appeared as D. M. Abhayaratne on a charge of profiteering in case No. 45018 in the Magistrate's Court, Kandy? (*c*) Did an individual by the name of T. M. A. Weerasinghe make a complaint to the Director of Education, Nuwara Eliya, in this connection, by registered post, on 7.10.67? (*d*) What action has been taken in this regard? (*e*) With what result?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

(*a*) Yes. (*b*) No. (*c*) Yes. (*d*) An inquiry has been held. (*e*) The charges have not been proved.

## නින්දගම් ඉඩම් පනත් කෙටුම්පත

*நிந்தகமக் காணிகள் மசோதா*

NINDAGAMA LANDS BILL

කල් තබන ලද විවාදය නව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [පෙබරවාරි 25.]

"කෙටුම්පත් පණත දෙවන වර කියවිය යුතුය."—[ගරු. සී. පී. ද සිල්වා.]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

பெப்ரவரி 25 ஆம் தேதிய வினா மீதான ஒத்தி வைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிடப்படுமாக" [கௌரவ சீ. பீ. டி சில்வா].

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question—[25th February.]*

*"That the Bill be now read a Second time".—[The Hon. C. P. de Silva.]*

*Question again proposed.*

අ. භා. 2.12

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
*(திரு. பெர்னட் சொய்ஸா—கொழும்பு தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)

ගරු කථානායකතුමනි, පසුගිය වාරයේදී විවාදය නතර කරන අවස්ථාවේ මා විස්තර කරමින් සිටියේ අද විවාදයට භාජනව තිබෙන පනත යටතේ බලාපොරොත්තු වන සහනයන් ඒ ගැමි ජනතාවට නොලැබෙන බවයි. ඒ පිළිබඳව තව දුරටත් විස්තර කරන්නට නම් ඇත්තෙන්ම මේ පනතේ තිබෙන දුර්වලකම් රාශියක් ගැන විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. මේ පනතේවත් ලංකාවේ තිබෙන ඉඩම් ප්‍රශ්නය පිළිබඳව—ශතවර්ෂයකටත් වැඩි කාලයක් තිස්සේ පැවත එන ඉඩම් ප්‍රශ්නය පිළිබඳව—නීත්‍යානුකූල වැඩ පිළිවෙළක් ඇති කර ගැනීමේ යෝජනාවක් දකින්නට නැහැ. මෙහි එවැන්නක් ගැබ් වී නැහැ.

ගරු කථානායකතුමනි, බ්‍රිතාන්‍ය පාලන සමය ආරම්භයෙහි සිටම ඉඩම් පිළිබඳව නීති සම්පාදනය කිරීමේ ඉතිහාසය දෙස ලුහුඬින්වත් බැලුවොත් එයින් වැටහී යන්නේ ඒවා ක්‍රමානුකූලව මේ රටේ බහුජනතාවගෙන්—ගැමි ජනතාවගෙන්—ඔවුන් සතුව තිබුණු අයිතිවාසිකම් පැහැර ගැනීමටත් ඔවුනට හිරිහැර කිරීමටත් පනවන ලද නීති හැටියටයි. මේ පිළිබඳව කියන්නට තිබෙන්නේ ධනේශ්වර අදහසකින් මේ රට යට කර ගත් බ්‍රිතාන්‍යයේ වාසිය බලාගෙන සකස් කළා වන්නට පුළුවන්ය යන්නයි. එහෙත් මෙවැනි ප්‍රශ්නයක් මෙහි තිබෙනවාය—නිරවුල් කරන්නට තරම් ප්‍රශ්නයක් තිබෙනවාය—ඒ නිසා ඒ සම්බන්ධයෙන් යම් පියවරක් ගතයුතුය යන චින්තනාවෙන් යම් පියවරක් ප්‍රථමයෙන්ම ගත්තේ වෙන කවුරුවත් නොව මුලින්ම මේ රටෙහි පාලන බලය භාරව හිටපු නෝර්ත් ආණ්ඩුකාරයායි. ඒ කාලයේ සිට මේ සම්බන්ධයෙන් නොයෙක් නීති පනවා තිබෙනවා. ඒ රෙගුලාසි මව්සින් අනුමත කරනු ලබනවා නොවෙයි. එහෙත් ප්‍රශ්නයක් තිබෙන බව සලකා ඊට විසඳුමක් වශයෙන් යම්කිසි පියවරක් ඉදිරිපත් කරන්නට බැලුවෝ කවුරුද? මුලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ ගැන පියවරක් ගත්තේ නෝර්ත් ආණ්ඩුකාරයා පමණයි. ඔහුගේ රෙගුලාසි මාලාවෙන් පසුව මේ රටේ ඉඩම් පිළිබඳව නීති සම්පාදනය වූවා නම්, හැමෙකකින්ම ගැමි ජනතාවට හිරිහැරයක් වූවා මිස සෙතක් නම් වූයේ නැහැ. ගැමි ජනතාවට අයිතිව තිබුණු ඉඩම්, විශේෂයෙන්ම 1817 ඌවේ මහ කැරල්ලෙන් පසුව ගැමි ජනතාව සතුව තිබුණු ඉඩම්—සමහර විට, රදල ඉඩම් හිමියන්, නින්ද හිමියන් සතුව තිබුණු ඉඩම්— විහාරවලට පූජා කර තිබුණු ඉඩම්, දේවාලවලට පරිත්‍යාග කර තිබුණු ඉඩම් ආදි මේවා මුඩු බිම් අණ පනත් යටතේ පැහැර ගෙන, බ්‍රිතාන්‍ය ධනේශ්වරයන්ගේ වුවමනාව සඳහා කෝපි වගාවට යොදන්නට පටන් ගත් බව මා නොකීවාට කථානායකතුමා දන්නවා ඇති.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)
කාටද, දුන්නේ ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
විශේෂයෙන් සුදු කොම්පැනිකාරයන්ට දුන් බව කර්මාන්ත ඇමතිතුමා හොඳාකාර දන්නවා ඇති. මීට පෙර කාලවලදී එතුමාත් සමග එකම වේදිකාවේ සිට මේ මුඩු බිම් අණ පනත් පිළිබඳව තදබල ලෙස විවේචනය කරන්නට මට සිදු වුණු බව දැන් ඉතා සතුටින් මතක් කරන්න කැමැතියි. එතුමාට නම් දැන් ඒ කාලය ඉකුත් වී අවසානයි. එහෙත් මෙවැනි අන පණත් ගෙනෙන අවස්ථාවලදී ඉඩම් ඇමතිතුමාට නම් මේ කාරණා විශේෂයෙන් මතක් කර දෙන්නට මා තාමත් සතුටු බව කර්මාන්ත ඇමතිතුමාට මතක් කරන්න කැමැතියි.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)
1818 දී රදල පවුල් කීපයකට ඉඩම් ලැබුණේ නැද්ද කියායි මා ඇහුවේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
පවුල් කීපයකට ලැබුණා.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)
ඒකයි, මා ඇහුවේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
එසේ ඉඩම් ලැබූ අයගේ ආරක්ෂාවට කිසිම විධියකින් කථා කරන්නට මගේ සූදානමක් නැහැ. ලංකාවේ රදල පවුල් ස්වල්පයකට ඒ ඉඩම් ලැබුණාට වඩා, බ්‍රිතාන්‍ය කොම්පැණිකාරයන්ට ඒ ඉඩම් ලැබීම ගැනයි මෙතැන වැඩියෙන්ම කථා කරන්නට අවශ්‍ය වී ඇත්තේ. රදල පවුල්වලට ලැබුණා නම්, ඒවා ලැබී ශත වර්ෂ 1½ කට පසුව දැන් ඔවුන් ආරක්ෂා කරමින් එකම වචනයක්වත් කථා කරන්නට වුවමනාවක් ඇතැයි මා කල්පනා කරන්නේ නැහැ. එදා පැවැති ඉතිහාසගත තත්ත්වය අනුව අපේ රටේ සිටි යම් යම් අයට, බ්‍රිතාන්‍යයන්ට හවුල් වූ අයට, බ්‍රිතාන්‍ය පාලනයක් ගෙන යාමට හවුල් වූ හා හවුල් වන්නට බලාපොරොත්තු වුණු අයට, ඉඩම්වලින් යම් යම් වාසි ලැබුණු බව ඇත්ත තමයි. එහෙත් එකක් කියන්න කැමැතියි. යම් හේතුවක් නිසා මුතුන් මිත්තන්ට ලැබුණු ඉඩම් චිරාගතව තමන්ට අයිති වුණු පළියට, අද ජීවතුන් අතර සිටින, ඒ මුතුන්මිත්තන්ගේ පෙළපතේ අයට දොස් පවරනවා නම් කර්මාන්ත ඇමතිතුමාවත්, මාවත් බේරෙන්නේ නැහැ.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)
අපේ පරම්පරාවේ කිසිම කෙනකුට අධිරාජ්‍යවාදීන්ගෙන් කිසිවක් ලැබුණේ නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
මා ඒ සම්බන්ධයෙන් දොස් කියන්නට ලැස්ති නැහැ. ඒ අනෙකක් නිසා නොව, කර්මාන්ත ඇමතිතුමාගේ දිවංගත මුතුන්මිත්තන් ගැරහීම සඳහා එකම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

වචනයක්වත් කියන්නට මා අකමැති නිසායි. රදලකමින් තොරව වෙළෙඳාම් පිළිවෙළින් ඇති වන ගසාකෑමවත් ආරක්ෂා කරන්නට මා කැමැති නැති බව පමණක් කර්මාන්ත ඇමතිතුමාට පිළිතුරු වශයෙන් කියන්නට කැමැතියි.

අද පවතින නීතිය යටතේ යම් යම් බලතල තිබෙනවා නම් "අපටයි, මේවා අයිති ; මෙය කාටවත් දෙන්නේ නැතැයි" කියමින් චිරාගතව ලැබුණු අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ප්‍රතිපත්තියකින් තොරව ඒ බලතල සියල්ලම පාවිච්චි කරනවා නම්, එසේ කටයුතු කරන වර්තමාන පරම්පරාවට පමණයි දොස් පවරන්නට පුළුවන්කම තිබෙන්නේ. එහෙත් ඒ චිරාගත අයිතිය අත් හරින්නට සූදානම්, වර්තමාන යුගයට නැත්නම් නූතන සමාජයට ඔබින ආකාරයට කටයුතු කරන්නට හා සමාජවාදී පිළිවෙළට ක්‍රියා කරන්නට සූදානම් අය සිටිනවා නම් "ඒ අයටත් ඔවුන්ගේ මුතුන්මිත්තන්ගේ මූලික පාපයක් පෙන්වා ඒ අනුව දඬුවම් කළ යුතුය" යන සිද්ධාන්තය ක්‍රියාත්මක කරන්නට නම් අප සූදානම් නැහැ.

ගරු කථානායකතුමනි, මෙන්න මේ ප්‍රශ්නය පිළිබඳව මා කියාගෙන ආවේ අප රටේ ගැමි ජනතාවට සිදු වූ හිරිහැරයයි. ඒ මුඩුබිම් අණපනත් යටතේ ඉඩම් පැහැර ගත්තා පමණක් නොවෙයි, ඉන් පසුව මේ ප්‍රශ්නය නිරවුල් කිරීමටය කියා ගත් පියවරවලින් ප්‍රශ්නය තව තවත් අවුලට පත් වුණා මිස කිසිම අන්දමක නිරවුලක් ඇති වුණේ නැහැ. 1840 පැනවූ රජයේ ඉඩම් ආඥාපනතින් තමයි, මුලින්ම කියා තිබියේ පදිංචියෙන් හෝ ගොවිතැනින් හෝ අයිතියක් තිබෙන බව ඔප්පු කළේ නැත් නම්, එමෙන්ම මුඩු බිමක් වශයෙන් හෝ වගාවට පාවිච්චි නොකරන ඉඩමක් වශයෙන් හෝ සඳහන් කරන්නට පුළුවන් යම් ඉඩමක් තිබෙනවා නම්, ඒ ඉඩම සින්නක්කරවම රජයට අයිතියි කියන ප්‍රතිපත්තිය ඉදිරිපත් කළේ. කේ. එන්. ද සිල්වා මහතා පෙන්වා දෙන ආකාරයට රජයක් රජයේ අයිතිය ඔප්පු කළ යුතුයි කියන ප්‍රතිපත්තිය කොයිම රජයකටවත් පිළිගන්නට බැරි බව ඇත්තයි. එසේ කරන්නට ගියොත් ආණ්ඩුව යම් යම් උසාවිවල සෑම මොහොතකම කාලය ගත කරන තත්ත්වයට රජයේ නිලධාරීන් පත් වෙනවා ඇති. ඒ නිසා තමයි එය අනික් පැත්තට සකස් කළේ. මේ ප්‍රතිපත්තිය අනුව ඉඩමේ අයිතිය රජයටයි. වෙන කෙනෙකුට එහි අයිතියක් තිබෙනවා නම් ඒ තැනැත්තා එය ඔප්පු කළ යුතුයි. ඒ අනුව තමන්ට තිබෙන හිමිකම සනාථ කර ගැනීමේ වගකීම පුරවැසියාට බාර දුන්නා. ඒ කටයුත්ත රජය බාර ගත්තේ නැහැ.

ආණ්ඩුවේ වුවමනාවන් අනුව සලකා බලන විට මේ ප්‍රතිපත්තිය යුක්තිසහගතයි කියා කල්පනා කළත්, ගැමි ජනතාවගේ පැත්තෙන් බලන විට එයින් අපේ ගැමි ජනතාවට හිරිහැරයක් සිදු වී තිබෙන එක ඇත්තයි. මේ ප්‍රශ්නය තව දුරටත් නිරවුල් කර ගැනීමට අප අත තිබෙන ආයුධ මොනවාද? එයනම් ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතයි. කැලෑ ඉඩම්, මුඩු බිම්, හේන් ගොවිතැනට පාවිච්චි කළ ඉඩම්, යනාදී ඒවා විශේෂයෙන් වෙන් කර රජයට අයිති ඒවා මොනවාද, රටවැසියන්ට අයිති ඒවා මොනවාද, කියා නිරවුල් කිරීමට බාර දී තිබෙන්නේ ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත ක්‍රියාත්මක කිරීමට බාර දී තිබෙන ඒ ආයතනයටයි. මේ ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත නැත් නම් "ලෑන්ඩ් සෙට්ල්මන්ට් ඕඩිනන්ස්" එක අවුරුදු ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක කළ නමුත්, නින්දගම් පිළිබඳ ප්‍රශ්නය ඒ පනත යටතේ විසඳීමකට පත් කරන්නට බැරි වුණා. ඇත්ත එයයි. නින්දගම් කෙළවර වන්නේ කොහෙන්ද, මේ නින්දගම්වල තිබෙන බණ්ඩාර ඉඩම් කොපමණද, මුත්තෙට්ටු ඉඩම් කොපමණද, පංගු ඉඩම් කොපමණද, කියා විස්තර සහිතව වෙන් කර ගැනීමට ඔය ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ තවමත් කාටවත් බැරි වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ තත්ත්වය මෙසේ තිබියදී ඇත්තටම ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතට සංශෝධනයක් වශයෙන් තමයි—එය නොකීවත්—මේ නින්දගම් පනත ඉදිරිපත් කර තිබෙන්නේ. මූලික පනත යටතේ තිබුණු බලතල පාවිච්චි කර මේ ප්‍රශ්නය තරමක්වත් නිර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වුල් කර ගැනීමට බැරි වූ ඇමතිවරයෙක් නින්දගම් පංගුවලට පමණක් සීමා කර අද නින්දගම් පනතක් ඉදිරිපත් කර තිබෙනවා. මාරුවෙන පංගුවටත්, පරවේනි පංගුවටත්, නිලකාරයින් විසින් හිමිකම් කියන ඒ පංගුවලටත් පමණක් සීමා කර නින්දගම් පනතක් මේ ඇමතිතුමා දැන් ගෙනැවිත් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ශත වර්ෂ එක හමාරක් තිස්සේ ඇති වෙච්ච ඉඩම් නීති දෙස බැලුවහොත්, මුඩු බිම් පනතෙන් පටන්ගෙන අපේ වර්තමාන කර්මාන්ත ඇමතිතුමා එදා කෘෂිකර්ම ඇමතිතුමා වශයෙන් සිටියදී ඉතාමත් හොඳ හිතකින් හා පුළුල් අදහසකින් යුක්තව 1957 දී ඉදිරිපත් කළ කුඹුරු පනත දක්වා කාලය දෙස බැලුවහොත්, අපට පෙනී යන්නේ ඇත්තෙන්ම මේ රටේ ගැමි ජනතාවගේ ප්‍රශ්න විසඳෙනවා වෙනුවට ඔවුන් උසාවියට දක්කන පිළිවෙළක් පමණක් සකස් වී තිබෙන බවයි. සෑම පනතක් යටතේම එක්කෝ රජය ගැමියාගේ ඉඩම් පැහැර ගත්තා, හොරකම් කර ගත්තා ; එසේ නැත්නම් ධනපතියන් ඔවුන්ගේ ඉඩම් පැහැර ගත්තා, හොරකම් කර ගත්තා. ලංකාවේ කොයි පළාත්වලත් සාධාරණ ඉඩම් හිමියන් සිටින්නට ඇති. එහෙත් උඩ රටත්, පහත රටත් යන හැම ප්‍රදේශයකම මේ 20 වන ශත වර්ෂයේ අලුතෙන් රදළ තත්ත්වයට හිමිකම් කියන්නට ඉදිරිපත් වූ සමහරුන් සිටිනවා. ඉඩම් බෙදීමේ අණපනත් පාවිච්චි කරමින්, අනුන්ගේ ඉඩම් කොල්ලකාගෙන, ගැමියන්ගේ ඉඩම් කොල්ලකාගෙන තමන් තර වන්නට බැලූ ඉඩම් හිමියන් රාශියක් අද සිටිනවා. මේ විධියේ වැඩ කටයුතු නිසා අපේ ගැමි ජනතාවට මොකක්ද සිදු වී තිබෙන්නේ ? මොකක්ද සිදු වන්නේ ? මාක්ස්වාදීන් හැටියට, සමසමාජවාදීන් හැටියට අප කවදත් ධනේස්වර පිළ යටතේ සූරාකෑමට ගොදුරු වූ අයගේ දුක ගැන කියනවා. තමන්ගේ ශ්‍රමය විකුණාගෙන ජීවත් වන්නට සිදුව ඇති කම්කරුවන්ගේ දුක ගැන කියනවා. එහෙත් ඊට වඩා දුකක් විඳින, ඊට වඩා අමාරුකම් ඇති කොටසක් රටක සිටින්නට පුළුවනි. විශේෂයෙන්ම යටත් විජිතයක් වශයෙන් පැවතුණු රටක ධනේශ්වර ක්‍රමයට එපා වුණු උදවියට. ධනේශ්වර ක්‍රමය විසින් "අපට තමුසෙලා වුවමනා නැහැ" යි පසෙක තබනු ලැබූ උදවියට තිබෙන දුක් විශාලයි. ඔවුන් හිඟන තත්ත්වයකටයි, වැටී සිටින්නේ. අධිරාජ්‍යවාදීන් මුලින්ම මේ රටේ කෝපි වගාව පටන් ගත්තා. ඊට පසුව තේ වගාව පටන් ගත්තා. මේ රට කෝපි වගාවට, තේ වගාවට සහ ඒවාට වුවමනා කරන වෙළෙඳ ව්‍යාපාරවලට පමණක් සීමා කර, ඊට පසුව මිලිටරි වුවමනාවන් සඳහා මේ රට සකස් කරන්නට බ්‍රිතාන්‍යයන් පටන් ගත්තාට පසුව ඒ කටයුතුවලට අවශ්‍ය නොවූ ගැමියන් පිළිබඳ තත්ත්වය නම් ඉතාමත්ම දුක්ඛිතයි. වතුකරයේ සිටි කම්කරුවන් පිළිබඳව කම්කරු නීතියක් පැනෙව්වා. මෙම නීතිය පෙන්වමින් කම්කරුවන්ට විශේෂයක් කළා යයි පෙන්නුම් කරන්නට මා අදහස් කරන්නේ නැහැ. ඒ නීති යටතේ වුණත් ඒ වතුකරයේ සිටි කම්කරුවන් විශාල දුකක් වින්ද බව මා පිළිගන්නවා. ඔවුන් විශාල දුකක් වින්ද නමුත් සමහරුන් ඔවුන් පිළිබඳව ඉදිරිපත් වන්නට බැලුවා. ඊට හේතුව ඒ ධනපතියන්ට ඔවුන්ගේ ශ්‍රමය වුවමනා වීමයි. ඔවුන්ගේ ශ්‍රමය නිසා ඔවුන්ට තරමක්වත් සැලකීමට බැලුවා. එහෙත් කිසිම කෙනකුට වුවමනා නොවූ ගැමියන් පසෙකට තල්ලු වුණා. ඔවුන්ට කුමක් සිදු වුණාදැයි කවුරුන්වත් කල්පනා කෙළේ නැහැ. අධිරාජ්‍ය ක්‍රමයට විරුද්ධව අදහස් පෙරළිගෙන ගිය මේ රටේ බ්‍රිතාන්‍ය සිවිල් නිලධාරියකු වූ ලෙනාඩ් වුල්ෆ් මහතා බැද්දේගම—Village in the Jungle—නමින් ඉදිරිපත් කළ නවකථාවේ මාර්ගයෙන් දකුණු පළාතේ ගිරුවා පත්තුවේ කැළෑ හේන් ගොවිතැන් කරමින් සිටි ගැමි ජනතාවට විඳින්නට සිදු වූ දුක පිළිබිඹු කර තිබෙනවා.

ආණ්ඩු වෙනස් වෙනවා. ඒ වෙනස් වන ආණ්ඩු යටතේ, 1925, 1926 යන අවුරුදු වලින් පසුව, විශේෂයෙන්ම මැනිං ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ කාලයෙන් පසුව ලංකා ජාතික සංගමය නමින් දේශපාලන පක්ෂයක් මේ රටේ ඇති වී, එය මේ රටේ ගැමි ජනතාව ගැන කථා කරන්නට ඉදිරිපත් වීම නිසා සුළු වෙනසක් පටන් ගත් බව කියන්නට ඕනෑ. එහෙත් ඒ වෙනසෙන් ගැමි ජනතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

වගේ දුක ඇත්ත වශයෙන්ම නැති වුණාද යන්න පළමුවෙන් කල්පනා කර බැලිය යුතුයි. මේ රටේ බහු ජනතාව වන ගැමි ජනතාවගේ ආර්ථික තත්ත්වය සම්බන්ධයෙන් යම් කිසි පියවරක් ගත්තේ නැත්නම් ඔවුන් තව තවත් පිරිහීමට පත් වෙනවාය යන අදහස ඉදිරිපත් කරමින්, මේ රටේ තිබෙන කැලෑ ඉඩම් රජයට ගෙන සුද්ධ කොට කැබැලි කඩා ඉඩම් නිරවුල් කිරීමේ පණත පාවිච්චි කොට ඒවායේ අයිතිය ගැමි ජනතාව වෙත පවරා ඔවුන්ගේ ආර්ථික සංවර්ධනය සඳහා නිසි පියවර ගත යුතු බව යෝජනා කරමින්, 1927 අවුරුද්දේදී හියු ක්ලිපර්ඩ් ආණ්ඩුකාරතුමා ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාව වෙත යැවූ පණිවුඩය මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනවා. අධිරාජ්‍යවාදී ආණ්ඩුකාරයින්ගේ යෝජනා සම්පූර්ණයෙන්ම අප අනුමත කරන්නට වුවමනාවක් නැහැ. එහෙත්, අපේ වර්තමාන ගරු ඉඩම් ඇමතිතුමා මේ රටේ මඩ ඉඩම් මෙපමණයි ගොඩ ඉඩම් මෙපමණයි යන විස්තර කීවා. ඉඩම් කච්චේරි මාර්ගයෙන් හෝ වෙනත් මාර්ගයෙකින් හෝ ඉඩම් සංවර්ධන පණත යටතේ ගැමියන්ට බෙදා දෙන්නට උත්සාහ දරන මේ ප්‍රතිපත්තියේ මුල කොතැනදැයි සොයාගෙන ගියහොත් අපට අතිගරු ඩී. එස්. සේනානායක අගමැතිතුමා මාර්ගයෙන් ආපසු හියු ක්ලිපර්ඩ් ආණ්ඩුකාරතුමා වෙතට යන්නට සිදු වෙනවා. මේ ප්‍රතිපත්තියේ උපත සිදු වුණේ එතැනයි. කිසිවකු මේ පිළිබඳව විවාදයකට බහිනවා නම් හෝ සැකයක් ඇති කර ගන්නවා නම් හෝ ඔහුට මා කියන්නේ, මේ රටේ ඉඩම් පිළිබඳවත් සිතියම් පිළිබඳවත් බ්‍රෝහියර් මහතා විසින් පළ කර තිබෙන අගනා පොතට ඇතුළත්, "හියු ක්ලිපර්ඩ් ආණ්ඩුකාරතුමාගේ 1927 මැයි මාසයේ පණිවුඩය" කියවන ලෙසයි.

1927 න් පසුව මේ ඉඩම් බෙදීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නට බැලුවේ අතිගරු ඩී. එස්. සේනානායක අග්‍රාමාත්‍යතුමායි. කුඩා ඉඩම් කැබැල්ලක් බැගින් දී ගැමි ජනතාව සතුටු කිරීමේ බලාපොරොත්තුවක් එතුමා තුළ තිබුණා. "ඉඩම් අක්කර දෙකකුත් එළ හරකකුත් ඇත්නම් කෙනකුට ජීවත් වන්නට පුළුවන" යන කියමනක්, ඩී. එස්. සේනානායක අග්‍රාමාත්‍යතුමාගේ එකී ප්‍රතිපත්තිය යටතේ ඒ කාලයේදී ඇති වුණු එකක් හැටියටයි අපට පෙනී යන්නේ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**

(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன—சமூக சேவை அமைச்சர்)

(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

ඒ කාලයේදී පුළුවන්. දැන් බෑ.

**බර්නාඩ් සොයිසා මයා..**

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

ඉඩම් සම්බන්ධයෙන් හෝ වෙනත් කිසිවක් සම්බන්ධයෙන් හෝ ආණ්ඩුවල පවතින සිරිතක් මේ අවස්ථාවේදී ගරු සමාජසේවා ඇමතිතුමාට මතක් කර දෙන්නට මා කැමැතියි. ඒ සිරිත යම්, යම් රෝගයක් සුළු පිළියමකින් සුව කරන්නට පුළුවන් තත්ත්වය ඉක්ම ගියායින් පසු ඊට ප්‍රතිකාර කරන්නට ඉදිරිපත් වීමයි. මේ ආණ්ඩුවේ සිරිතත් ඒකයි. ඇස්ප්‍රෝ පෙත්තකින් සුව කරන්නට පුළුවන් තත්ත්වයේ තිබෙන රෝගයක් ඒ තත්ත්වය ඉක්මවූවායින් පසු ඊට ඇස්ප්‍රෝ පෙත්තක් දීමෙන් ප්‍රයෝජනයක් නෑ. නියුමෝනියාවට හැරුණායින් පසු එය ඇස්ප්‍රෝ පෙත්තකින් සුව කරන්නට බැහැ. මේ ආණ්ඩුව දැන් කටයුතු කර ගෙන යන්නේත් එවැනි තත්ත්වය තිනුයි.

ගැමි ජනතාව සම්බන්ධයෙන් ඊයේ අපට මෙහිදී විශේෂ කථාවක් අසන්නට ලැබුණා. "ගැමි ජනතාවට අප මේ මේ විධියේ සහනයන් දුන්නායයි සෑම ආණ්ඩුවක්ම අපට පෙන්නුම් කරනවා. රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේදී විශේෂයෙන්ම වමෙන් ඇති වුණු බලපෑම නිසා, ගරු කර්මාන්ත ඇමතිතුමාත් යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඒ සභාව තුළ නැගූ හඬ නිසා, පාසල් සිසුන්ට නොමිළයේ ආහාර වේලක් ලැබුණා. දුප්පත් ගැමියන් ඒ ගම් මුලාදෑනින්ගේ ගසාකෑමෙන් බේරා ගන්නට ඉදිරිපත් වුණා. ඒ විධියේ කටයුතු රාශියක් සිදු වූ බව ඇත්ත තමයි. නමුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ එකකින්වත් ගැමියාගේ මූලික දුප්පත්කම නැති වුණේ නැහැ. රාජ්‍ය මන්ත්‍රණ සභා කාලය ඉකුත් වුණා. දෙවන ලෝක මහා සංග්‍රාමය ආවා. ඒ දෙවන ලෝක මහා සංග්‍රාම කාලයේදී ගැමියන් ගැන නම් කථා කරන්නටවත් කවුරුවත් ඉදිරිපත් වුණේ නැහැ. ඒ කාලයේදී ගැමියන් ගැන කථා කරන්නට යමෙකු ඉදිරිපත් වුණා නම් එක පැත්තකින් වතුකරයේ සිටි සුද්දන්ගෙන්, කොම්පැනි කාරයින්ගෙන්, හිරිහැර ඇති වුණා. වතුකරයේ සුපිරින්ටෙන්ඩන්ට් මහත්වරුන්ගෙන්, පෙරිය කංකානම් මහත්වරුන්ගත් පමණක් නොවෙයි, අනික් පැත්තෙන් රදළ ඉඩම් හිමියන්ගෙනුත්, පහත රටින් ගොස් ඉඩම් කැබලි අරගෙන ධනවතුන් වෙන්නට බැලු ගසා කන්නන්ගෙනුත්, හිරිහැර ඇති වුණා. මේ සියලු දෙනාටම ගොදුරු වූයේ ගැමියායි.

ඉන් පසු සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ඇති කළ පළමුවන පාර්ලිමේන්තුවේ, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව මොනවාද කියන්නෙ? ඔව්, අපි මධ්‍යම මහා විද්‍යාල ඇති කළා; ගැමියන්ට කලින් නොතිබුණු අධ්‍යාපනයක් ලබා දෙන්නට කටයුතු කළා; අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් ගැමියන්ගේ අස්වැන්න අරගෙන සාධාරණ මිළක් ගෙවන්නට කටයුතු කළා; නොමිළේ සෞඛ්‍ය සේවාවක් ඇති කළා; හාල් සලාකය දුන්නා; ආදී වශයෙන් තමයි ඒ පළමුවන එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පුරසාරම් දොඩවන්නෙ. මේවා ඇති කළේ නැත කියා මා කියන්නේ නැහැ. මේවා ඇති කළ බව සත්‍යයක්, නමුත් මේ එක් කටයුත්තකින්වත් ඒ ගැමියාගේ මූලික දුප්පත්කම නැති වුණාද යන ප්‍රශ්නයයි මා අසන්නෙ. ඒ ප්‍රශ්නයට පිළිතුරක් නැති බවයි අපට පෙනෙන්නෙ. සමාජ සේවා ඇමතිතුමා මතක් කළ දෙය නම් ඇත්ත තමයි. එදා තිබුණු තත්ත්වයේ හැටියට යම් පිළියමක් යොදා එයින් සහනයක් දෙන්නට ඉඩක් තිබුණාය කියමු. නමුත් කල් යත් යත්ම තත්ත්වය වෙනස් වන වාත් සමගම ඒ පිළියමම යොදා සහනයක් දෙන්නට බැරි බව සමාජ සේවා ඇමතිතුමා පිළිගන්නවා ඇති.

සෑම ආණ්ඩුවක්ම ගැමියාට සහනයක් දෙන්නට උත්සාහ කරන බව නම් ඇත්ත තමයි. යම් යම් බලවේගයන් ඇති වී තිබෙන නිසා, වමේ බල වේගයන් ඇති වී තිබෙන නිසා, ඒ බල වේගයන් මාර්ගයෙන් දුප්පතාගේ හඬ නංවන්නට ඉඩ ලැබී තිබෙන නිසා, විශේෂයෙන්ම සර්වජන ඡන්දය තිබෙන නිසා යටත් පිරිසෙයින් ඡන්දයක්වත් බලාගෙන ගැමියා වෙනුවෙන් සැලකිල්ලක් කරන්නට ඉදිරිපත් වන බව නම් ඇත්ත තමයි. නමුත් මූලික වශයෙන් මේ ප්‍රශ්නය විසඳී තිබෙනවාද? ඔව්, අපි මධ්‍යම මහා විද්‍යාල ඇති කළා; ඩී. ඩී. ටී. පාවිච්චි කර මැලේරියාව තාවකාලිකව තුරන් කළා; ආදී වශයෙන් ඒ පළමුවන එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවට පුරසාරම් දොඩන්නට පුළුවනි. බ්‍රිතාන්‍ය සමයේ බ්‍රිතාන්‍යයින් පවා මේ ආකාරයට පුරසාරම් දෙඩුවා. අප මැලේරියා රෝගය මර්දනය කරන්නට ව්‍යාපාරයක් ගෙන ගියා; අප පරංගි රෝගය නැති කළා; මේ රටට ඉන්දියාවෙන් ගෙනා වසංගත රෝග අප නැති කළා; අප ඒ ආකාරයෙන් ගැමි ජනතාව ආරක්ෂා කළාය කියා ඔවුනුත් පුරසාරම් දෙඩුවා. මැලේරියා රෝගය තුරන් කරන්නට බැරි වුණාට අපි ප්‍රතිකාර කරනවාය; උණ රෝගයෙන් පෙළෙන දුප්පත් ගැමියාට අපි සහනයක් දෙනවාය; ජල ගැල්මෙන් ගොවිතැන් විනාශ වුණාම අපි සහනයක් දෙනවාය; ආදී වශයෙන් බ්‍රිතාන්‍යයින් පවා පුරසාරම් දෙඩුවා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයටත්, අපි මධ්‍යම මහා විද්‍යාල ඇති කළාය; හාල් සලාකය දුන්නාය; සහතික මිළක් දුන්නාය; සෞඛ්‍ය සේවාවක් ඇති කළාය; ආදී වශයෙන් පුරසාරම් දොඩවන්නට පුළුවනි. නමුත් දුප්පත් ගැමියා එදා මෙන්ම අදත් දුප්පත්කමින් පෙළෙනවා.

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)

ඊට පසුව තිබුණු ආණ්ඩුව?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මා කියන්නේ නැහැ, අපි ප්‍රශ්නය විසඳුවාය කියා. තමුන්නාන්සේත් ඒ ආණ්ඩුවේ සිටියා. තමුන්නාන්සේ මේ ආණ්ඩුවේත් ඉන්නවා. තමුන්නාන්සේත් අර දුප්පතාගේ දුක වගේම තමයි. ආණ්ඩු එනවා, ආණ්ඩු යනවා; තමුන්නාන්සේ ඒ ආණ්ඩුවල ඉන්නවා. ගැමියාගේ දුප්පත්කමත් කිසිම වෙනසක් නැතිව ඒ ආකාරයටම තිබෙනවා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මම වාසි පැත්ත බලාගෙන පැන්නෙ නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

සමාජ සේවා ඇමතිතුමාට යම් අවාසියක් සිදු වුණා නම් මගේ කණගාටුව ප්‍රකාශ කරන්නට මා ලෑස්තියි. පැන්න පැත්තෙන් එතුමාට අවාසියක් සිදු වුණා නම් ඒ ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරන්ට කැමතියි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ඒ අය මාව පැන්නුව.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

පණිත රිලව් ගැන කථා කිරීමෙන් වැඩක් නැහැ, ගරු කථානායකතුමනි. ගරු සමාජ සේවා ඇමතිතුමා අප සමඟත් සිටි කාලයක් තිබුණා. මා සිටින පක්ෂයේත් සිටි කාලයක් තිබුණා. ඒ කෙසේ වෙතත් ඇත්ත තමයි, ඊට පසුව ආණ්ඩු ඇති වුණා. ඒ ආණ්ඩු යටතේ ඉඩම් ඇමති ධුරය දැරුවෙ මේ ඇමතිතුමාමයි. එතුමා කළේ මොනවද ? ඩී. එස්. සේනානායක මහත්මයාගෙ ප්‍රතිපත්තිය අනුව "මෙන්න ගොඩ බිම් කැබැල්ලක්. මෙන්න මඩ බිම් කැබැල්ලක්" කියා ගැමියන්ට ඉඩම් සුළු ප්‍රමාණයක් බෙදා දුන්න. සමහර ස්ථානවල කොලනි ඇති කළා.

1956 දී කෘෂිකර්ම ඇමති ධුරය දැරූ අද කර්මාන්ත ඇමති ධුරය දරන පිලිප් ගුණවර්ධන මහත්මයා ඒ ගැමියන් කෙරෙහි විශාල අනුකම්පාවකින් කුඹුරු පනතක් ගෙනාව. ඒ කුඹුරු පනත සම්මත කර ගැනීමට, විරුද්ධ පාර්ශ්වයේ සිටින අපි ඒ ඒ පෙදෙස්වලට ගොස් විශේෂයෙන් කටයුතු කළ බව මේ අවස්ථාවේදී ආඩම්බරයෙන් මතක් කරන්ට පුළුවනි. ඒ වගේම ඒ පනත මෙහි සාකච්ඡා කළ අවස්ථාවලදී එහි තිබුණු පළුදු අස් කිරීමට සෑම සහායක්ම අපි දුන්න බවත් ඇත්තයි. එහෙත් ඒ පනතෙන්වත් මේ ප්‍රශ්නය විසඳුනේ නැහැ කියා මම කියන්නෙ ඒ පනතට ගැරහීමක් වශයෙන් නොවෙයි. අද පවතින තත්ත්වය ඇමතිවරයකුගේ ආඥාවකින් හෝ නියමයකින් විසඳන්ට පුළුවන් තත්ත්වයක් නොවෙයි. මුල සිටම ගම්වලට ගිහින් ගැමියන්ගෙන් පටන් ගෙන මේ ප්‍රශ්නය විසඳිය යුතුව තිබෙනව. පහළින් පටන් අරගෙන උඩට එනවා මිස මෙතැන ඇමති පුටුවක සිට මේ ප්‍රශ්නය විසඳන්ට පුළුවන් කාලය දැන් ගත වී අවසානයි. අපේ ගරු මන්ත්‍රීවරුන්ට මතක දැයි මා දන්නෙ නැහැ, මේ ශත වර්ෂයේ මුල් කාලයේදී අපේ රටේ වාසය කළ උදවියගේ සංඛ්‍යාව කොපමණද කියා. එදා හිටියේ ලක්ෂ 40 ක් පමණයි. අද ඒ සංඛ්‍යාව එක් කෝටි දශ ලක්ෂයකටත් වඩා ඉහළ නැඟ තිබෙනව. එතරම් ශීඝ්‍රයෙන් අපේ රටේ ජනගහනය වැඩි වී තිබෙනව. මේ කාරණය නිසා තමයි, මේ ප්‍රශ්නය මේ තත්ත්වයට පත් වී තිබෙන්නෙ. ලෙඩාට සෙම්ප්‍රතිශ්‍යාවක් ඇති වී තිබෙනවා යයි සිතා කොත්තමල්ලි කෝප්පයක් ප්‍රමාද වී දෙන්ට යන අවස්ථාවේදී ලෙඩාට තිබෙන්නෙ සෙම්ප්‍රතිශ්‍යාව නොවෙයි, නිව්මෝනියා රෝගයයි. අද සිදු වී තිබෙන්නෙ ඒකයි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ඒකට පිළියමකුත් කියන්න. විවේචනය කරල විතරක් බැහැ.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பேர்னட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

මම කියන්නම්. තමුන්නාන්සෙ අපිත් එක්ක එන්ට ලැහැස්ති නම් මමයි සමාජ සේවා ඇමතිතුමායි එකතු වෙලා මේ ප්‍රශ්නය විසඳන්ට යෝජනාවක් ඉදිරිපත් කරන්ට මම ලැහැස්තියි. එහෙත් මගේ කල්පනාවේත් අත්දැකීමෙත් හැටියට ඇමති පුටුවල කලක් සිටීමෙන් පසුව කෙනෙකුට බොහොම අමාරුයි ඒකෙන් නැගිටල යන්න. [බාධා කිරීමක්] සිය කැමැත්තෙන් යන්ට ලැහැස්ති නැහැ. අර සක්‍ර දේවේන්ද්‍රයට පණ්ඩුකම්බල ශෛලාසනය රත්වී එයින් නැඟිට යන්ට සිදුවන ආකාරයට අපේ සමහර ඇමති වරුන්ට ජනතාවගේ දුක දකින විට තමන් ගේ ආසනවලින් ඉවත් වී දුප්පතාගේ පැත්තට එන්නට තරම් ශක්තියක් තිබෙනවා කියන විශ්වාසයක් හෝ බලා පොරොත්තුවක් මගේ නම් නැහැ.

ගරු රාජ්‍ය ඇමතිතුමා මුදල් ඇමති නිලය දරූ කාලයේ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් එක්තරා පරීක් ෂණයක් පැවැත්තුව. එහි ප්‍රතිඵල වශ යෙන් සොයා ගන්නා ලද කරුණුවලින් ස්වල්පයක් මා පෙන්වා දෙන්නට කැම තියි. අපේ ගැමි ජනතාව ජීවත්වන ගම් 108 ක පවුල් 22,000 ක් පිළිබඳව පරීක් ෂණයක් පවත්වන්නට යෙදුණා. එහි ප්‍රතිඵල මෙසේයි: ඒ ගම්වල ජීවත් වුණු ඉඩම් පිළිබඳ කිසිම අයිතියක් නැතියවුන් ගේ සංඛ්‍යාව සියයට 37.7 යි. අක්කර බාගයකට අඩු ඉඩම් කැබෙලි අයිති අයගේ සංඛ්‍යාව සියයට 21.6 යි. අක්කරය සහ අක්කර බාගය අතර ප්‍රමාණයේ ඉඩම් කොටස් අයිති උදවියගේ ප්‍රමාණය සියයට 11.3 යි. මා මේ කියවන්නේ 1952 වර්ෂයේ 13 වන සැසි වාර්තාවෙහි අඩංගු කරුණුවලි නුයි. එදා පැවති තත්ත්වයට අනුව අපේ ගැමි ජනතාවගෙන් සියයට 60 කටත් වඩා ප්‍රමාණයකට අයිතිව තිබුණේ ඉඩම් අක්ක රයකටත් අඩු ප්‍රමාණයක් බව ඒ කරුණු වලට අනුව පෙනී යනවා. ඉන් පසුව ඉඩම් කච්චේරි යනාදිය මගින් ඉඩම් බෙදා දෙනු ලැබූ බව අප දන්නවා. මේ සිටින ඉඩම් ඇමතිතුමාම ඊට පසුව ඉඩම් දී තිබෙනවා. කැලෑ විනාශ කරලත් ඉඩම් දී තිබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சரும் சபை முதல் வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

කැලෑ ඉඩම් දුන්නාම ගස් කපනවා.

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பேர்னட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

කැලෑ සංවර්ධනයෙහි අවශ්‍යතාවය පිළි බඳවත් මතක් කර දෙන්නට කැමතියි. එහෙත් මේ වේලාවේදී ඒ ගැන කතා කරන්නට මා සූදානම් නැහැ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**

*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*

(The H. N. H. A. M. Karunaratne)

කැලෑ කපන්නේ නැතුව ගොවිතැන් කරන්නේ කෙසේද?

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பேர்னட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

සමාජසේවා ඇමතිතුමා කියන වනගත ප්‍රතිපත්තීන් පිළිබඳව දේශනයක් කරන් නට මා මෙම අවස්ථාවේදී සූදානම් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

ලෙඩේට බෙහෙත දෙන්නට ඕනෑ. කතා කරන්නට වේලාවක් නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பேர்னட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

ඒ ආසාව සම්පූර්ණයෙන් සපුරාලීමට මා උත්සාහ කරන්නම්.

අද පවතින තත්ත්වයට අනුව කියන් නට තිබෙන්නේ එදාට වඩා අද කොතෙක් ඉඩම් බෙදා දුන්නත් මෙම ප්‍රශ්නය විස ඳෙන්නේ නැති බවයි. එම නිසා තමයි, පනාමුරේ වැනි කැලෑවලට වැදී රජයේ අව සරයක්ද නැතුව එම කැලෑ ශුද්ධ කර ගෙන නීති විරෝධී ලෙස පදිංචිව සිටින් නන්ගේ ඒවාගේම ලග්ගල වැනි පළාත්වල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

පිහිටි කුඹුරුවල ගල් ගැරීමට උත්සාහ දරන්නෙත් එම නිසයි. ඉඩම් රහිත භාවය උඩුලන්නට බැරුව පොළොන්නරුව වැනි පළාත්වල රජයේ ඉඩම්වලට ගොස් ඒවායේ වාසය කරන අයට එම ඉඩම් පිළිබඳ අයිතිවාසිකම් පවරා දෙන්නට අපේ ඉඩම් ඇමතිතුමාට සිදු වී තිබෙන්නේ එම නිසායි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

අක්කර ලක්ෂ දෙක හමාරක් දුන්නා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்஁ஸா)*
(Mr. Bernard Soysa)

ලක්ෂ දෙකහමාරක් දීලා මෙම ප්‍රශ්න විසඳන්නට බැහැ. කොච්චර දීගෙන ගියත් තමුන්නාන්සේලා බලාපොරොත්තු වන කාලසීමාව තුළ මෙම ප්‍රශ්නය විසඳෙන ආකාරයට කටයුතු කෙරෙනවා යැයි කාටවත් කියන්නට බැහැ. ඇත්ත ඒකයි. වර්තමාන කෘෂිකර්ම ඇමතිතුමා 1966 සිට 1970 දක්වා ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වන කෘෂිකර්ම සංවර්ධන යෝජනා ඇතුළත් කෙටුම්පතෙහි සඳහන් වී තිබෙන සංඛ්‍යා ලේඛනවලින් මං කියවන්නම්. විශාල වාරිමාර්ග ක්‍රම නැති පළාත්වල කුඹුරු අයිතිය පිළිබඳ සංඛ්‍යා ලේඛන මා ඉදිරිපත් කරන්නම්. අක්කර බාගෙට අඩු: සියයට 6.4 යි. අක්කර බාගයේ සිට අක්කරය දක්වා: සියයට 16.4 යි. අක්කරයේ සිට අක්කර දෙක දක්වා: සියයට 21.5 යි. අක්කර 2 සිට අක්කර 5 දක්වා: සියයට 25.7 යි. අක්කර 5 සිට අක්කර 10 දක්වා: සියයට 13.6 යි. අක්කර 10 ට වැඩි පවුල්: සියයට 16.3 යි.

ගරු කථානායකතුමනි, මේ ඉඩම් ප්‍රශ්නය මේ විධියට පවතිනවා දැක දැක මේ නින්දගම් පනතින් කුමක් කරනවාද කියන ප්‍රශ්නය මා අසන්න සතුටුයි. අද තිබෙන මූලික ප්‍රශ්නය පරවේණි පංගුවල, මාරු වන පංගුවල සේවය කරන නිලධාරීන් වෙනුවෙන් යම් සේවයක් කරන්නට සිදු වී තිබෙන කාරණය නොවෙයි. ඒ පළාත්වල ජීවත් වන අයට පවා අද ජීවත් වන්නට බැරි බඹ තත්ත්වයකට ඒ ඉඩම් පංගු කැබලි වී තිබීමයි අද ප්‍රශ්නය වී තිබෙන්නෙ. අද තිබෙන තත්ත්වය ඒකයි. ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට කොහොමද ඉදිරිපත් වෙන්නෙ? ගරු කථානායකතුමනි, මේ පරවේණි පංගු, මාරු වෙන පංගු පිළිබඳව අයිතියක් පැවරීමට ගරු ඉඩම් ඇමතිතුමා මගේ සංශෝධනයක් පිළිගත්ත බව ඇත්ත. නමුත් මා කියන්නට කැමතියි, ඒ සංශෝධනය මගින්වත් ඒ ප්‍රශ්නය නිරවුල් කරන්නට බැරි බව. එයට හේතුව නම් ඒ මුලින් සිටින නිලකාරයින් අද සොයා ගන්නට බැරි වීමයි. ඒ නිලකාරයින්ගෙන් උරුමක්කාරයින් හැටියට පැවත එන උදවිය කවුද කියා නියම කර ගන්නට ඕනෑ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

පුළුවනි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்஁ஸா)*
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, දැනට තිබෙන ලේඛන අනුව සමහර උදවිය තමන්ට හිමිව තිබුණ පංගු කැබලි විකුණාගෙන වෙනත් අයගේ වෙනත් තැන්වලට ගොස් සිටිනවා. ඒ නිසා එම ඉඩමේ පංගුවල සිටින්නේ වෙනත් අයයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දැන් ඒ අය මැරිල දරුවන් ඉන්නවා. පරම්පරා ගණනක් ගත වෙලා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்஁ஸா)*
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, මේ පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳව මූලික අමාරුකම් කිහිපයක් තිබෙනවා. එකක් නම්—

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

තමුන්නාන්සේට කොහොමද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்஦ா)*
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයත්, විරුද්ධ පක්ෂයත් අතරේ මත භේද රාශියක් තිබෙනවා. නමුත් ඒ මත භේද වලට වැඩිපුර දරුවන් බෝ කිරීමේ ප්‍රශ්නය එකතු කරන්න එපාය කියා මා පක්ෂ දෙකෙන්ම ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, මෙතන තිබෙන මූලික ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාගේ අනුකම්පාව යොමු විය යුත්තේ පැරණි නිලකාරයින් හෝ නිලකාරයින්ගෙන් පැවත එන උදවිය කෙරෙහි නොවෙයි. ඒ ඉන්න නිලකාරයින් යටතේ අඳේට කුඹුරු කොටන ගැමියන් සිටිනවා. ඔවුන් පිළිබඳව කිසිම අනුකම්පාවක් දක්වන්නේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඇයි, කුඹුරු පනත?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்஦ா)*
(Mr. Bernard Soysa)

මා අහනවා තමුන්නාන්සේගෙන්, මේ නින්දගම් ඉඩම් තිබෙන කොටස්වල කොයි තරම් දුරට කුඹුරු පනත ක්‍රියාත්මක වී තිබෙනවාද කියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்஦ா)*
(Mr. Bernard Soysa)

ක්‍රියාත්මක වෙන්න ඕනෑ ; එක ඇත්ත. 1957 සිට ඒ විධියට කියනවා. නමුත් තවමත් ක්‍රියාත්මක වුණේ නැහැ. ක්‍රියාත්මක වුණ තැන්වල තවමත් ඒ ප්‍රශ්නය නිරවුල් වී නැහැ. තවමත් ඒ ආරවුල් උසාවිවල.

ගරු ඉඩම් ඇමතිතුමා මේ ප්‍රශ්නය ගැන නීසි විධියට කල්පනා කළා නම් මෙහි තිබෙන අමාරුකම් දෙවිධියට පෙනේවි. එක් පැත්තකින් නිලකායින් හෝ නිලකාරයින්ගෙන් පැවත එන අයට මේ අයිතිය පවරනවාය කියන අදහස අනුව ඒ අය යටතේ සිටින අඳ ගොවියන්ට කිසිම සහනයක් නැහැ.

ඊළඟට අපි අනෙක් පැත්තෙන් බලමු. දැන් ඉඩම් පංගු කැබලි වෙලා. ඒ වගේම පවුල් බෝ වෙලා. පවුල් බෝ වීම නිසා ඒ පංගුව දැන් කැබලි වී තිබෙන ආකාරයේ හැටියට අයිතිය පැවරෙන්නේ කාටද? කෑලි කෑලි වශයෙන් බෙදා දුන්නොත් කොතෙක් දුරට කැබලි වී තිබෙනවාද කිව්වොත් තට්ටුමාරු ක්‍රමය යටතේ ගොවිතැන් කරන ගැමියන්ට අයිති වන්නේ සමහර තැන්වල කොටස් 252 කින් එක කොටසයි ; සමහර විට කොටස් 125න් එක කොටසයි ; සමහර විට සියයට 325න් එක කොටසයි. ඔය විධියේ අයිතියක් තිබෙන ගැමියාට ශත වර්ෂ ගණනාවක් ඉන්න සිදු වෙනවා තට්ටු මාරු පිළිවෙළට තමන්ගේ වාරය එන තෙක් මේ ප්‍රශ්නය විසඳන්නට ගරු ඇමතිතුමා එක වචනයක්වත් මේ පනතට එකතු කර නැහැ. ඔය ප්‍රශ්නය නිරවුල් කිරීමට කොයි විධියේ පියවරක් ගන්නට බලාපොරොත්තු වෙනවාද කියා මා ගරු ඇමතිතුමාගෙන් අහනවා.

තට්ටු මාරු ක්‍රමය යටතේ තමන්ගේ වාරය එන තුරු ශත වර්ෂ තුනක් බලා සිටින්නට සමහරුන්ට සිද්ධ වෙනවා. එසේ නැතහොත්, මේ ක්‍රමයට දැන් දෙන්න ගියහොත්, හතරැස් අඟල් කීපයක් පමණක් කෙනෙකුට හම්බ වේවි. තමන්ගේ මිනිය වළලා ගන්නටවත් ප්‍රමාණවත් නැති ප්‍රමාණයක් ලැබේවි. ඒ විධියටයි කැබලි වී යන්නේ. ඒ පිළිබඳව වචනයක්වත් නැතුව නිකම්ම, පංගුවල සිටින නිලකාරයන්ට හෝ ඒ අයගෙන් පැවතෙන අයට මේවායේ සම්පූර්ණ භුක්තිය දෙනවාය කියන වචනයෙන් මුළාවක් පමණයි කරන්නේ.

මේ හැර, කථානායකතුමනි, පංගු ඉඩම් කොහෙන් නවතිනවාද නින්ද ඉඩම් කොහෙන් පටන්ගෙන කොහෙන් නිවතිනවාද කියා නිරවුල් කිරීමට ගිය විට මේ ප්‍රශ්නය විසඳීමට බැරි වෙන බව මා මුලිනුත් කිව්වා. මේ කාරණය ගැන ගරු ඇමතිතුමා මොකද කියන්නේ? මෙය විසඳීමට නිරවුල් කිරීමේ නිලධාරිතැනට බලය දෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

අතර ඒ පිළිබඳව මතභේදයක් ඇති වුණොත් එය විසඳාගැනීම පිණිස මණ්ඩලයට යන්න පුළුවන්. මණ්ඩලයේ තීරණය ගැන දුක්ගැනවිල්ලක් තිබෙනවා නම් එතැනින් දිස්ත්‍රික් උසාවියට යන්න පුළුවන්. මෙම පනතින් කියනවා දිස්ත්‍රික් උසාවියේ තීරණය අවසාන තීරණයයි කියා. එහෙත් තමුන්නාන්සේ ම දන්නවා, දිස්ත්‍රික් උසාවියේ තීරණය අවසාන තීරණයයි, සුප්‍රිම් උසාවියේ තීරණය අවසාන තීරණයයි කියා ඔය විධියේ නොයෙක් අනපනත් අපේ රටේ තිබෙන බව. සුප්‍රිම් උසාවියේ තීරණය අවසාන තීරණයයි කිව්වට නව නින්නේ රාජාධිකරණයට ගිහිනුයි. ඒ නිසා දිස්ත්‍රික් උසාවියේ තීරණය අවසාන තීරණයයි කිව්වට රාජාධිකරණය දක්වා යන්නට ඉඩ දෙනවා. නවත්වන්න බැහැ; නවත්වන්න පිළිවෙළක් නැහැ. එම නිසා මෙම නීතියේ ඇතුළත් කර තිබෙන වගන්තියට විරුද්ධව දිස්ත්‍රික් උසාවියෙන් ඉහළට, එනම් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්නට පුළුවන්. ගරු ඇමතිතුමා ද්වේෂ සහගත දෙයක් කරනවාය කියා කීප දෙනකු විසින් ගරු ඇමතිතුමන් චෝදනාවට ලක් කෙළේ ඒ නිසයි. එසේ නැතුව මෙය හොඳ හිතින්, පිරිසිදු චේතනාවෙන්——

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

පිරිසිදු චේතනාවෙන් තමයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

හොඳයි අපි තාවකාලිකව තර්කයක් වශයෙන් පිළිගනිමු පිරිසිදු චේතනාවෙන්ය මෙය කෙළේ කියා. එසේ පිළිගත්තත් තමුන්නාන්සේ මොනවද මේ ගැමියන්ට භාර දෙන්නේ ? ගරු ඇමතිතුමා මේ ගැමියන්ට භාර දෙනවා ඇත්තේ නඩු හබ රාශියක් පමණයි. එක පරම්පරාවක් අවසන් වී තවත් පරම්පරාවක් ඇති වුණාට පස්සේ ඒ අයටත් මුහුණ දෙන්නට සිදු වන, පරම්පරාවෙන් පරම්පරාවට යන නඩු රාශියක් පවරා දෙන පිළිවෙළක් පමණයි මේ නීතිය.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

නීතිඥයන්ට උදව්වක්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

අන්න ඒ විධියට කිව්ව නම් ඒක ඇත්ත. මෙයට නින්දගම් පනත කියා කියනවා වෙනුවට, මුදල් ඇමතිතුමා සත්‍යයක් වශයෙන් පෙන්වා දුන්නා වාගේ, අපේ රටේ නීතිඥයන්ට—විශෙෂයෙන්ම සිවිල් නඩුවලට කථා කරන නීතිඥයන්ට—සහනයක් ගෙන දීමේ පනතක් යනුවෙන් මෙම පනත හඳුන්වා දුන්නා නම් මේ ගැන වැඩි දුරට විවාද කරන්න වුවමනාවක් නැහැ.

කොහොමද එසේ නම් මේ ප්‍රශ්නය විසඳන්නේ ? සමාජ සේවා ඇමතිතුමා දැන් මෙතැන නැහැ. එතුමා මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු කළා. මා ගිය වර කථා කරන අවස්ථාවේදීත් කිව්වා, ඉඩම් ප්‍රශ්නය වූ කලී ඉතිහාසයේ රදළ විරෝධී ධනේශ්වර විප්ලවයකට අයිති වූ ප්‍රශ්නයක් බව. ප්‍රංශයේ රදලයින්ට අයත්ව තිබුණු ඉඩම් ගැමියන් අල්ලා ගෙන ඒ ගැමියන්ම ධනේශ්වර ඉඩම් හිමියන් වුණා. වැඩවසම් ක්‍රමය නැති කර දමා ධනේශ්වර පිළිවෙතක් ඇති කිරීමේ එක් පියවරක් තමයි, ඉඩම් පිළිබඳව තිබුණු රදල හිමිකම් නැති කර ඒ වෙනුවට ධනේශ්වර අයිතියක් ඇති කිරීම, බ්‍රිතාන්‍යයේ මෙබන්දක් සිදු වූයේ ඊට ශත වර්ෂයකට පෙරයි. එහි රදල ඉඩම් හිමියන් විසින් ගැමියන් එළවා දමා නීතිරීති වෙනස් කොට තම තමුන් ධනේශ්වර ඉඩම් හිමිකරුවන් වුණා. මෙම පරිවර්තනය යුරෝපා රටවල කාලයක් තිස්සේ සිදු වුණු බව ඉතිහාසය කියනවා. බ්‍රිතාන්‍යයෙ සිදු වුණු පිළිවෙල තමයි ජර්මනියෙ ජන්කර් රදලයින් ගැමියන් එළවා දමා එම ඉඩම් අල්ලාගෙන ගැමියන් කම්කරුවන් හැටියට පරිවර්තනය කරමින් සූරාකෑමට බැස්සෙ. මෙම වෙනස, මෙම පරිවර්තනය, රුසියාවේ සිදු වූයේ 1917 දීයි. ඒ අවුරුද්දෙ පෙබරවාරි මාසයෙ ඇති වුණු පළමුවන විප්ලවයෙන් පසු විශාල වතු යායවල් තබා ගෙන සිටි බෝයාර් කොට්ඨාශය—බෝයාර් හැටියට හඳුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්න පටන් ගත් රදල ඉඩම් හිමියන්—පන්නා දමා ඔවුන් සතු ඉඩම් ගැමියන් විසින් අල්ලා ගනු ලැබුවා. චීනයෙ 1948 සිදු වූයෙත් එවැනි තත්ත්වයක්. ඒ වාගේම කියුබාවෙ 1957 දී සිදු වූයේත් ලතිෆ්ප්‍රන්ඩියා ජනයා විශාල ඉඩම් හිමියන්, ඉඩකඩම්වලින් එළවා දමා, ඔවුන් සතු ඉඩම් අල්ලා ගැනීමයි.

ගරු කථානායකතුමනි, ඉඩම් පිළිබඳව ඇති වී තිබෙන තත්ත්වය මේකයි. එක් පැත්තකින් ඉඩම් නැතිකම නිසා, ණය ගැතිකම නිසා, දුකින් පෙළෙන ගැමි ජනතාව විශෙෂයෙන් සමාජයේ පරිවර්තනයක් ඇති කිරීමට මූලික බල වේගයක් වෙනවා. ඒ සමගම එම වෙනස ඇති වූවාට පසු ඉඩම් හිමි පිරිස තමන්ට තිබෙන අයිතිය සදහටම ආරක්ෂා කර ගැනීමට උත්සාහ දරනවා. මේ අනුව ඉඩම් හිමියන් තම අයිතිවාසිකම් කෙසේ හෝ රැක ගන්න බලනවා. එම නිසා තමයි අඩ ශත වර්ෂයක් ගත වූ නමුත් තවමත් සම්පූර්ණයෙන්ම කෘෂිකර්ම ප්‍රශ්නය විස දීමට රුසියාවට නොහැකි වූ බව කියන්නෙ. එනිසා තමයි චීනය තවමත් උත්සාහ දරන්නෙ ඔවුන්ගේ විප්ලවකාරී පරිවර්තනය සාර්ථක කර ගැනීමට. මෙතෙක් සම්පූර්ණයෙන් සාර්ථක නොවීමේ හේතුවත් එයයි. එයින් අදහස් කරන්නෙ නැහැ චීනයේ අද සිදු වන සෑම දෙයක්ම අප කවුරුත් අනුමත කරනවාය කියා. නමුත් එහි කරගෙන යන විපර්යාසයන් දිහා බැලුවොත්, එහි ගැබ් වී තිබෙන එක් කොටසක් තමයි ඉඩම් ප්‍රශ්නය, ඉඩම් පිළිබඳව ඇති වී තිබෙන දුෂ්කරතාව.

ගරු කථානායකතුමනි, කෘෂිකර්මය හා ඉඩම් ප්‍රශ්නය යන මේවායින් මතු වන සමාජමය ප්‍රශ්නයන් විසඳීමට යන අවස්ථා වේදී තමයි, කා තුළත් තිබෙන හණමිටිකාර අදහස් මතු වන්නෙ. එමෙන් හණමිටිකාර තත්ත්වය වෙනස් කිරීමට අපහසු මේ නිසාය, එසේ වෙනස් කිරීමට විරුද්ධව දක්වන කරුණු මේවාය, යනාදි ප්‍රශ්න වලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මේ ප්‍රශ්න දෙකේදී, එනම්, කෘෂිකර්මය හා ඉඩම් ප්‍රශ්නය යන දෙකේදීයි, එවැනි තත්ත්වයක් ඇති වෙන්නෙ. අන්න ඒ නිසා තමයි ආණ්ඩු කරන උදවිය මේවා පදනම් කොට ගෙන තමන්ගේ බලය රැක ගන්න උත්සාහ දරන්නෙ.

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා ඊයෙ මේ ගරු සභාවට කියන්න යෙදුණා, මින් පෙර නොවූ විරු දෙයක් දැන් සිද්ධ වෙනවාය, ලෝකයෙ කිසිම රටක සිදු නොවන දෙයක්, නොකරන දෙයක්, අපේ රටේ කරනවාය, එනම්, අපේ ගැමි ජනතාවට සහතික මිලක් දෙන අතර නොමිලයේ හාල් සේරුවකුත් දෙනවාය, කියා. ඒ අන්දමට දෙන එකම රට ලංකාව පමණක් බව කීවා. අපේ අධ්‍යාපන ඇමතිතුමා, උදේ පාන්දරත් හැන්දෑවෙත් අපට කිසිම අස්වැසිල්ලක් නැති වන ආකාරයට "ලෝකයෙ උතුම් රට ලංකාවය" කියා ගුවන් විදුලියෙන් කීප විටක්ම කියන්නා වාගේ අපේ ගරු අගමැතිතුමාත් ඊයෙ මෙම ගරු සභාවෙදි මොනවාද කීවෙ?

හාල් සේරුවක් නොමිලයේ දෙන, සහතික මිළකුත් ඒ සමගම දෙන එකම රට ලංකාවලු. ඒක ඇත්ත තමයි. එහෙත් ගරු කථානායකතුමනි, ණය බරින් මිරිකී සිටින ගැමියාගේ, ඉඩම් නැතිකමින් පෙළෙන ගැමියාගේ, එම නිසා දුකට පත් වී සිටින ගැමියාගේ තත්ත්වය නගා සිටුවන්නට තවම කාටවත් බැරි වුණා. ඇත්ත ඒකයි. [බාධා කිරීමක්] ඔව්, පසුගිය ආණ්ඩුව ගැන මතක් කරනවා. ඉඩම් පිළිබඳව මා අපේක්ෂා කරන පරිවර්තනය මොනම ආණ්ඩුවක් යටතේවත් සිදු වී නැති බව මා පිළිගන්නවා. එසේ පිළිගන්න අතරම මා පිළිගන්නවා, අපටත් මනුෂ්‍යයන් වශයෙන් මේ රටේ ජීවත් වන්නට හැකියාවක් තිබෙනවාය කියන බලාපොරොත්තුවක් ප්‍රථම වරට මේ රටේ දුකින් පෙළෙන ගැමි ජනතාවගේ සිත් තුළ ඇති වුණේ 1956 ඇති වූ ඒ මැතිවරණයෙන් පසුව සිදු වූ විශාල පරිවර්තනයෙන් පසුව බව. එය ගරු සමාජ සේවා ඇමතිතුමත් පිළිගන්නට ඕනෑ. මේ රටේ දුකින් පෙළෙන කොටසක්—පීඩාවට ලක් වූ අප රටේ දුප්පත් වැසියන් කොටසක්—නියෝජනය කරන ගරු සමාජ සේවා ඇමතිතුමාටත්, මේ සමාජයේ වාසිය එක්තරා කොටසකට පමණක් සීමා නොවිය යුතුය, මේ රටේ පුරවැසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අයිතිවාසිකම් සියළු දෙනාටම එක විධියටම තිබිය යුතුය යන අදහස අනුව ඉදිරිපත් වී අද තිබෙන තත්ත්වයට නගින්නට පුළුවන් වුණේ ඒ පරිවර්තනය නිසා බව එතුමාම පිළිගන්නවා ඇති. කොපමණ මත භේදයන් ඊට පසු ඇති වුණත්, කොප මණ වෙනස් වීම් ඊට පසු ඇති වුණත්, නොයෙකුත් හේතූන් නිසා පසුව කොප මණ පිල් මාරු කරන්නට සිදු වුණත් ඒ මූලික කරුණ ගරු සමාජ සේවා ඇමති තුමාටත් පිළිගන්නට සිදු වෙනවා.

ගරු කථානායකතුමනි, ගරු අගමැති තුමා කියන විධියට නොමිළයේ හාල් සේරු වක් දෙන බවත්, ඒ සමගම සහතික මිළ කුත් දෙන බවත් ඇත්තයි. මේ කොපමණ දුන්නත් තත්ත්වය මොකක්ද? එදා 1952 අවුරුද්දේ අක්කරයකට අඩු ප්‍රමාණයක ඉඩම් අයිතියක් තිබුණු ගැමියාට—මේ පළාත්වලම කෘෂිකර්ම ඇමතිතුමාගේම සංඛ්‍යා ලේඛන අනුව අක්කර 5 කට අඩු ප්‍රමාණයක් හිමි ගැමියන් සියයට 80 ක් සිටිනවා නම් ඒ අයට—තමුන්නාන්සේලා දෙනවාය කියන දෙයින් මොන ප්‍රයෝජන යක්ද ලැබෙන්නෙ?

ඊයේ ගරු අගමැතිතුමාගේ කථාවෙන් පසු කථා කරන්නට මට අයිතියක් තිබුණේ නැහැ. එදා හාල් සේරු දෙකක් ශත 50 ට ලැබුණා. තමන්ගේ කුඹුරෙන් සොයා ගත් දේ සහතික මිලට විකුණා ගන්නට පුළු වන් වුණා. ඒ නිසා හාල් සේරු දෙක අනුභව කරමින් තමන්ගේ කුඹුරෙන් සොයා ගත් හාල් ටික විකුණාගෙන ආදා යමක් සොයා ගත්තා. නොමිළයේ හාල් සේරුවකුත් දී සහතික මිලකුත් දෙන එක ම රට ලංකාවය කියන කීම ඇත්ත තමයි. එහෙත් තිබුණු සහනයක් ඔවුන්ගෙන් ගත්තා. ඒකත් පිළිගන්නට ඕනෑ. එදා හාල් සේරු දෙක අනුභව කරමින් තමන් ගේ කුඹුරෙන් හෝ අඳේට වැඩ කර හෝ සොයා ගත්ත දේ විකුණා ගත් ගැමියාට දැන් සිදු වී තිබෙන්නේ කුමක්ද? ඔව්, එක හාල් සේරුවක් නොමිලේ හම්බ වෙනවා. ඒක පමණක් අනුභව කර ජීවත් වන්නට බෑ. එම නිසා තමන්ට අඳේට ලැබෙන අස්වැන්නෙන් කොටසක් අහ හව කරන්නට සිදු වී තිබෙනවා. එයින්, තිබුණු ආදායමත් බැස්සා. ඒ නිසා දැන් අඩු වූ ආදායමින් වැඩි මිලට බඩු ගන්නට යි සිද්ධ වෙලා තියෙන්නේ.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Is all that relevant to this? No doubt you are replying to what the Hon. Prime Minister said yesterday, but what has that got to do with Nindagam?

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பேர்னாட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමා නින්දගම් ඉඩම් පනතක් මේ ගරු සභාවට ඉදිරිපත් කළේ මෙයින් අපේ ගැමි ජනතා වට විශාල සහනයක් ප්‍රථම වරට දෙනවාය කියන අදහසිනුයි. ඒ නිසා ගමේ උදවිය ගේ නියම තත්ත්වය කුමක්දැයි සලකා බැලීම මේ ප්‍රශ්නයට අදාළයයි මා කල්පනා කරනවා. මුල සිටම මා කියා සිටියේ ඒ අදහස පෙරදැරි කරගෙන. මා කී කරුණු ඉවසිල්ලෙන් අසාගෙන සිටීම ගැන තමුන් නාන්සේට මා කෘතඥ වෙනවා.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

කොපමණ වෙලාවක් කථා කළත් අහ ගෙන ඉන්නවා.

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பேர்னாட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

ඒ ගැන කෘතඥ වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

අද හවස 7 ට ඉවර කරන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
(திரு. பேர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
පුළුවන්ද?

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඉවර කරමු.

**බර්නාඩ් සොයිසා මයා.**
(திரு. பேர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
හා හොඳයි. තමුන්නාන්සේ දැන් වුණත් පිළිතුරු දෙනවා නම් මා සම්පූර්ණයෙන්ම කැමතියි. ඊයෙ විවාදය නැවත වරක් ඇදලා ගන්නට වුවමනා කළ නිසා නොව මේ කරුණු ගැන විශේෂයෙන්ම කිව්වේ ඒවා මීට අදාළයයි මා කල්පනා කළ නිසයි.

ඉඩම් නීති පිළිබඳව කොයි තරම් ප්‍රමාණයක් පරිවර්තනයන්—සංශෝධනයන්—ඇති කළත් අද මේ රටේ මූලික ප්‍රශ්නයක් හැටියට තිබෙන, ඉඩම් කැබලි වී යෑමේ ප්‍රශ්නයත් ණය බරින් පෙළෙන ගැමියාගේ තත්ත්වය තව තවත් ජනගහණය වැඩි වීම නිසා ඒ ඉඩම්වලින් ලැබෙන ආදායම හෙවත් අස්වැන්න මේ පවුල් නඩත්තු කරන්නට තරම් ප්‍රමාණවත් නොවීමේ තත්ත්වයක් වෙනස් කරන්නට අමාරුයි. මේ දරුණු තත්ත්වය ගැන එක වචනයක්වත් නොකියා මෙවැනි වැදගත් පනතක් ගැන සලකා බලන්නට බැරි බවයි මා විශේෂයෙන් කියන්නේ. මේ වෙලාවේ සමාජ සේවා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා සභා ගර්භය තුළ නැහැ. ඇමති පුටුවෙන් මේ වැඩේ කරන්නට බැහැ. ඒ නිසා තමයි දකුණු පළාතේ ගැමියන් දැන් රජයේ ඉඩම්වල කුඹුරු වගා කරන්නටත්, හේන් ගොවිතැන් කරන්නටත් පටන්ගෙන තිබෙන්නේ. නීති විරෝධිව වෙන්නට පුළුවනි ඇතැමුන් එසේ කරගෙන යන්නේ. ඉඩම් රහිතකම නිසා රජයේ කැලෑ ඉඩම් වුවත් කපා දමා කුඹුරු ගොවිතැන සඳහා හෝ හේන් ගොවිතැන සඳහා හෝ සකස් කරන්නට පටන් ගෙන තිබෙනවා. මේ ගරු ඇමතිතුමා ආරක්ෂා කරන්නට බලය පැරණි පනා මුරේ කැලෑ වැනි නින්දගම්වලට අයත් කැලෑවල් මේ පනතින් නිකම් පාංගු පමණක් වෙන් කර—බණ්ඩාර ඉඩම්ය කියා හෝ මුත්තෙට්ටු ඉඩම්ය කියා හෝ වෙන් කර—ආරක්ෂා කර දෙන්නට බැලුවා වාගෙයි. ගැමියන්ගේ ප්‍රශ්න විසඳීම අද තමන්ගේ අතට අරන් ඉවරයි. නීති විරෝධිව වන්නට පුළුවනි. ඒ කොයි හැටි වෙතත් දැන් ගැමියන් හේන් ගොවිතැන් කරන්නට පටන් අරන් ඉවරයි. ඒ නිසා තමයි දැන් පනතට කැමැත්තක් ප්‍රකාශ කරන අතර ක්‍රමානුකූලව තමන්ගේ අමාරුවෙන් බේරෙන්නට ඉඩම් කැබලි කර විකුණන්නට ඉඩක් ලබා ගන්නට නින්දගම් හිමියන්ට වුවමනා වී ඇත්තේ. දැන් ඉඩම් කැබලි කර විකුණන්නට පටන් අරන් තිබෙන්නේ ඒ නිසයි. මෙහි අනාගතය මෙයින් පිළිබිඹු වෙනවා. මේ සම්බන්ධයෙන් අවශ්‍ය නීති සම්පාදනය කර, එක් අතකින් නොව නොයෙක් ආකාරයට පෙළෙන ගැමියාගේ ප්‍රශ්නයන් විසඳන්නට පටන් ගත යුතුයි. මේ රටේ ජනතාවට මුහුණ පාන්නට සිදු වී තිබෙන ඉඩම් රහිත භාවය හා සම්බන්ධ ප්‍රශ්න තමුන්නාන්සේලා ඔය පැත්තේ සිට ආණ්ඩු කළත්, අද විරුද්ධ පාර්ශ්වයේ ඉන්න උදවිය ඔය පැත්තට ගොස් ආණ්ඩු කළත් ඔය කිසිම පිළිවෙළක් නැති එකට එක පරස්පර විරෝධි ක්‍රියා මාර්ගවලින් විසඳන්නට බැහැ. ඒවා ඉවත් කර දමා මේ නීති හරියාකාර ක්‍රියාත්මක කළ හැකි පරිද්දෙන් සකස්කර නොගත්තොත් මේ දැවෙන ප්‍රශ්නවල පිපිරීම වළක්වන්නට බැරි වේවි. ඒ නිසයි මේ ප්‍රශ්නය ගැන කථා කරන විට මේ ආකාරයට කථා කරන්නට සිදු වී තිබෙන්නේ. මීට පෙර අවස්ථාවල දී ධනේශ්වර වාදීන්ට එරෙහිව ඉදිරිපත් වී රදල අයිති නැති කරන්නට ගැමියන්ට නායකත්වයක් දීගෙන ගියා නම් එවැනි තත්ත්වයක් ඇති වන්නේ නැහැ. අද ගැමි ජනතාවට නායකත්වය දෙන්නට සිටින්නේ ඒ වාගේම දුකින් පෙළෙන කම්කරු ජනතාව පමණයි. ඒ අයගේ එකතුව අනුව, ඒ අයගේ පවුල්වල තත්ත්වය අනුව ඇති වන පිපිරීමක් සම්බන්ධවයි මා කියන්නේ. ඒ සම්බන්ධයෙන් දැන් ඇති වී තිබෙන අවුල, නිරවුල් කරන්නට බැරි වී තිබෙන අවුල, මේ නින්දගම් පනතින් නොවෙයි, තමුන්නාන්සේලා විටින් විට අණපනත්වලට ගෙනෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

(සංශෝධනයන් මගින් නොවේ, නියම විදිහට) විසඳන්නට පියවර ගත්තේ නැත් නම්, ඒ ජනතාවම මේ ප්‍රශ්නය විසඳීම තම අතට ගන්නවා ඇති. ගැමියන් කැලෑ සුද්ධ කර ගෙන ඒවායේ පදිංචියට ගිහින්, හේන් ගොවිතැන් කරන්නට, කුඹුරු කොටන්නට පටන් ගැනීම එහි ලක්ෂණයක්.

මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කැලෑ විනාශ වීම පිළිබඳව උත්තරය ඒකයි. එනම්, ජනගහනය වැඩි වීමයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඇත්ත තමයි. කැලෑ සංවර්ධනයත් වුවමනායි. එහෙත් ඉඩම් ප්‍රශ්නයත් විසඳන්නට ඕනෑ. ඉඩම් කැබැලි වී යාමෙන් පසුව පවුල්වලට නිසි ආදායමක් ලබා ගන්නට බැරි නම්, ඒ අයට වෙන රක්ෂාවල් සපයන්නට වැඩ පිළිවෙළක් යොදන්නටත් බැරි නම්, කැලෑ කැබැලි වී යෑමේ ප්‍රශ්නය නියම විධියට විසඳෙන්නේ නැහැ. ජනගහණය වැඩි වන පිළිවෙළේ හැටියට, ඉඩම් කැබැලි වී යන ආකාරයේ හැටියට, ඉඩමෙන් ලැබෙන ආදායම පවුලේ නඩත්තුව මදි වන ආකාරයේ හැටියට නියම විධියේ පිළියමක් යෙදුවේ නැත්නම් මේ පිපිරීම වළක්වන්නට කවදාවත් බැහැ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

තව අවුරුදු 20 කින් ලංකාවේ ජනගහණය ලක්ෂ 252 ක් වෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒ තත්ත්වය ඇති වන විට තමුන්නාන්සේලා කරන්නේ මොකක්ද? ඒ නිසා තමයි මහජන චීනය මේ ප්‍රශ්නය විසඳීමට පියවර ගෙන තිබෙන්නේ. ඒ පියවර සම්පූර්ණයෙන් සාර්ථක වුණා යැයි මා කියන්නේ නැහැ. එක පියවරක් ගත් පසුව එයින් ඇති වන තවත් ප්‍රශ්න විසඳන්නට වෙනත් විධියේ පියවර ගන්නට ඒ අයට සිදු වී තිබෙනවා. එහෙත් ප්‍රශ්නයක් තිබෙන බවවත් ඒ අය වටහා ගෙන තිබෙනවා. ඒ බව වටහා ගෙන රුසියාව කටයුතු කළා. වර්තමාන කියුබාවත්, මහජන චීනයත් කටයුතු කරගෙන යනවා.

චීනය පිළිබඳව "Fanshen" කියන පොතේ විලියම් හින්ටන් මහතා ලියා තිබෙන්නේ මොනවා දැයි කියවා බලන ලෙස මා විශේෂයෙන් ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එය මේ විවාදයට අදාළ වන නිසා ඒ පොතේ ප්‍රස්ථාවනාවේ මුල් කොටස කියන්වන්න කැමැතියි. නින්දගම් පනතින් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. නින්දගම් පංගුවලට පමණක් සීමා කර ඒවායේ අයිතිය නිලකාරයන්ට දෙනවාය කියන ප්‍රතිපත්තියෙන් කවදාවත් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ප්‍රශ්නයට නියම විධියට මුහුණ දෙන්නේ නැත්නම් කොයි විධියේ පියවරක් ගත්තත් ඒවා මාර්ගයෙන් මේ ප්‍රශ්නය විසඳන්නට බැරි බව මතක් කරන්න කැමැතියි.

මෙහි තිබෙන්නේ "ලෝං බෝ" කියන ගමේ වුණු සිද්ධියක්. ඒ පිළිබඳව ලියා තිබෙන විස්තරය කෙළවර කර තිබෙන්නේ මේ විධියටයි:

"The relevance of Long Bow's history to the present day can hardly be overemphasised. The story revolves around the land question. Without understanding the land question one cannot understand the Revolution in China, and without understanding the Revolution in China one cannot understand today's world.

But the impact of the land question on world affairs is not a function of China's specific gravity alone. Who shall own the land? Who shall rule the countryside? These are primary questions in the revolution that is sweeping the whole of Asia, Africa, and Latin America. That revolution, far from dying away, is intensifying. Sooner or later, all those countries where agricultural production is a main source of wealth—and the relation between owners and producers a main source of social conflict—will undergo great transformations. An understanding of the issues involved and the solution already applied by one great nation is therefore important. In countries that stand on the verge

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

of land revolution, people are eager to study such lessons. In countries like our own . . . . ."——

He is referring to his country, America,—

——" whose leaders have the capacity to hasten or delay—though not for ever to prevent—such transformations in other lands, people *ought* to study them.

Because of these facts, I believe that this book is at least as timely today as it would have been had it come out 18 years ago when I first gathered the raw notes for it in Long Bow Village. What happened in China yesterday may well happen in Brazil, Nigeria, or India tomorrow.

Land reform is on the agenda of mankind."

කථානායකතුමනි, විශේෂයෙන් කාරණයක් කිව යුතුයි. ශත වර්ෂ එකහමාරක් තිස්සේ දුකින් පෙළුණු ගැමි ජනතාවගේ නියම විමුක්තිය හොයන්නට නම්, ඉඩම් ප්‍රශ්නයත්, කෘෂිකර්ම ප්‍රශ්නයත්, ඒ වාගේම ජනගහණය බෝවන ආකාරයට රැකීරක්ෂා ප්‍රශ්නයත් යන කරුණු තුනම එකට ගෙන යා යුතුයි. එසේ නැත්නම් මේ ප්‍රශ්නයට නියම විසඳුමක් ලැබෙන්නේ නැහැ.

මේ නින්දගම් පනතට විරුද්ධ වන්නට අපට වුවමනාවක් නැහැ. එහෙත් මේ පනත බොරුවක් බවත්, හිස් බවත්, එය ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රශ්නය අවුලෙන් අවුලට යන බවත්, හුදෙක් එය ද්වේශසහගත හැඟීමකින් ගෙන ආවක් බවත් කිව යුතුයි. එම නිසා මේ පනත සම්පූර්ණ කිරීමට, ප්‍රශ්නය නියම විධියට විසඳීම සඳහා මාවතක් පෙන්නීමට, "රදල ඉඩම් හිමියන් මේ පනතින් නැති කරනවාය" කියන වෙස් මුහුණක් බැඳ තිබුණත් ඇත්ත වශයෙන්ම රදල ඉඩම් හිමියන් නැති කිරීමට, අවශ්‍ය සංශෝධන ගෙනෙන්නට අප බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් මගේ කථාව සමාප්ත කරනවා.

අ. භා. 3.22

**ඇස්. බී. යාලෙගම මයා.** (රත්තොට)
*(திரு. எஸ். பி. யாலேகம—றத்தோட்டை)*
(Mr. S. B. Yalegama—Rattota)

ගරු කථානායකතුමනි, වැඩවසම් යුගයේ තිබුණු ක්‍රමයක එක්තරා නෂ්ටාවශේෂයක් හැටියට සැලකිය හැකි මේ නින්දගම් ක්‍රමය, වැඩවසම් ක්‍රමයේ පුරුකක් ලෙස තිබෙන නින්දගම් ක්‍රමය ගරු ඉඩම් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති මේ පනතින්වත් අහෝසි වී ශිෂ්ට සමාජයක තිබිය යුතු අන්දමට වෙනස් වේ යයි අප තුළ තිබුණු බලාපොරොත්තුව එම පනත කියවා බැලීමෙන් පසුව සුන් වී ගිය බව මා ප්‍රථමයෙන්ම කියන්නට කැමතියි. ගරු දකුණු කොළඹ මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) ප්‍රකාශ කළ අන්දමට ප්‍රංශය, එංගලන්තය, ඉන්දියාව ආදී නොයෙකුත් රටවල මේ වැඩවසම් ක්‍රමය පැවතුණා. ඉන්දියාවේ අක්කර දස දහස් ගණන් අයිති කරගෙන සිටි සමින්දාර්වරුන් ගැන කල්පනා කර බලන විට මෙවැනිම ක්‍රමයක් ඒ රටේත් තිබුණු බව අපට පෙනී යනවා. එංගලන්තයේ වැඩවසම් ක්‍රමය පැවති යුගයේ, වතු හිමි රදළවරුන් එම ඉඩම්වල වැඩ කරවා ගැනීමට වහලුන් පදිංචි කරවාගෙන සිටි බව අපි දන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඇයි චීනය.

**යාලෙගම මයා.**
*(திரு. யாலேகம)*
(Mr. Yalegama)

ඔව්. එංගලන්තය, චීනය ආදී හැම රටකම සමාජයේ විශාල කොටසක් පීඩාවට පත් වී සිටි අතර වැඩවසම් ක්‍රමයෙන් යම් යම් වරප්‍රසාද ලබා ගෙන, ඵල ප්‍රයෝජන ලබාගෙන, මනුෂ්‍යයින් වශයෙන් හොඳින් ජීවත් වන්නට පුළුවන් වුණේ අතලොස්සකට පමණයි. සමාජයේ වැඩි කොටසක් පීඩනයට පත් වී සිටියා. මේ රටේත් ඒ ක්‍රමය මෑතක් වන තුරුම පැවතුණා. කියන්නත් සන්තෝෂයි, එක් දහස් නව සිය තිස් ගණන්වල වර්තමාන කර්මාන්ත ඇමතිතුමා වැනි අය, යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) වැනි අය, අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) වැනි අය වැඩවසම් ක්‍රමයට විරුද්ධව එදා ගෙන ගිය ඒ සටන නිසා තමයි, මේ රටේ ජනතාවගෙන් යම්කිසි පිරිසකට ඇස් ඇර පිබිදෙන්නට පුළුවන් තත්ත්වයක් ඇති වුණේ. මා මාතලේ දිස්ත්‍රික්කයේ ආසනයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වුවත් තුන් කෝරළේ, විශේෂයෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලේගම මයා.]

පරම්පරා ගණනක්ම රුවන්වැල්ලේ උරුමය ඇති කෙනෙක්. එදා පැවැති ඒ වැඩ වසම් ක්‍රමයට විරුද්ධව එක් දහස් නවසිය තිස් ගණන්වල ගෙන ගිය ඒ විප්ලවකාරී සටන නිසා එදා පැගී සිටි ඒ පිරිසට ඇස් ඇරී මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා සටනක් ගෙන යන්නට පුළුවන් වූ බව මට හොඳ හැටි මතකයි. එය මේ අවස්ථාවේදී ආඩම්බරයෙන් කියන්නට කැමතියි. ඒ කාලයේ සමාජය තිබුණු ආකාරය මට මතකයි. පැගී සිටි සමහර අයට සමාජයෙන් ලැබුණු සැලකිලි ගැන මා දන්නවා. ඒවාට විරුද්ධව සටන් කළ සමහර පවුල්වලට සිදු වූ දේත් මා දන්නවා. එක් දහස් නවසිය තිස් ගණන්වල මේවාට විරුද්ධව සටන් කළ අපේ පවුල් මොන අන්දමේ පහරවල් කෑවාද කියා මා දන්නවා. එදා මේවාට විරුද්ධව සටන් කිරීමට ඉදිරිපත් වූ මගේ පියා බලවත් පීඩනයකට පත් වූ බව මට මතකයි. සමහර උදවියට නොයෙකුත් බලපෑම්වලට මුහුණ පාන්නට සිදු වුණා. ඒ කාලයේ අපේ පවුල්ද විශාල වශයෙන් කරදරවලට මුහුණ පෑවා. එදා සමාජයේ තිබුණු රෝග අතුරෙන් නින්දගම් ක්‍රමයද එකක් බව අප දන්නවා. ගරු ඉඩම් ඇමතිතුමා මෙම පනත ඉදිරිපත් කෙළේ මෙම රෝගය සුව කිරීම සඳහා යයි අප මුලින් කල්පනා කළා. එහෙත් වැඩවසම් ක්‍රමයෙන් ඉතිරි වී තිබෙන මේ අශුභ දර්ශනය, මේ පිළිලය, සමාජයේ ඉදිරි ගමනට තිබෙන මේ බාධාව ඉවත් කිරීමට මෙම පනතෙන් හැකි වෙතැයි අප මුලින් බලාපොරොත්තු වුණත් ඇත්තෙන්ම ඒ බලාපොරොත්තු ඉෂ්ට වන බවක් නොපෙනෙන බව පනත කියවා ගෙන යන විට අපට පෙනී යනවා.

ගරු කථානායකතුමනි, සමාජයේ නොයෙකුත් යුග තිබෙනවා. අද පවතින වාණිජ ආර්ථික ක්‍රමය ඇති වන්නට පෙර රාජකාරි ක්‍රමය මත ගොඩනැගුණු වැඩවසම් ආර්ථික ක්‍රමයක් මේ රටේ පැවතුණා. ඒ කාලයේදී රාජකාරියක් නැත්නම් සේවාවක් සඳහා තෑගි වශයෙන් ඉඩම් දුන්නා. අද වැටුප් ගෙවනවා වෙනුවට එදා ඉඩම් දුන්නා. එදා තිබුණු ක්‍රමය වෙනස් වෙමින් අවුත් අද කිසියම් සේවාවක් සඳහා වැටුප් ගෙවනවා. ශ්‍රමය විකිණීමේදී වැටුපක් නැත්නම් ගාස්තුවක් ලැබෙනවා.

ගරු කථානායකතුමනි, එදා මහ පොළොවේ එකම අයිතිකාරයා වූයේ රජතුමායි. රජතුමාට කරන ලද සත්කාරවලට, යුද සේවාවලට සහ සාහිත්‍ය සේවාවලට තෑගි වශයෙන් ඒ රජතුමා විසින් ඒ සේවා වන් කළවුන්ට ඉඩම් දුන්නා. අලගියවන්න මුකවෙටිතුමා වැනි උදවියටත් ඔවුන්ගේ සාහිත්‍ය සේවාවන් වෙනුවෙන් ගම්වර ලැබුණා. කරතොට ශ්‍රී ධර්මාරාම හිමියන්ට භාරස කාව්‍ය වැනි දුෂ්කර ප්‍රබන්ධයට පල්ලෙබැද්ද නින්දගම ලැබුණා. නොයෙකුත් පණ්ඩිතයන්ට, නොයෙකුත් කවියන්ට ගම්වර ලැබුණා. එදා පැවති වැඩ වසම් යුගය වෙනුවට අද තිබෙන්නේ මුදල් පරිහරණය කරන යුගයක්. එහෙත් තවමත් ඒ වැඩ වසම් යුගයේ නෂ්ටාවශේෂයක් වශයෙන් සැලකිය හැකි නින්දගම් ඒ විධියටම තිබෙනවා. හරියාකාර රාජකාරි ඉෂ්ට නොවුණත් තවමත් ඒ ක්‍රමය මේ රටේ බලපවත්වනවා. වැඩ වසම් ක්‍රමයේ නෂ්ටාවශේෂයක් වශයෙන් පවතින නින්දගම්වල පදිංචි වූවන්ට ඒවා බෙදා දීමේ චේතනාවෙන් ගරු ඉඩම් ඇමතිතුමා මෙම පනත ඉදිරිපත් කළත් ඇත්ත වශයෙන්ම ඒ අදහස හරියාකාර ලෙස ඉෂ්ට නොවන බව මෙම පනතේ වගන්ති කියවා ගෙන යන විට අපට පෙනෙනවා. මඩුවන්වල සන්නස වැනි සන්නස් කියවා ගෙන යන විට අපට පෙනෙන්නේ මොකක්ද? පණ පිටින් ගෝනකු අල්ලා ගෙනැවිත් දුන් නිසා දෙවැනි විමලධර්මසූරිය රජතුමා විසින් ක්‍රිස්තු වර්ෂ 1700 දී පමණ අක්කර 16,500 ක ගම්වරයක් මඩුවන්වල සන්නසට ඇතුළත් කොට දී තිබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඔයිට වැඩියත් දීලා තිබෙනවා එදා. ඉංග්‍රීසිකාරයිනුත් ඔය විධියට ඉඩම් දී තිබෙනවා.

**යාලේගම මයා.**
*(திரு. யாலேகம)*
(Mr. Yalegama)

නොයෙක් අන්දමින් රජවරුන් සන්තෝෂ කිරීම නිසාත් රජවරුන්ට නොයෙක් සේවාවන් කිරීම නිසාත් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාලයේදී ගම්වර, ඉඩකඩම් යම් යම් අයට ලැබුණු බව අප කවුරුනුත් දන්නා කරුණක්. නින්දගම් ඉඩම්වල පදිංචි කාරයන්ට නිළකාරයන්ට එම ඉඩම්වල අයිතිය තහවුරු කර දීම ගරු ඉඩම් ඇමතිතුමා මෙම පනතින් බලාපොරොත්තු වන නමුත් ඒ බලාපොරොත්තුව සම්පූර්ණ වශයෙන් මෙයින් ඉටු වේයයි අපට විශ්වාස කරන්නට බැහැ. මඩුවන්වල නින්දගම ගැන මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්නට කැමතියි. කිසිම පදිංචි කාරයකු, නිළකාරයකු නැති අක්කර දහස් ගණනක් එම නින්දගම්වල තිබෙනවා. එවැනි ඉඩම් ගැන මේ පනතේ කිසිවක් සඳහන් කර නැහැ. ඒවාට මොකද වන්නේ? පදිංචි කාරයන්, නිළකාරයන්, භුක්ති විඳින්නන් නැත්නම් ඒ ඉඩම් ඉබේම ඒවායේ අයිති කාරයන්ටම තහවුරු වෙනවා. ඒ නිසා, මෙතෙක් කල් තම අයිතිය නිරවුල් කර ගන්නට අයිතිකාරයන්ට බැරිව තිබුණු නින්දගම් ඉඩම් මේ පනත නිසා ඉබේම ඔවුන්ට අයිති වෙනවා. මෙය මේ පනතේ එක්තරා දුර්වල ස්ථානයක් හැටියට පෙන්වා දෙන්නට අපට සිදු වී තිබෙනවා.

නින්දගම් ඉඩම්වලින් අක්කර සිය දහස් ගණනින් කොටස් අල්ලා ගත් උඩ රට ප්‍රදේශයේ වතු කොම්පැනි කාරයන් ඒවායෙහි තේ වතු වගාකරගෙන සිටිනවා. කොම්පැනි වතුවලට අයිති වී තිබෙන එවැනි ඉඩම් විශාල ප්‍රමාණයක් උඩරට පළාත්වල තිබෙන බව අප දන්නවා. ඒවා ගැනත් මෙහි කිසිවක් සඳහන් වී නැහැ. එම නිසා මේ පනත ක්‍රියාත්මක වන විට එවැනි ඉඩම් ඉබේම ඒ අධිරාජ්‍යවාදී වතු කොම්පැනිවලට අයිති වෙනවා. නින්දගම් ඉඩම්වල නිළකාරයන්ට, පංගුකාරයන්ට යම් කිසි සහනයක් මේ පනතින් ලැබේ යයි අප බලාපොරොත්තු වුණු නමුත් මෙවැනි දුර්වලකම් නිසා ඒ සහනයත් ඔවුන්ට නියම අන්දමට නොලැබෙන බව දැන් පැහැදිලි වශයෙන්ම පෙනෙනවා. ඒ දුක් විඳින පිරිසට සහනයක් ලැබෙනවා වෙනුවට මෙයින් සිදු වන්නේ, තම නින්දගම් ඉඩම් නිරවුල් කරගන්නට බැරිව සිටි විශාල පිරිසකට ඒවා නිරවුල් කර ගැනීමේ මාර්ගය පෑදීමයි. මේ විධියේ ක්‍රමයක් අප බලාපොරොත්තු වුණේ නැහැ. මඩුවන්වල නින්දගම ගැන මා නැවතත් මතක් කරන්නට කැමැතියි. ඒවායේ නිළකාරයන් සිටිනවාදැයි මා ගරු ඇමතිතුමාගෙන් අහනවා. ඒ වාගේම අද ඒ නින්දගම්වල නියම වශයෙන් රාජකාරි කළ, ඒ සේවාවන් කළ පුද්ගලයින් සිටිනවාද? සමහර නින්දගම්වල අක්කර සිය දහස් ගණන් සමහර උදවියට අද විකුණා තිබෙන බව මා දන්නවා. අද ඒ ඉඩම්වල රාජකාරිය කළ නිලකරුවන් හෝ පංගුකරුවන් හෝ නැහැ. එවැනි තත්ත්වයක් උඩ මෙවැනි පනත් කෙටුම්පතක් සම්මත කර ක්‍රියාත්මක කිරීමෙන් සිදු වන්නේ කුමක්ද? අප බලාපොරොත්තු වන විධියට මේ පනතින් ඒ නින්දගම්වල නිලකාරයින් හැටියට වැඩ කළ උදවියට, පරම්පරා ගණනක් තිස්සේ ස්ථිර පදිංචිය ඇතිව මේ ඉඩම් භුක්ති විඳපු උදවියට, මේ ඉඩම්වල භුක්තිය සවි කර දෙන්නට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. මේ පනතේ තිබෙන්නේ නින්දගම්වල කොටස් අක්කර සිය දහස් ගණනින් මිළයට අරගෙන සිටින උදවියට ඒ ඉඩම්වල භුක්තිය සවි කර දෙන ක්‍රමයක් පමණයි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේත් මාතලේ දිස්ත්‍රික්කයේත් සබරගමු ප්‍රදේශයේත් වූ එවැනි නින්දගම් ඉඩම් ගැන මා දන්නවා. අද ඒ නින්දගම් ඉඩම්වල පංගුකාරයින්, නිලකාරයින් නැහැ. අද ඒ ඉඩම් වෙනත් උදවියට විකුණා තිබෙනවා. අනුරාධපුරයේ සමහර නින්දගම් ඉඩම් අකුරණ පැත්තෙ මුස්ලිම් ජාතිකයින් මිළයට අරගෙන අද ඔවුන් ඒ නින්දගම් ඉඩම්වල අයිතිකරුවන් වී සිටින බව මා දන්නවා. ඒ වාගේම තවත් සමහර නින්දගම් ඉඩම් සුදු කොම්පැනිකාරයින් සතුවී තිබෙනවා. නින්දගම්වලට අයත්ව තිබුණු ඉඩම්වලින් අක්කර සිය දහස් ගණන් එවකට තිබුණු අධිරාජ්‍යවාදී ආණ්ඩුවේ ආධාරයත් ඇතිව මේ සුදු කොම්පැනිකාරයින් කොල්ලකාගෙන තිබෙනවා. ඒ ඉඩම්වල අද තේ, රබර් සහ කොකෝ වගා කර තිබෙනවා. එවැනි තත්ත්වයක් පවතින්නෙ. ඒ නිසා මේ පනතින් යම්කිසි යහපතක් සැලසෙනවා නම් සැලසෙන්නේ ඇත්ත වශයෙන්ම ඒ නින්දගම්වල වාසය කරමින් ඒවා භුක්ති විඳපු උදවියට නොවෙයි, වෙනත් අතලොස්සකටයි. එම නිසා සාධාරණව කල්පනා කරනවා නම්, සමාජවාදී අදහස් උඩ කල්පනා කරනවා නම්, මේ නින්දගම් ඉඩම් සියල්ලක්ම අත්පත් කරගෙන ඉඩම් නැති දුප්පත් ජනතාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලෙගම මයා.]

අතර බෙදා දීමේ වැඩ පිළිවෙලක් ඇති කළ යුතුයි. මේ රටේ ඉඩම් නැති ප්‍රශ්නය කොයි තරම් උග්‍රවී තිබෙනවාද කියා අප දන්නවා. ඉඩම් නැතිව මේ රටේ පවුල් දහස් ගණන් අද ඉතාමත් දුකින් ජීවත් වන බව අප දන්නවා. එම නිසා මෙවැනි පනතක් ඉදිරිපත් කරන විට අතලොස්සක් ගැන නොවෙයි, ඒ ඉඩම් නැතිව දුක් විඳින දහස් සංඛ්‍යාත ජනතාව ගැන අප කල්පනා කරන්නට ඕනෑ. සබරගමුව ප්‍රදේශයේ පමණක් නොවෙයි, තුන් කෝරලයේත් තිබෙන නින්දගම් ඉඩම්වල තත්ත්වය ගැන මා දන්නවා. ඒ ප්‍රදේශවල තිබෙන විහාර දේවාලගම් ඉඩම් පිළිබඳ තත්ත්වය මා දන්නවා. දඹුළු විහාරයට අයිති අක්කර දහස් ගණනකට අද මොකක්ද වෙලා තියෙන්නෙ? භාරකරුවන් හැටියට සිටින යම් යම් උදවිය අද දඹුළු විහාරයට අයිති ඒ ඉඩම් විශාල බදු මුදල් අය කරමින් දුම්කොළ වැවීමටත් වෙනත් වැවිලි වගා කිරීමටත් දී ඒවායින් ප්‍රයෝජන ගන්නා අවස්ථා මා දැක තිබෙනවා. ඒ වාගේම දළදා මාළිගාවට අයිති අක්කර සිය දහස් ගණනක් මාතලේ දිස්ත්‍රික්කයේත් තවත් ප්‍රදේශවලත් තිබෙනවා. අද ඒ ඉඩම්වලට මොකක්ද වෙලා තියෙන්නෙ? පුරවැසිකම වත් නැති උදවිය පවා අද ඒ ඉඩම් බදු අරගෙන සිටින බව මා දන්නවා. මා නියෝජනය කරන රත්තොට කොට්ඨාශයේ තිබෙන දළදා මාළිගාවට අයිති ඉඩමක් එක්තරා පුද්ගලයෙක්, ගඩොල් පෝරණු කාරයෙක් භුක්ති විඳිනවා. ඔහුට මේ රටේ පුරවැසිකමවත් නැහැ. නමුත් අද ඔහු දළදා මාළිගාවෙන් ඒ ඉඩම බද්දට අරගෙන විශාල ධනපතියකුගේ තත්ත්වයට පත්ව සිටිනවා. දැනට පවතින මේ ක්‍රමය නිසයි එවැනි දේවල් සිදුවෙන්නෙ. එවැනි තත්ත්වයක් උඩ මෙවැනි දුර්වල පනතකින් ප්‍රයෝජනයක් ලැබේවිය කියා අපට බලාපොරොත්තු වෙන්නට බැහැ.

ඊළඟට, විහාර දේවාලගම් හා නින්දගම් ඉඩම් පිළිබඳව සොයා බැලීමට පත් කළ කොමිෂන් සභාවේ වාර්තාව ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්නට සතුටුයි. මේ වාර්තාව පිළියෙල කර දැන් අවුරුදු ගණනක් ගතවී තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ වාර්තාව යල් පැනපු වාර්තාවක්. මේ කොමිෂන් සභාවට දී තිබෙන සාක්ෂි උඩ හෝ මේ වාර්තාවට ඇතුළත් කර තිබෙන යම් යම් කරුණු උඩ හෝ පනත් කෙටුම්පතක් සකස් කර ඉදිරිපත් කර සම්මත කර ගැනීමෙන් ඇත්ත වශයෙන්ම මේ රටට යම්කිසි සේවයක් අත්වේවිය කියා මා නම් සිතන්නේ නැහැ. 1953 දි පත් කළ මේ කොමිසම පරීක්ෂණ පැවැත්වූ කාලයේ සිට අද දක්වා රටේ නොයෙක් පරිවර්තන ඇති වී තිබෙනව. ගත වූ අවුරුදු කීපය තුළ නින්දගම් සම්බන්ධයෙනුත්, විහාර දේවාලගම් සම්බන්ධයෙනුත් විශාල වෙනස්කම් සිදු වුණා. මේ අන්දමට අවුරුදු ගණනාවකට පෙර පත් කරන ලද කොමිසමක නිර්දේශ උඩ අපි මේ කාලයේ පනතක් ඉදිරිපත් කරනව නම් එයින් යම්කිසි සේවයක් සිදු වෙයි කියා මා නම් විශ්වාස කරන්නෙ නැහැ. මේ රටට දුන්න යම්කිසි පොරොන්දුවක් මේ පනත මගින් ඉටු කරන්ට ගරු ඉඩම් ඇමතිතුමා බලාපොරොත්තු වුණා නම් ඒ බලාපොරොත්තුව කිසි ලෙසකින් ඉෂ්ට වෙයි කියා මා විශ්වාස කරන්නෙ නැහැ.

මේ රටේ සමාජයේ ඕනෑ එපාකම් හරියාකාර විසඳෙන අන්දමට රටේ නොයෙකුත් පරිවර්තන ඇතිවන විධියට පසුගිය කාලයේ මේ රටේ යම් යම් පනත් ඉදිරිපත් වුණු බව අපි දන්නව. එදා කෘෂිකර්ම ඇමති වශයෙන් වර්තමාන කර්මාන්ත ඇමතිතුමා ඉදිරිපත් කළ කුඹුරු පනත එවැනි එකක් බව මේ අවස්ථාවේදී මතක් කළ යුතුයි. ඒ පනතත් රටේ විප්ලවයක් ඇති කළ පනතක්. කුඹුරුවල අයිතිය ධනපතින් අතලොස්සකට සීමා වී තිබුණු අතර මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ගොවි ජනතාවකට ඔවුන් යටතේ වහල් මෙහෙයක් ඉටු කරන්ට සිද්ධ වී තිබුණා. ඒ ගොවි ජනතාව එයින් මුදවා මේ රටේ අද ගොවීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන අන්දමට, අද ගොවීන්ට සාධාරණ ලෙස ඔවුන්ගේ මහන්සියේ කොටස ලබා දීම සඳහායි ඒ පනත ඉදිරිපත් කරන්ට යෙදුනෙ. උසාවියකින් හෝ ගොවි ජන සේවා කොමසාරිස්තුමාගේ දෙපාර්තමේන්තුවෙන් කරන පරීක්ෂණයකින් හෝ අද ගොවියාට කිසිම හිරිහැරයක් ඇති නොවන අන්දමට මේ පනත සකස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර තිබුණා. කුඹුරු පනත අංග සම්පූර්ණ යයි අපි පිළිගන්නෙ නැහැ. එහි තිබෙන දුර්වලකම් අපට අදත් පෙනෙනව. එහෙත් බොහෝදුරට ඒ පනත නිසා මේ රටේ යම්කිසි විප්ලවයක් සිදු වුණා. මේ රටේ සිටින සිය දහස් ගණනක් ගොවීන්ගේ අද අයිතිවාසිකම් ඒ මගින් ආරක්ෂා වුණා. අන්න ඒ වගේ යම්කිසි පනතක් ඉදිරිපත් කිරීමේදී සමාජයේ සුළු කොටසකගේ යහපත සඳහා නොව වැඩි දෙනාගේ යහපත සඳහා ඒවා ඉදිරිපත් විය යුතුයි. විශේෂයෙන්ම පරිවර්තන යුගයක ජීවත්වන අපි පොදු ජනතාවගේ සුභසිද්ධිය බලාපොරොත්තු වෙනව නම්, පනත් ඉදිරිපත් කිරීමෙදි අපි රටේ වැඩි ජනතාවගේ සුබසිද්ධිය උදෙසා ඒවා ඉදිරිපත් කළ යුතුයි. ගරු ඉඩම් ඇමතිතුමා වැනි පුද්ගලයකුගෙන් එවැනි සාධාරණ පනතක් ඉදිරිපත් වෙයි කියා මා විශ්වාස කරන්නෙ නැහැ. ධන වාදයට නැමී සිටින, ධනවාදී සිතුම් පැතුම් අනුව කටයුතු කරන ඇමතිවරයකුගෙන් කවදාවත් සමාජවාදී වැඩ පිළිවෙලක් ඉදිරිපත් වෙයි කියා හෝ සමාජවාදය ඔස්සේ ගමන් කරන පනතක් ඉදිරිපත් වෙයි කියා හෝ මා කොයි අවස්ථාවකදීවත් විශ්වාස කරන්නෙ නැහැ. සමහරවිට එතුමා එහෙම දෙයක් හිතුවත් ක්‍රියාත්මක කරන්ට යන අවස්ථාවේ ඒ හිතන අදහස ක්‍රියාත්මක වෙයි කියා මා විශ්වාස කරන්නෙ නැහැ. අද එතුමා ප්‍රතිගාමී පිලට එකතු වී සිටින නිසා මට කොහෙත්ම හිතන්ට බැහැ, එතුමාගෙන් මේ රටේ සාමාන්‍ය ජනතාවට සෙතක් වන විධියේ පනතක් ඉදිරිපත් වෙයි කියා. මම සිහිනයකින්වත් එහෙම හිතන්නෙ නැහැ.

මේ රජය 1965 රාජාසන කථාවෙන් නින්දගම් ක්‍රමය අහෝසි කරන බවට ප්‍රතිඥා දුන් විට මා ඉතා සන්තෝෂ වුණා, මේ රටේ පැවති වැඩ වසම් ක්‍රමයේ අවසාන පුරුකක් වන නින්දගම් ක්‍රමය මේ රටෙන් තුරන් වෙයි කියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
නින්දගම් තියෙන්නෙ ඔය පැත්තෙනෙ.

**යාලේගම මයා.**
*(திரு. யாலேகம)*
(Mr. Yalegama)
ඒත් අපේ බලාපොරොත්තුව ඉෂ්ට වුණේ නැහැ. තමුන්නාන්සේ හරිහැටි නින්දගම් පනතක් ඉදිරිපත් කරන්නෙ කොහොමද, ඔය පැත්තෙ ඉස්සරහ පේළියේ ඉන්න උදවියට එයින් පහර වදින කොට? ආණ්ඩුවේ ප්‍රබල ආධාරකාරයන්ට නින්දගම් පනත නිසා පහර වදිනව. එවැනි පනතක් ඉදිරිපත් කළොත් මොලමුරේ සෙනෙවිරත්න වැනි රදළ පවුල්වලට පහර වදින බව තමුන්නාන්සේ දන්නව. තමුන්නාන්සේ කවදාවත් ඒ උදවියගේ හිත් අසතුටු වන විධියට කටයුතු නොකරන බව මා මතක් කරන්ට කැමතියි. මෙම පනත ඉදිරිපත් කළේ එම අදහස ඇතුව නොවෙයි. යම් යම් පවුල්වලට මඩ ගැසීමේ චේතනාවෙනුයි, මෙම පනත ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ හැරෙන්නට සිත් තුළ උපන් පිරිසිදු චේතනාවකින් එහෙම නොවෙයි මෙම පනත ඉදිරිපත් කර තිබෙන්නේ. මේ රටේ සිටින සාමාන්‍ය ජනතාවට යම්කිසි සේවයක් කිරීමේ පරමාර්ථයෙන් මෙම පනත ඉදිරිපත් කළාය කියා අපට සිතන්නට අමාරුයි. පසුගිය මැතිවරණවලදී—විශේෂයෙන් බලංගොඩ මැතිවරණයේදී—මහජනතාව මුලා කොට ඔවුන්ගේ ඡන්දය ලබා ගැනීමේ පරමාර්ථයෙන් සහ විරුද්ධ පාර්ශ්වයේ නායකයන්ට මඩ ගැසීමේ චේතනාවෙන් මෙම පනත ඉදිරිපත් කළා මිස ජනතාවගේ යහපත සඳහා මෙය ඉදිරිපත් කළේ නැත යන්න මා මෙම අවස්ථාවේදී තරයේ ප්‍රකාශ කර සිටිනවා.

ගරු කථානායකතුමනි, මා අදත් සන්තෝෂ වෙනවා ගරු කර්මාන්ත ඇමතිතුමා පිළිබඳව. ඒ මන්ද, යම් විධියක සටනක් එතුමාගේ මෙහෙයීමෙන් ආරම්භ වුණා. නවසිය තිස් ගණන්වලදී තුන් කෝරළෙන් ආරම්භ කරන ලද එම සටන අද වාගේ අපට මතකයි. අපත් එම සටනට ආධාර අනුබල දුන්නා. එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි, මේ රටේ යම්කිසි පෙරළියක් ඇති කරන්නට හැකි වූයේ. තුන් කෝරළේ ජනතාවට මොළමුරේ පවුල් වලින් කොතරම් හිරිහැර කරදර සිදු වුණා දැයි අපි දන්නවා. තුන් කෝරළේ ජනතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශාලෙගම මයා.]

වට එදා සිදු වී තිබුණේ ඔවුන්ගේ වහලුන් හැටියට ජීවත් වන්නටයි. ඇතැම් කුලවල උදවියට තමන්ගේ ආත්ම ගෞරවය රැකගෙන මහ පාරේ බැස යන්නටවත් බැරි තත්ත්වයක් එදා පැන නැගී තිබුණා. අප ඒවාට විරුද්ධව සටන් කිරීමට ඉදිරිපත් වුණා. ඒ හේතුකොටගෙන සමහර උදවිය අප සමග තිබූ නෑදෑ සම්බන්ධකම් පවා අතහැරියා. එහෙත් අප කළේ මහජනතාවගේ පැත්ත අරගෙන එම තත්ත්වය නැති කිරීම සඳහා සටන් කිරීම බව මෙහි ලා ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්නට කැමතියි. කුමන පැත්තකින් හෝ වේවා සාමාන්‍ය ජනතාවගේ යහපතට අදාළ වන පරිදි පිරිසිදු චේතනාවෙන් යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් අප ඊට සම්පූර්ණයෙන්ම සහයෝගය දෙන්නට සෑම විටම සූදානමින් සිටින බව මතක් කරන්නට කැමතියි. මෙම පනතට අනුව එම නින්දගම්වල පදිංචිව සිටින නිලකාරයන්ට යම්කිසි යහපතක් සිදු කරන්නට පුළුවන් වේවිය කියා ගරු ඇමතිතුමා කල්පනා කරනවා නම් එය මේ මගින් ඉටු වන්නේ නැති බව මතක් කරන්නට ඕනෑ.

මා කලින් කීවාක් මෙන් පදිංචියෙන් තොර වූ ඉඩම් අක්කර සිය දහස් ගණන් තිබෙනවා. මහවලතැන්න නින්දගම පිළිබඳව මෙම අවස්ථාවේදී සඳහන් කරන්නට කැමතියි. මා සිතන්නේ නැහැ, අද වෙන කෙනෙකුට එම ඉඩම්වලින් අත්පත් කර ගන්නට ඉඩක් ඇතෙයි කියා. එම ප්‍රදේශවල ඉඩම් නොමැති අය ගොස් ඒ ඉඩම්වල පදිංචිව සිටිනවා. එහෙත් මඩුවංවල බුදලයට අයිති නින්දගමේ අක්කර දහස් ගණනක් තවම කැලෑවට ගොස් තිබෙනවා. මෙම පනතට අනුව යම් යම් ඉඩම්වල පදිංචිව සිටින උදවියට ඒවා පවරා දෙන්නට පුළුවන් වේවිය කියා සිතනවා. එහෙත් කිසිවකු පදිංචිව නොමැති කැලෑ අක්කර දහස් ගණන් තිබෙන ඒවාට කරන්නේ කුමක්දැයි මෙහි සඳහන් කර ඇත්තේ නැහැ. කිසිවකු පදිංචිව නොමැති අක්කර දහස් ගණන්වලින් යුක්ත නින්දගම් ඒවා අයිතිකරුවනටම තහවුරු කර දීමේ චේතනාවෙන් ඉදිරිපත් කරන ලද පනතක් හැටියට අපට මෙය තවදුරටත් හඳුන්වා දෙන්නට පුළුවනි.

තමුන්නාන්සේලා අතුරු මැතිවරණයේ දෙන ලද පොරොන්දුව මෙම පනතින් ඉටු වී නැති බව කියන්නට සිදු වී තිබෙනවා. මහජනතාව රැවටීම සඳහා ඔවුන් ඉදිරියට ගොස් දෙන ලද පොරොන්දුවෙන් ගැලවෙන්නට වුවමනා නිසා මෙම පනත ඉදිරිපත් කළා හැරෙන්නට මේ රටේ සාමාන්‍ය මහජනතාවට යහපතක් ඉටු වන ආකාරයට මෙම පනත සකස් වී නැති බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 3.51

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)

*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)*

(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

It was at the time of the Balangoda by-election that the Government first announced its intention to introduce a Bill to abolish the system of Nindagam tenure. The Bill, which had not yet seen the light of day, was proclaimed by the Government and its press as one which would end for ever all feudal survivals in land ownership in this country and liberate the serfs who were suffering under such social restrictions. This Bill has taken a long time to see the light of day. Now that it is before us we can see that it is a very modest Bill. There is very little in this Bill to liberate anybody. In fact there is really little in this Bill to object to because it touches only a very small part of the problem. I want to say that just as there is very little to object to in this Bill there is very little about which one can get enthusiastic or lyrical, for in fact this Bill seeks to abolish in law certain features of the Nindagam system which life itself had abolished many years ago.

I think, if you recall even that rather old report on the Nindagam and Viharagam systems, the commissioners pointed out that many of the features of service tenure which were associated with the Nindagam system had in practice disappeared. For instance, those who received lands

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

under this system were sometimes required to carry the palanquins of the lords and ladies, and to accompany them when they left the village. Naturally life itself shows that ninda lords and ladies do not ride in palanquins and when they leave the village they go in their cars. They do not go in procession. That sort of matter was abolished by life, and all that my hon. Friends are trying to do is to put the *imprimatur* of legal abolition into things which life itself has abolished, because many of those forms have now been converted into cash relations, into what Karl Marx called "the sordid cash liquid."

What is actually being abolished? What is being abolished is only a small part of the Nindagam system, largely a part which had been abolished by life itself. Hon. Members who spoke from this side of the House have pointed out that this Bill does not deal with the many features of the Nindagam system which exist in practice today and are an obstruction to the development of agriculture and food production. The Bill is silent on *Bandara* lands, on *Muttetuwe* lands. Hon. Friends on the other side know that there are large extents of Nindagam lands that are not cultivated at all; they are not being economically used. They are silent on that question. What are you going to do about it? Why is productive land left unproductive? Why are lands being allowed only to be given out to various contractors to fell valuable timber? Those are features of the Nindagam system about which this Bill is significantly silent. Hon. Members know that large extents of Nindagam lands have been leased to sterling tea companies. Some of them were stolen from the peasantry and leased to the tea companies. Those leases are now beginning to expire and many of those lands will have to be returned to the owners who, without having done anything to improve those lands, will get very valuable property into their hands. What are you going to do about that problem, Mr. Minister?

These are the realities of life under the Nindagam system. You are merely trying to do away in law things that life has done away in practice. What you are trying to do is to read a funeral service over a man who died many decades ago, instead of putting out, I imagine, people who are on the point of becoming corpses.

Why does this problem confront us? Why are we faced with this fact? Because, right throughout the history of this country, particularly the modern history of this country, successive governments have tried to dodge the question of land reform in this country. In fact, Ceylon has many international distinctions. We were the first to produce a woman prime minister. We have done several other things which give us—[*Interruption*]. We were the first country to distribute free rice! May I say that we also have the distinction of being one of the few, if not the only country, out of nearly 50 to 60 states that came into existence and won their independence after the Second World War, that has not carried out land reform. That is also a distinction to be written in our books, except that it has to be written in a spirit of great shame.

What have we done about land reform? We had the Paddy Lands Act which was the first attempted land reform in this country. A number of hon. Members on that side of the House opposed that Bill. It came into existence but still a lot of people lost their land as a result. Apart from that, what have you done? We had the late Mr. D. S. Senanayake's colonization schemes. They were hailed as land reform, but they were really intended to avoid land reform in the Wet Zone by exporting all the problems of Wet Zone agriculture to the Dry Zone. Now what have you done? You have only reproduced the same problems that you had in the Wet Zone in the Dry Zone. By trying to avoid land reform this is what happens. If you go on trying to avoid substantial land reform in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

this country you are going to get into trouble, and you are going to deceive the people and get nowhere.

I want to draw the attention of the House to another aspect of this matter. If you are going to have effective land reform you cannot rely on law alone. That is the common experience of all of us with the Paddy Lands Act. The Paddy Lands Act in law was not bad legislation ; it was quite a progressive piece of legislation and we all supported it. But in practice there was no organization either at the State level or at the political level or at the peasant level sufficiently strong in the rural areas to put that law into effect.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please ! The Sitting it suspended till 4.30 P.M. On resumption the hon. Deputy Chairman of Committees will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 4.30 ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමාගේ [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

இதன்படி அமர்வு பி.ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று, குழுக்களின் உப அக்கிராசனர் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்.

*Sitting accordingly suspended till 4.30* P.M. *and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *in the Chair.*

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Mr. Deputy Chairman, may I begin by offering you my congratulations on the first occasion on which you have graced the Chair of this House, and I hope there will be many more occasions when we shall have the opportunity of speaking under your benign—at least, I hope, benign—control of the Business of the House.

When we adjourned for tea I was making the last point that I wished to make in this Debate, namely, that when we seek to bring about any changes in social relations in the countryside it is not enough to pass laws but that it is necessary to have adequate and powerful machinery in the rural areas to see that those laws are put into effect.

In the industrial sector, Sir, workers have formed trade unions, and as a result trade unions, the Department of Labour, and various other forces exist to see that the labour laws passed by this House are put into effect. But, unfortunately, such organizations have not developed to a sufficient degree in our rural areas. This was one of the reasons why the expectations of the House in regard to the Paddy Lands Act were not realized. In fact, we know that it is quite a progressive bit of legislation. In the first instance, in practice, several thousands of *ande* cultivators were being ejected from their lands and the attention of the authorities had to be directed for a considerable period not towards the removal of these feudal survivals which were hampering the development of agriculture but to restore rights to persons, rights which they previously enjoyed but which they had lost. Therefore, if we are going to be serious about this Bill, even the little part of it that touches the Nindagam System, we must be able to see that sufficient organizations are set up in the rural areas to give effect to the Bill.

As I said, the Bill is extremely modest ; there is very little to crow about, and very little to object to. It touches only one small part of that problem ; it seeks to abolish in law, as I said, what has already been virtually abolished by life, but leaves large, practically effective, parts of the Nindagam system untouched.

I understand that the Bill is to be referred to a Standing Committee. I hope that as a result of the deliberations of the Standing Committee the Bill will emerge with some teeth in its at present toothless gums. There are a number of matters which need attention so that this evil, archaic system can be substantially

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

removed. We of the Opposition intend to move several amendments. They will be explained by subsequent speakers and we hope that the Government will agree to all—if not all to at least some—important amendments so that this House can do something towards the initiation of what has been long overdue in our country, namely, substantive land reforms.

අ. භා. 4.35

**එම්. ඊ. රත්වත්තෙ මිය.** (බලන්ගොඩ)
(திருமதி எம். ஈ. றத்வத்தெ—பலாங்கொடை)
(Mrs. M. E. Ratwatte—Balangoda)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද සාකච්ඡාවට භාජන වී තිබෙන නින්දගම් පනත මොන කාරණයක් නිසා මේ ගරු සභාවට ඉදිරිපත් කළාද කියන කරුණ මා පළමුවෙන්ම සඳහන් කළ යුතුයි. 1966 බලංගොඩ අතුරු මැතිවරණය තිබියදී මහජනතාව මුළා කිරීම පිණිස හදිසියේම මේ පනත ගෙන ආවා. නමුත් නාන්සේත් ලංකාවේ සිටින අනිකුත් මහජනතාවත් දන්නවා ඇති බලංගොඩ ජනතාව දුන් තීරණය ගැන. ඒ මගින් අපට පහර ගැසීමටයි මෙම පනත මේ ගරු සභාවට ගෙන ආවේ.

ඇත්ත වශයෙන්ම බලංගොඩ නින්දගම් හිමියන් වන අපෙන් බලංගොඩ ජනතාවට කිසිම කරදරයක් හිරිහැරයක් නැති බව මම මේ සභාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මෙවැනි පනතක් සකස් කර මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. නමුත් මා කියන්න කැමතියි, බලංගොඩ ජනයාට නම්, නින්දගම් ඉඩම්වල ජීවත් වන ජනතාවට නම්, කිසිම හිරිහැරයක් නැහැ. අපි දන්නවා—නමුත් නාන්සේලා දන්නවාද කියා මා දන්නේ නැහැ—බලංගොඩ නින්දගම්වල ජීවත් වන ජනතාව අවුරුදු 20 ක 25 ක කාලයක් තිස්සේ කිසිම රාජකාරියක් කර නැහැ. කිසිම බද්දක් ඔවුන්ගෙන් අය කරලත් නැහැ. ඒ විධියටයි ඒ අය ජීවත් වන්නේ. නමුත් ඔය පිළේ සිටින නින්දගම් හිමියන්ගෙන් තිබෙන කරදර නම් මම මතක් කර දෙන්න කැමතියි. මඩුවන්ගල නින්දගම ගැන අපි දන්නවා. ඒ වගේම ගරු හුරුල්ලේ ඇමතිතුමාට නින්දගම් අයිතිව තිබෙනවා.

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ** (ප්‍රවාහණ ඇමති)
(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)
(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

මට නැහැ.

**රත්වත්තෙ මිය.**
(திருமதி றத்வத்தெ)
(Mrs. Ratwatte)

ඒවා විකුණා අවසානයි කියා අපට ආරංචියි.

මෙවැනි පනතක් ඉදිරිපත් කර අපට පහර ගසන්න සූදානම් වුණත්, දැන් පහර වැදී ඇත්තේ වෙනත් තැන්වලට බව මේ ගරු සභාවට ප්‍රකාශ කරන්න කැමතියි. අද මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන පනතට මහජනතාවට සෙතක් සැලසෙන අන්දමේ සංශෝධන කිහිපයක් විරුද්ධ පක්ෂය විසින් ඉදිරිපත් කරනවා. එම සංශෝධන මේ ආණ්ඩුවේ සිටින ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇතැයි අපි විශ්වාස කරනවා. අද මේ නින්දගම් පනත නිසා රටේ නොයෙකුත් වතුයායවල් මහජනතාවට නොවෙයි, කොම්පැනිකාරයින්ට පැවරීමට මේ නින්දගම් පනතින් ඉඩ තිබෙනවා. මා යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමතියි, ඒවා කොම්පැනිවලට නොදී ආණ්ඩුවට පවරා ගන්න ලෙස. එසේ කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ වගේම සුළු නින්දගම් අපට අයිති වුණත්, මහජනතාවට සෙතක් සැලසෙන විධියේ පනත්වලට අපගේ සම්පූර්ණ සහයෝගය දෙනවා. මහජනතාවට සෙතක් සැලසෙන අන්දමේ පනත්වලදී අපේ සම්පූර්ණ සහයෝගය දෙන්න අපි ලෑස්ති බව ප්‍රකාශ කරන්න ඕනෑ.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්වත්තෙ මිය.]

මේ පනත මේ ගරු සභාවට ඉදිරිපත් කෙරුවේ දැනට අවුරුදු එකහමාරකට පමණ කලිනුයි. නමුත් න්‍යාය පත්‍රයේ පස්සෙන් පස්සට තල්ලු වෙමින් ගොස් අපේ බලවත් ඉල්ලීම උඩ, අභියෝගය උඩ, මේ පනත දැන් ඉදිරිපත් වී තිබෙනවා. මීට අපි සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරනවා. මේ පනත පනවනවාත් එක්කම එය යටතේ රෙගුලාසිත් ඉක්මනටම පනවා ; දක්ෂකම් ඇති, මහජනතාව සමග හොඳ හිතින් ක්‍රියා කරන නිලධාරීන් පිරිසක් පත් කර මෙය ඉක්මනින් ක්‍රියාත්මක කරවන හැටියට ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 4.40

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)**

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)*

(Dr. S. A. Wickremasinghe—Akuressa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම නින්දගම් පනත ඉදිරිපත් කිරීමට මත්තෙන් මේ ආණ්ඩුව විසින් එක්තරා විශාල ප්‍රචාරයක් කරගෙන ගියා. එනම්, මේ රටේ තිබෙන රදළ වැඩවසම් ක්‍රමය නැති කිරීමට, මේ නින්දගම් නැති කිරීම පිණිස නින්දගම් පනත ඉදිරිපත් කිරීමට, පසු ගිය ආණ්ඩුව කටයුතු කෙළේ නැත, ඒ නිසා මහජන අයිතිවාසිකම් ගැන විශාල කැක්කුමක් තිබෙන පක්ෂයක් හැටියට, ආණ්ඩුවක් හැටියට මේ නින්දගම් පනත මේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කළාය කියන පුරසාරම් දෙඩීමයි. මේ පුහු පුරසාරම උඩ මේ ආණ්ඩුව මතු කාලයේ කටයුතු කරන්නට ලොකු ප්‍රයත්නයක් දරණ බව බොහෝම පැහැදිලි වශයෙන් ඊයේ අගමැතිතුමා මොන තරම් ආඩම්බරයෙන් ප්‍රකාශ කළාද ? "හාල් සේරුවක් නොමිලේ දෙන තවත් කිසිම රටක් ලෝකයේ තිබෙනවාද ? වී බුසලක් රුපියල් 14ට මිලයට ගන්න තවත් රටක් ලෝකයේ තිබෙනවාද ? මහජනයාට අනුකම්පාවෙන් මෙවැනි දීමනා දෙන තවත් රටවල් ලෝකයේ තිබෙනවාද " යනාදි වශයෙන් එතුමා කරුණු ඉදිරිපත් කළා. අපේ මූණ දෙස බලාගෙන එතුමා ප්‍රශ්න කළා, මේ තරම් ත්‍යාගශීලී අන්දමට කටයුතු කරන ආණ්ඩුවක් සමාජවාදී රටවල පවා තිබෙනවාද කියා.

මෙහිදී එක මූලික සත්‍යයක් අගමැතිවරයාට අමතක වුණා. ආර්ථික ක්‍රමයේ සහ සමාජ ක්‍රමයේ වෙනසක් කිරීමෙන් සමාජවාදී ක්‍රමයක් බිහි කළ සමාජවාදී රටවල පවතින පෞද්ගලික ආදායම ගැන අගමැතිවරයා කල්පනා කෙළේ නැහැ. කම්කරුවෙකුගේ ආදායම් අනුව, ගොවිපළේ ගොවියකුගේ ආදායම අනුව, තමන්ට ලැබෙන ආදායමේ ඉතාම සුළු කොටසකින් තම ජීවන වියදම පිරිමසා ගන්නට ඒ රටවල කම්කරුවන්ට සහ ගොවියන්ට පුළුවන් බව එතුමා අමතක කළා. ආහාර ද්‍රව්‍ය සහ අනිකුත් පාරිභෝගික ද්‍රව්‍ය අඩු මිලට ලබා ගැනීමට හැකි ආර්ථික ක්‍රමයක් ඇති කළාට පසුව පිනට දෙන හාල් සේරුවක් වුවමනා නැහැ. සහතික මිලකට ආණ්ඩුව විසින් ආහාර ද්‍රව්‍ය ගැනීමට වුවමනා නැහැ. එනිසා එවැනි තත්ත්වයක් පිළිබඳව කරුණු අවබෝධ කරගත්තේ නැතුවා පමණක් නොවෙයි එවැනි සමාජවාදී ආර්ථික ක්‍රමයක් ඇති කිරීම ගැන හිනෙකින්වත් කල්පනා කරන්නේ නැති පක්ෂයකුත් අගමැතිවරයකුත් නිසා තමයි ඒ පුරසාරම සමාජවාදි ප්‍රතිපත්ති අනුගමනය කරන, සමාජවාදී ආර්ථික ක්‍රමය වෙනුවෙන් සටන් කරන අයට විශාල අභියෝගයක් වන්නේ. එයින් අවබෝධ වෙනවා, සමාජවාදී ප්‍රශ්න සම්බන්ධව ඉතාම සැහැල්ලු අවබෝධයක් ඇති ආණ්ඩුවක් සමගයි අපට මේ වාද විවාද කරන්ට සිද්ධ වී තිබෙන්නේ කියා.

නින්දගම් ක්‍රමය රදළ ක්‍රමයේ අංගයක් බව ප්‍රධාන වශයෙන් අප පිළිගන්නවා. ඊට පෙර අපි බලමු මේ දාස ක්‍රමයේ අංග මොනවාද කියා. දාස ක්‍රමය යටතේ, නිෂ්පාදනය කරන දේ නිෂ්පාදනය කරන ජනයාට අයිතියක් නැහැ. නිෂ්පාදනය කරන දේ නිෂ්පාදනය කරන නැනැත්තාට අයිතියක් නැතුවා පමණක් නොවෙයි, තමන්ගේ ජීවිතය පවා තමන්ට අයිතියක් නැහැ. දාසයන් අයිති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරුවන් ටික දෙනාට තමයි දාසයන්ගේ ජීවිතය පවා ඇති කිරීමේ බලය තිබෙන්නේ. ප්‍රජාතන්ත්‍රවාදී බලයක් නැති මනුෂ්‍ය අයිතිවාසිකම් ගැන නොතකන සමාජයක, මනුෂ්‍යයකු වශයෙන් තම ජීවිතය පවා ප්‍රවේසම් කරගෙන ජීවත් වීමට දාසයා අයිතිකරුවාගේ අවසරය උඩ මිස දාසයාට වෙන බලයක් නැහැ. එහෙත් රදළ සමාජයේ මූලික වශයෙන් ඒ දාස ක්‍රමය වෙනුවට තරමක් උසස් ආර්ථික ක්‍රමයක් තිබෙන්නේ වී නමුත් රදළ අයිතිකරුවාට මිස නිෂ්පාදනය කරන ජනතාවට තමන් නිෂ්පාදනය කරන දේ පිළිබඳ අයිතියක් නැහැ. රදළයන්ට තමයි, ඉඩම් අයිතිකාරයන්ට තමයි සම්පූර්ණයෙන් වස්තුව ලැබෙන්නේ. ධනේශ්වර ක්‍රමය උඩ මේ රටේ ගොවිතැන් ක්‍රමය සකස් කිරීම මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වී තිබෙනවා. අවසානයේදී, එයින් මේ රටේ ඇති කරන්න යන තත්ත්වය ඇති කරන්න පුළුවන් වේයයි මා විශ්වාස කරන්නෙ නැහැ. මන්ද? නුදුරු අනාගතයේදී බැරි වුණොත් අඩු වශයෙන් තවත් අවුරුදු දෙකකින් බලයට පැමිණ මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කර දීමට කටයුතු කරන්නට විරුද්ධ පක්ෂයට හැකි වේයයි දැඩි විශ්වාසයක් අපට තිබෙන නිසයි. මෙම ආණ්ඩුවේ බලාපොරොත්තුව වී තිබෙන්නෙ අද තිබෙන ධනේශ්වර ක්‍රමය තුළින්, එදා පැවති වැඩවසම් ක්‍රමය නැති නම් රදල ක්‍රමය නව තවත් තහවුරු කිරීමයි. ඒ කාලයේ නිෂ්පාදනය කරන කොටසට එම ඉඩකඩම්වල අයිතියක් තිබුණේ නැහැ. එකල පැවතියෙත් රදල ක්‍රමය හා දාස ක්‍රමයයි. ඒ ක්‍රමයටත් වඩා භයානක ක්‍රමයක් තහවුරු කිරීමටයි මෙම ආණ්ඩුව දැන් උත්සාහ දරාගෙන යන්නෙ.

මා එසේ කියන්නෙ, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් රැක දීමට උත්සාහ දරනවාය යන මුවාවෙන් එදා පැවති වැඩවසම් ක්‍රමයටත් වඩා දරුණු ක්‍රමයක් විදේශික අධිරාජ්‍යවාදීන් සමග එකතු වී මේ ආණ්ඩුව ගෙන යන බව පෙනී යන නිසයි. එදා පැවති රදල ක්‍රමය නැති කිරීමට, බණ්ඩාරනායක ආණ්ඩුව සහ [illegible] ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව තිබුණු කාලයේදී නොකළ පුදුම දේවල් කරන්න යනවාය කියා ප්‍රකාශ කරමින්, මෙම පනත ඉදිරිපත් කිරීමෙන් කරන්නෙ, රදල ක්‍රමයෙ නැති නම් වැඩවසම් ක්‍රමයෙ මැරුණු කොටස් වැළලීමට උත්සාහ දැරීමයි. ඇත්ත වශයෙන්ම වැඩවසම් ක්‍රමයෙ, රදල ක්‍රමයෙ, අදට බල පාන කොටස් මේ පනතට අඩංගු කර නැහැ. මට පෙර කථා කළ බලංගොඩ මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා, මඩුවන්වල දිසාවට අයිතිව තිබුණු නින්දගම්, රජයෙන් ලැබුණු විශාල මූකලන්, මෙම පනතට අඩංගු වෙන්නෙ නැති බව, මෙම පනත ඒවාට බල පාන්නෙ නැති බව. එපමණක් නොවෙයි, බණ්ඩාර ඉඩම්, මුත්තෙට්ටු ඉඩම්, මෙයට ඇතුළත් නොවන බවත් එතුමිය මතක් කළා. අපට එනිසා පිළිගන්න වී තිබෙනවා. සුළු වශයෙන් පමණයි ඒවාට මෙම පනත බල පාන්නෙ කියා. එම නිසා මෙබඳු පනතකින් බලාපොරොත්තු වන්නෙ මහජනතාව, වැඩ කරන ජනතාව, ගොවි ජනතාව, ඉදිරි කාලය තුළදී ධනේශ්වර ක්‍රමය යටතේ නව නවත් වහල් තත්ත්වයක තබා ගැනීමටයි. එසේ වුණත්, මහජනතාව නොමග යැවීමට පමණක් වැඩවසම් ක්‍රමයෙ මැරුණු කොටස් වැළලීමට උත්සාහ දැරීමක් වැනි පනතක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ හැර කිසිවක් මේ පනතෙ ඇත්තෙ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අක්කර දහස් ගණන් විශාල ඉඩකඩම් ධනපතීන්ට බෙදා දීම ගැන ඊයේ මෙම ගරු සභාවෙ විවාදයක් ඇති වුණා. මේ අන්දමට ඉඩම් බෙදා දීමෙන්, වගා කිරීමට ඉඩම් නැති, රක්ෂා නැති, හාමතෙන් පෙළෙන දහස් ගණන් අහිංසක ජනතාව අඩු කුලියට වහලුන් මෙන් ඒවායේ වැඩ කිරීමට යොදන්න පුළුවනි. රදළ ක්‍රමය පැවති යුගයේදී වාගේ නිෂ්පාදනය කරන අයට ඒවායේ අයිතියක් නැහැ, වැඩ කරනවා පමණයි. මෙම ඉඩම් ලංකාවෙ ධනපතීන්ට පමණක් සීමා වෙන්නෙ නැති බව, මොරටුවේ ධනපතීන්ට පමණක් සීමා වෙන්නෙ නැති බව, නුදුරු අනාගතයේදී විදේශීය ධනපතීන්ටත් ලබාගැනීමට ඉඩකඩ සැල[illegible] බව ලෝක බැංකුව සමග දැනට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරගෙනයන සාකච්ඡාවලින් පෙනී යනවා. ටික කලකට පෙර ලංකාණ්ඩුව සමග සාකච්ඡා කිරීමට ලෝක බැංකුවෙන් fපර්ගියුෂන් නැමැති පුද්ගලයකු එව්වා. එසේ පැමිණි පුද්ගලයා කීවා, ගංගා නිම්න සංවර්ධනයට ලෝක බැංකුවෙන් ණය දෙන්න පුළුවන්කම ඇතත් ආණ්ඩුව ඇපයට ගන්න නම් බැරිය කියා. මන්ද ? මේ ආණ්ඩුව බිංකොලොත් ආණ්ඩුවක් නිසයි. සංවර්ධනය කරන්නට බලාපොරොත්තුවන මුඩු ඉඩම්වල අළුතෙන් පදිංචි කරන ජනතාව පිළිබඳ වගකීම අපට භාර ගන්නට බැරිය, ඒ නිසා ලෝක බැංකුව සමගත්, අධිරාජ්‍යවාදී රටවල් සමගත් ඇතිකරගෙන තිබෙන විශේෂ සම්බන්ධකම්වලින් ප්‍රයෝජන ගැනීම සඳහා විදේශික කොම්පැනිවලට අක්කර දහස් ගණන් වගා කිරීමට දෙන්නට ඕනෑය, විදේශ ධනය ගලාගෙන එන්නට කඩොලු අරින්නට ඕනෑය කියා පර්ග්‍යුසන් මහත්මයා ප්‍රකාශ කළා. ශත වර්ෂයකට පමණ පෙර උඩරට කඳුකරයේ අපේ ඉඩම් අක්කර දහස් ගණන් කොල්ල කෑවා වගේ විශාල කොල්ලකෑමක් කිරීමට බලාපොරොත්තු වෙනවා. අනාගතය ගැන කල්පනා කරන්නට අපේ මැති ඇමතිවරුන්ට දක්ෂකමක් නැහැ. අද ලතින් ඇමෙරිකාවේ—දකුණු ඇමෙරිකාවේ—විශාල කෙහෙල් වතු යායවල් ඇති කර, වෙනත් විශාල වතු යායවල් ඇති කර, රදළ ක්‍රමයටත් වඩා දරුණු දූස ක්‍රමයක් අනුව ඒ රටේ කම්කරු පන්තිය වහලුන් හැටියට පාවිච්චි කරමින්, ඇමෙරිකන් යුද්ධ හමුදව යොදවා, ඒ රටේ මිලිටරි ආණ්ඩු ඇති කර, ඒ කම්කරුවන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳින්නට ඉඩ නොදී විශාල ඇමරිකන් ධනපති කොම්පැනි ගෙන යන වැඩ පිළිවෙළේ දරුණුකම බොහොම පැහැදිලි වශයෙන් අවබෝධ කර ගන්නට පුළුවන්. අනාගතයේදී අපට වන්නට යන දේ ගැන කල්පනා කරන්නට අපේ මැති ඇමතිවරුන්ට ශක්තියක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නින්දගම් පනත මගින් මැරිච්ච දේ වළලන්ට මහන්සි ගැනීම ගැන අපට විරුද්ධ වන්නට වුවමනාවක් නැහැ. එහෙත් මේ කාරණය මතක් කරන්නට ඕනෑ. රජයෙන් ලබා ගත් අක්කර දහස් ගණන් මුඩු ඉඩම්—මූකලන්—රාජ සන්තක වෙන්නට ඕනෑ. ඒ ඉඩම්, ධනේශ්වර ක්‍රමය යටතේ නැති වුනත් සමූහ ගොවි පොළවල් ඇති කර, සමුපකාර ක්‍රමයට ගොවි ජනතාව මගින් නවීන ක්‍රමානුකූලව ගොවිතැන් කර දියුණු කිරීමේ ක්‍රමයක් තියෙනවා. ඒ ගැන කිසිම විශ්වාසයක් මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට නැහැ. සමූහ ගොවිපොළවල් ක්‍රමය මනුෂ්‍යයා තුළ පිහිටා තිබෙන ගුණාංගවලට විරුද්ධ ක්‍රමයක් බව ඉඩම් ඇමතිතුමා නිතරම කියනවා. මනුෂ්‍යයන් තුළ පිහිටා තිබෙන ගතිගුණ අනුව මනුෂ්‍යයන් කැමති වන්නේ තමන්ටම අයිතිය තබා ගෙන තමන්ගේ යහපත පිණිස කටයුතු කිරීමට මිස අනුන් සමග සහයෝගයෙන් පොදු යහපත ගැන කල්පනා කර වැඩ කිරීමට නොවන බව ඉඩම් සංවර්ධන ඇමතිතුමා කීප විටක්ම ප්‍රකාශ කර තිබෙනවා. නින්දගම්වලින් ඇති වූ ප්‍රධාන උවදුර කුමක්ද ? තමන් නිෂ්පාදනය කරන දේ සම්බන්ධයෙන් තමන්ට අයිතියක් නැති, ඒවා හා සම්බන්ධ පාලන බලයක් තමන් වෙත පැවරී නැති කොටසක් හැටියට සිටින්නට ඒ නිෂ්පාදකයන්ට සිදු වී තිබීමයි. ධනේශ්වර ක්‍රමය යටතේ ඇති වන්නේ එවැනි තත්ත්වයක්මයි. ධනේශ්වර ක්‍රමය යටතේ බලාපොරොත්තු වන්නේත් එවැනි තත්ත්වයක්මයි.

මගේ කථාව අවසන් කරන්නට පෙර තවත් එක් කාරණයක් පමණක් මතක් කරන්නට කැමතියි. මේ ආණ්ඩුව තවත් පුරසාරමක් දූන් දෙඩනවා. ගොවි පනතක් තිබීම ගැනයි, ඒ. ඉඩම් අයිතිය සම්බන්ධව ඇති නීති සංශෝධනය කිරීමේ වැඩ පිළිවෙළක් "ලැන්ඩ් රිෆෝර්ම්ස්" ක්‍රමයක් හැටියට අදහස් කරනවා. එහෙත් ලෝකයේ අනෙකුත් රටවල ඉඩම්වල අයිතිය සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ගය අනුව සලකා බලන විට අප කර තිබෙන්නේ ඊට වඩා වෙනස් දෙයක් බව පෙනී යනවා ඇති. මටත් මුඩු බිම් ටිකක් පරම්පරාගතව අයිතිවෙලා තිබෙනවා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
කොහෙද තිබෙන්නේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ඔව්, ටිකයි. මටත් ඒ ඉඩම් සහතිකයෙන්ම අයිතියි. දැන් එයින් සියේට විසිපහක තරම් ආදායමක් ලබා ගන්නට ගොවි පනතින් සහතික කර තිබෙනවා. කිසිවක් නොකර නිකම් සිට ආදායමෙන් සියේට 25ක් මට ලැබෙන බවට දැන් සහතිකයක් තිබෙනවා. ඉස්සර නම් ගොවියාට සුළු වශයෙන් හෝ ආධාරයක් උපකාරයක් කරන්නට ඕනෑ, ප්‍රයෝජනයක් ලබා ගන්නට. අවශ්‍ය ණය මුදල් දීමෙන් හෝ වෙනත් ක්‍රමයක ආධාරයක් දීමෙන් හෝ අත දුන්නොත් තමයි, ඉස්සර නම් ප්‍රයෝජනයක් හරියටම ලබා ගන්නට පුළුවන් වුණේ. දැන් නම් ඉඩම දිහාට යන්නටවත් වුවමනාවක් නෑ. කොළඹම පදිංචි වෙලා ඉන්නට පුළුවනි. මෙය ගොවි අයිතිය සහතික කිරීමේ ලෑන්ඩ් රිෆෝර්ම් ක්‍රමයක් නම් නොවෙයි, කොළඹටම වෙලා සිටින ඉඩම් හිමියාට වුණත් අස්වැන්නෙන් සියේට 25 ක් අයිති වෙනවා. අයිතිකාරයන්ගේ ආදායම ආණ්ඩුව විසින් සීමා කර තිබෙනවා. නිකම් ඉන්න මිනිහාටත් අස්වැන්නෙන් හතරෙන් කොටසක් ලැබෙනවා නම් එය ඒ තරම් සුළු ප්‍රමාණය කැයි කියන්නට බැහැ. මේ ආණ්ඩුව බලයට පත් වී ආවාට පස්සේ ගොවි පනත ක්‍රියාත්මක වන ආකාරයත් වෙනස් වෙලා තියෙනවා. ඉඩම් අයිතිකාරයෝ තමයි ගොවි කාරක සභාවලත් දැන් බලයට පත් වෙලා ඉන්නේ. එසේ නොවේයයි කියන ලෙස මා අභියෝග කරනවා. දැන් එක්සත් ජාතික පක්ෂයේ උදවිය අතර ඉන්න ඉඩම් අයිතිකාරයෝ ගොවි කාරක සභාවලටත් ගිහිල්ලා, නීතියෙන් ලැබිය යුතු සියේට 25 වෙනුවට සියේට 50 පවා ලබා ගන්නවා. එය දැන් මංකොල්ල කෑමක් වැනි දූෂණයක් වී තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ඉඩම් හිමියන්ගේ මේ බලපෑම් ගැන දිසාපතිවරුනුත්, ආණ්ඩු පක්ෂයේ උදවියත් දන්නවා. බලතල ලබා සිටින මේ පිරිසට විරුද්ධව සටන් කිරීමට බැරි නිසා නීතියෙන් තමන්ට ලැබිය යුතු හතරෙන් තුන් පංගුව අද ගොවියාට අද ලැබෙන්නේ නැහැ. එය අද හැම ප්‍රදේශයකම පාහේ සිදුවන බව කියන්නට පුළුවනි. එය ඔප්පු කරන්නට පුළුවන් බව මා අභියෝගයෙන් කියනවා. මේ ගැන මීට වඩා කියන්නට වුවමනාවක් නැහැ. තව දුරටත් මේ විධියට මහජනයා රවටන්නට බැරි බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 4.53

**පී. බී. විජේසුන්දර මයා. (කිරිඇල්ල)**
*(திரு. பீ. பி. விஜயசுந்தர—கிரியல்ல)*
(Mr. P. B. Wijesundara—Kiriella)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නින්දගම් ඉඩම් පනත් කෙටුම්පත පිළිබඳ මේ විවාදයට සහභාගි වී කථා කරන්නට ආරම්භ කරන විට තමුන්නාන්සේ වැනි සීදේවි මුහුණක් ඉදිරියේ කථා කරන්නට ලැබීම ගැන මා ආඩම්බර වෙනවා. ස්ථාවර කාරක සභාව ඉදිරියේ වැඩි දුරටත් කරුණු පැහැදිලි කරන්නට පුළුවන්කමක් තිබෙන නමුත් ඊට පෙර මේ ගරු සභාවේදී යම් යම් වැදගත් කරුණු ස්වල්පයක් ගැන සාකච්ඡා කිරීමට නින්දගම් බලපෑම් තිබෙන ප්‍රදේශයක වාසය කරන කෙනකු හැටියට ඉඩක් ලැබීම සතුටට කරුණක්. නින්දගම් ගැන නොයෙක් විධියේ විග්‍රහයන් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මේ රටේ නින්දගම්වල අයිතිය හා පැවැත්ම අද-ඊයේ සිට තිබෙන්නක් නොවෙයි. බොහෝ කාලයකට පෙර සිටම ලංකාවේ ඉඩම් ප්‍රතිපත්තිය සකස් වී තිබුණේ, නින්දගම් මතයි.

ඒ වාගේම මේ නින්දගම් සම්බන්ධයෙන් මහාවංශයෙන් පටන්ගෙන අනෙක් ඉතිහාස ග්‍රන්ථවලත්, නූතන ඉතිහාස ග්‍රන්ථවලත් විවේචන හා විග්‍රහ කිරීම් ඇතුළත් වී තිබෙනවා. මහාවංශයේ සඳහන් කරුණු සියල්ලම සියයට සියයක්ම සත්‍ය වශයෙන් අප පිළිගන්නේ නැහැ. එහි සමහර දේවල් අතිශයෝක්තියෙන් දක්වා තිබෙනවා. තවත් සමහර දේවල් යථා තත්ත්වයටත් අඩුවෙන් සඳහන් කර තිබෙනවා. ඒ කෙසේ වෙතත්, මහාවංශයේ මෙන්ම අනෙකුත් ඉතිහාස ග්‍රන්ථවලත් නින්දගම් සම්බන්ධයෙන් පළ වී තිබෙන මත මේ අවස්ථාවේදී අප විසින් සලකා බැලිය යුතුව තිබෙනවා. මේ ගරු සභාවේ සාමාජිකයන් වශයෙන් සිටි හා දැනටමත් සිටින ඉතිහාසඥයනුත් නින්දගම් සම්බන්ධයෙන් නොයෙක් විග්‍රහයන් කර තිබෙනවා. ඒ කෙසේ වෙතත්, නින්දගම්වල ආරම්භය කෙසේ ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන්න ගැන මගේ මතයේ හැටියටත්, සමාජවාදී මතයේ හැටියටත් කරුණු ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

ඇත්ත වශයෙන්ම ලංකාවේ සිංහල රජ කාලයේ, වැඩවසම් යුගයේ තිබුණු ඉඩම් ප්‍රතිපත්තියත්, සමාජවාදී රටවල ඉඩම් ප්‍රතිපත්තියත් එක වාගේය කියා මා කල්පනා කරනවා. මා එයින් අදහස් කරන්නේ, සමාජවාදී නැත්නම් කොමියුනිස්ට්වාදී රටකත්, සිංහල රජ කාලයේ ලංකාවේත් තිබුණු ඉඩම් ප්‍රතිපත්තිය සියයට සියයක් එක හා සමානය යන්න නොව එක අත්තිවාරමක් නැත්නම් අඩිතාලමක් මත තිබුණු බවයි. "ලංකාවේ මුළු භූමි තල යම අයත් වන්නේ පොදුවේ සියලුම වැසියන්ටය" යන හැඟීම සිංහල රජ කාලයේ තිබුණා. සමාජවාදී නැත්නම් කොමියුනිස්ට්වාදී රටක ඉඩම් සම්බන්ධයෙන් පවතින හැඟීමත් එයම යැයි මා විශ්වාස කරනවා. ඒ කාලයේ ලංකාවේ තිබුණේ "මුළු ලංකා භූමි තලයම අයිති රටවැසියාටය, රටවැසියා මඟින් රාජ්‍යයටය, රාජ්‍ය මඟින් රජුටය" යන හැඟීමයි.

රටවැසියන් වෙනුවෙන් රජුට අයත් වූ භූමි තලය පාලනය කිරීම සඳහා නියෝජිතයන් වශයෙන් නොයෙක් අය රජතුමා විසින් පත් කර තිබුණා. ගමක් පාලනය කිරීමට ගම්ලද්දත්, පළාතක් පාලනය කිරීමට කෝරලේත්, ප්‍රදේශයක් පාලනය කිරීමට අදිකාරමත් වශයෙන් රජතුමා සන්නස් මාර්ගයෙන් නියෝජිතයන් පත් කර, ඔවුන්ට ඒ ඒ ඉඩකඩම් පිළිබඳ පාලනමය බලය පැවරුවා. අදිකාරම්ට, කෝරළේට, ගම්ලද්දාට සන්නස් මඟින් ඉඩකඩම් ප්‍රදානය කර තිබුනේ පුද්ගලික අයිතියක් වශයෙන් නොවෙයි. ඒ භූමි කොටස් වල එක්තරා පාලනමය අයිතියක් පමණයි, ඔවුන්ට පවරා තිබුණේ. රජු වෙනුවෙන් අන්දමටයි ඒ ක්‍රමය සකස් කර තිබුණේ. එසේ ඔවුන්ට ඒ භූමි කොටස් පිළිබඳ පාලනමය බලය පමණක් එවකට පැවරී තිබුණත්, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් මේ රට අල්ලාගෙන ඔවුන්ට අවශ්‍ය තේ, කෝපි වවන්නට කට යුතු කළ අවධියේ ඒ නිලතල දැරුවන් සහ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් අතර ඇති වුණු කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් වශයෙන්, ඒ නිලතල දැරුවන්ට එම ඉඩකඩම් පිළිබඳ පෞද්ගලික අයිතියක් පැවරුණා.

ලංකාවේ නින්දගම් දිහා බලන විට, එය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදන්නට පුළුවනි. ඉන් පළමු වැන්න නම් යම් යම් ප්‍රදේශවල පාලනමය පහසුකම් සලකාගෙන රජතුමා විසින් පැවරුණු ඉඩම්. එම ඉඩකඩම් පාලනය කිරීම සඳහා රජතුමා විසින් ඒවා සන්නස් මාර්ගයෙන් පවරනු ලැබුවා. එසේ පැවරුවේ ඔහුගේ යම් දක්ෂකමක් සලකාගෙනයි. යම් අයෙක් යම් දක්ෂකමක් කළොත්, එසේ නැත්නම් රජුගේ ආදරයක් යම් පුද්ගලයෙක් කෙරෙහි ඇති වුණොත්, එසේත් නැත්නම් යම් පුද්ගලයෙක් රජ්ජුරුවන්ට යම් සේවයක් කළොත්, ඒ පළාතේ පාලන බලය ඒ පුද්ගලයාට පැවරුවා. ඊට පසුව ඉදිරියේදී ඇතිවන රජකෙනෙකුගේ අනුකම්පාවට වෙන කරුණක් නිසා වෙන පවුලකට යොමු නොවුණොත් එතෙක් පැවති එහි පාලනය ඒ පාලන භාරය දැරූ තැනැත්තාගේ පුත්‍රයාට හෝ සහෝදරයාට හෝ මස්සිනාට හෝ පාලන භාරය පැවරුණු බව අපට ඉතිහාසයෙන් දකින්නට පුළුවන්. ඒ අනුව තමුන්නාන්සේ දන්නවා ලංකාවේ සිංහල රාජ සමයේදීත් ද්‍රවිඩ රාජ්‍ය සමයේදීත් රජකමත් ඒ අන්දමටම රජුගේ පුත්‍රයාට හෝ සහෝදරයාට හෝ මස්සිනාට හෝ පැවරුණු බව. එමෙන්ම මේ නින්දගම් කියන ඒවාත් ක්‍රම තුනක් උඩ පැවරුවා.

මේ ගරු සභාවේ විශාල වශයෙන් සාකච්ඡා කෙරුණ මඩුවන්වල නින්දගම ගැනත්, පනාමුරේ නින්දගම ගැනත්. දැන් තිබෙන පොලීසි නැති ප්‍රදේශ—unpoliced areas—වගේ ඒ කාලයේත් පාලකයෙක් නැති විශාල ප්‍රදේශ තිබුණා. ඒ කාලයේ එවැනි ප්‍රදේශයක යම්කිසි පුද්ගලයෙක් රජතුමාට යම්කිසි සේවයක් කළා නම් ඒ පළාතේ පාලන බලය ඒ තැනැත්තාට සන්නසක් මාර්ගයෙන් පැවරුවා. එය පුද්ගලික අයිතියක් නොවෙයි. පැවරුණේ පාලන බලයයි. ඒ අන්දමට විමලධර්ම සූරිය රජතුමාට යම්කිසි පුද්ගලයකු විසින් සුදු ගෝනෙකු පරිත්‍යාග කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කොළොන්නා කෝරළයේ පාලන බලය ඒ පුද්ගලයාට සන්නසක් මාර්ගයෙන් පැවරුවා. එමෙන්ම රත්නපුර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිස්ත්‍රික්කයේ තවත් ප්‍රදේශයක පුද්ගලයෙක් රාජාධිරාජසිංහ රජතුමාට පොර කුකුළකු තෑගි දීම නිසා කුකුළු කෝරළය ඒ පුද්ගලයාට පැවරුවා. එහෙත් කුකුළු කෝරළය හා කොළොන්නා කෝරළය අතර තිබෙන වෙනස මේකයි. කොළොන්නා කෝරළය පැවරුණේ අධිපතියකු නැති ප්‍රදේශයක අධිපතියකු ඇති කිරීමට වන අතර කුකුළු කෝරළයේ ඇති වුණේ ඒ ප්‍රදේශය පාලනය කළ නැනැත්තාගේ යම් කිසි දුර්වලකමක් නිසා ඒ පළාතේ පාලන භාරය වෙනත් පවුලකට පැවරීමයි. මේ අන්දමට ක්‍රම දෙකක නින්දගම් සිංහල රජ කාලයේ ඇති වූ බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඊට අනතුරුව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් ලංකාව අත් කර ගත් පරමාර්ථය උඩ, එනම් ඔවුන්ට අවශ්‍ය වන වැවිලි භව බෝග ලංකාවේ ඇති කිරීමේ පරමාර්ථය උඩ, ලංකාව අත්පත් කර ගත් අවස්ථාවේදී කෘෂිකාර්මික දියුණුව සම්බන්ධව ලංකාවේ ඉඩම් ප්‍රතිපත්තියේ ඇති විශාල වරදක් ඔවුන්ට පෙනී ගියා. එනම් ඔප්පුවක් ගන්නට කෙනෙක් හිටියේ නැහැ. කිසිම අදිකාරම් කෙනෙකු ළඟ හෝ කිසිම අධිපතියකු ළඟ හෝ මට මෙන්න මේ දේපොළ අයිතියි මට මේවා විකුණන්නට පුළුවන් කියා පෙන්වන්නට යමක් තිබුණේ නැහැ. ඒ කාලයේ තිබුණු "බ්‍රිටිෂ් ඊස්ට් ඉන්ඩියා කොම්පැනි" කියන ලංකාව අල්ලා ගත් කොම්පැනියට හෝ වෙනත් කෘෂිකාර්මික කොම්පැනියකට හෝ ඉඩම් විකිණීමේ වරප්‍රසාදයක් හෝ පෞද්ගලික අයිතියක් කිසියම් රදළ කෙනෙකුට හෝ නිලධාරියෙකුට තිබුණේ නැහැ. ඒ නිසා එකල සිංහල රජ්ජුරුවන්ට පක්ෂපාතව සිටියාවූ හෝ සිංහල රජ්ජුරුවන්ට විරුද්ධව බ්‍රිතාන්‍යයන්ගේ පැත්ත ගත්තාවූ හෝ රදළයින් නොහොත් නිලධාරි පෙළැන්තිය සමග ලංකාවේ ඉඩම් සම්බන්ධව විශාල කුමන්ත්‍රණයක් කරන්නට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට සිදු වුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදු වුණේ කුමක්ද? සිංහල රජවරුන් විසින් පාලනය කිරීම සඳහා සන්නස්වලින් පැවරූ ඉඩම් පෞද්ගලික වශයෙන් රජ්ජුරුවන් පරිත්‍යාග කළ ඉඩම් හැටියට සැලකීම ඉංග්‍රීසි ආණ්ඩුව පිළිගත්තා. එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ නින්දගම් ඉඩම්වලින් භාගයක් තමන්ගේ නින්දගම් හැටියට තබා ගැනීමටත්, ඉතිරි භාගය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී වතු කොම්පැනිවලට බදු දීමටත්, ඒ ඉඩම් අයිතිකාරයන් හෙවත් නිලධාරි පෙළැන්තිය පොළඹවා ගත්තා. මෙයින් සිදු වුණේ මොකක්ද? ඉස්සර රජ කාලයේ යම්කිසි ඉඩමක පදිංචිවූවකුට, ඉඩම පාලනය කරන නැනැත්තාට හෝ ගම් ලද්දාට හෝ විරුද්ධව රජතුමාට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට පුළුවන් කමක් තිබුණා. එහෙත් මෙයින් පසු පාලකයාට හෝ අධිපතියාට හෝ විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ අයිතිය ඔහුට නැතිව ගියා. ඔහු පුද්ගලයකුගේ යටත් වැසියකු වුණා.

තවද, යම් අධිපතියකු පාලනය කළ ඉඩම් තවත් අධිපතියකුට මාරු වන අවස්ථාවලදීද බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් සහ ස්වදේශීය නිලධාරි පෙළැන්තිය අතර ඒවා බෙදා ගැනීමේ කුමන්ත්‍රණයක් ඇති වුණා. එහෙත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් මෙයින් සෑහීමට පත් වුණේ නැහැ. ඒ මන්ද? අයිතිකාරයන් නැති තවත් ඉඩම් රාශියක් ඉතුරු වුණා. ඉතුරු වුණා වූ ඒ ඉඩම් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට අවශ්‍ය වැවිලි කටයුතුවලට යෙදීමට යොදා ගන්නේ කෙසේද යන්න ගැන එකල සිටි සිංහල සහ දෙමළ අධිපතීන් අතරත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී කොම්පැනි අතරත් ඇති වූ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් අලුත් රදළ පෙළැන්තියක් බිහි කිරීමට බ්‍රිතාන්‍ය අධිරාජවාදීන්ට සිදු වුණා. සිංහල රජවරුන් සහ ද්‍රවිඩ රජවරුන් විසින් බිහි කරන ලද රදල පෙළැන්තියට අමතරව තවත් රදල පෙළැන්තියක් ඇති වුණේ ඉන් පසුවයි. ඒ අය "ඩොයිලිගෙ රදල යන්" යනුවෙන් හැඳින් වෙනවා. ඩොයිලි නමැත්තා යම් යම් ප්‍රදේශ යම් යම් පුද්ගලයන්ට පවරා ඔවුන් රදලයන් හැටියට පත් කළා. එසේ පවරන ලද ඒ ඉඩම්වලින් කොටසක් නැවතත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී කොම්පැනිවලට පවරා ඉතුරු කොටස ඒ අධිපතියන්ගේ පෞද්ගලික පාලනය යට තට ගත්තා. ඉඩකඩම් නැතිව තමන්ගේ ගෙවතුවල තිබුණු පුවක් අරඹවලට යන්න සිදු වුණු ගොවීන්ගේ ඉඩම්ද අක්කරයට ශත 50 බැගින් බද්දක් ගෙවමින් ඒ අධිරාජ්‍යවාදී කොම්පැනිවලට පාවා දීමට මේ අධිපතියන් සහ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. විජේසුන්දර මයා.]

කුමන්ත්‍රණය කොට ඒවාත් පවරා දුන්නා. තවද, නින්දගම් යටතේ තිබුණු විශාල ඉඩම් රාශියක් වෙනත් පුද්ගලයන් විසින් වතු කොම්පැනිවලට විකුණා තිබෙනවා. ඒ වායේ පදිංචිව සිටි අය වලුන් නොවෙයි, ඒවා විකුණා **තිබෙන්නේ**. ඒ වාගේම වතු කොම්පැනිකාරයන් විසින් මේ නින්දගම් රාශියක ඉඩම් අයිති කරගෙන සිටිනවා. මේ නිසා මේ ඉඩම්වල තත්ත්වය පිරිසිදු වන අන්දමට රජය නැවතත් මේවා පවරාගෙන රජය මගින් මේවා බෙදා දීමේ ක්‍රමයක් ඇති කිරීමේ අවශ්‍යතාව ඉතාමත්ම විශාලයි.

අද නින්දගම් පනතක් ඉදිරිපත් කොට තිබුණාට ඒ පනතෙන් මෙම ඉඩම්වල තිබෙන ප්‍රශ්න සම්පූර්ණයෙන් විසදෙන්නේ නැහැ. එසේ හෙයින් මෙම නින්දගම් ප්‍රශ්නය සම්බන්ධයෙන් විශාල සමාලෝචනයක් ඇති කොට, මේවායේ අයිතිය සම්බන්ධ හොඳ වග විභාගයක් කොට අන්තිමේදී මෙම සියලුම ඉඩම් රටවැසියාට අයිති බවට තීන්දුවකට බසින්නට අපට සිදු වී තිබෙනවා. මේ රටේ ඉඩම් ප්‍රතිපත්තිය සකස් කරන විට රටවැසියාගේ අවශ්‍යවුවමනාවන් පිළිබඳව කල්පනා කර බැලිය යුතුයි. රටවැසියාගේ අවශ්‍යතා උඩ ඉඩම් ප්‍රතිපත්තියක් සකස් කළ යුතුය යන නිගමනයට බසින තත්ත්වයකට අද අප අවුත් තිබෙනවා. ඒ විධියේ ප්‍රගතිශීලි කල්පනාවක් ඇතිව මේ නින්දගම් පනත ඉදිරිපත් කළා නම් මීට වඩා විශාල සහනයක් මේ පනතෙන් සැලසෙන්නට ඉඩ තිබුණා.

මෙම නින්දගම්, වතු කොම්පැනිකාරයන්ට බදු දීම නිසා වී ගොවිතැනට විශාල වශයෙන් පාඩු සිදු වන්නට පටන් ගත්තා. සුදු අධිරාජ්‍ය වාදීනුත් ස්වදේශික නිළධාරි පැළැන්තියත් මෙම ඉඩම් බදු දෙන විට හෝ බදු ගන්න විට හෝ වී ගොවිතැන ගැන කිසිම සැළකිල්ලක් දැක්වුවේ නැහැ. ඔවුන් කඳු මුඳුන් සම්පූර්ණයෙන්ම එළි කිරීම නිසා ගංගා ගොඩ වීමෙන් වී ගොවිතැනට විශාල වශයෙන් හානි සිදු වුණු බව තමුන්නාන්සේ දන්නවා. එම නිසා මේ රටේ ඉඩම් ප්‍රතිපත්තිය සකස් කරන විට නින්දගම් ඉඩම් පිළිබඳ නියම තත්ත්වය අවබෝධ කරගෙන ක්‍රියා කළහොත් පමණයි මෙම පණතින් රට[illegible]

යක් සලසන්නට පුළුවන් වන්නේ. ඒ නිසා, මේ **පණත, යම්** යම් කොටස් සන්තෝෂ කිරීමට හෝ සැනසීමට හෝ නොව, සෑම දුප්පත් රටවැසියකුටම ඔවුන්ගේ ඉඩම් ප්‍රශ්න සාර්ථක ලෙස නිරාකරණය කර ගැනීමට පුළුවන් වන අන්දමට ක්‍රියාත්මක කළහොත් පමණක් ඉමය නියම නින්දගම් පණතක් වෙනවා ඇති.

නින්දගම් ඉඩම් පිළිබඳව කථා කිරීමේ දී අප විසින් සලකා බැලිය යුතු තවත් වැදගත් කරුණක් තිබෙනවා. සමහර නින්දගම් හිමියන්ගෙන් නම් ඒවායෙහි පදිංචි අයට එතරම් පීඩාවක් සිදු වන්නේ නැහැ. එහෙත් ඇතැම් නින්දගම් හිමියන්ගෙන් පදිංචි කාරයන්ට විශාල වශයෙන් හිරිහැර වන බව අප දන්නවා. කොළොන්නා කෝරළයේ නින්දගම් හිමියන්ගෙන් එම නින්දගම්වල පදිංචි අයට සිදුවන හිරිහැර ගැන කොළොන්නේ ගරු මන්ත්‍රීතුමා (නන්ද මැතිව් මයා.) මෙම ගරු සභාවෙහිදී පවා උද්ඝෝෂණය කළ බව අපට මතකයි. එම නිසා මේ පණත කාරක සභා අවස්ථාවේදී සලකා බලා හෝ නැවත සංශෝධනය කර හෝ, මේ රටේ ඉඩම් නැති දුප්පත් ජනතාවට ප්‍රයෝජනයක් වන අන්දමටත් ඉඩම් ප්‍රතිපත්තිය නිසි විධියට ක්‍රියාත්මක වන අන්දමටත් සකස් කරනවා ඇත යන බලාපොරොත්තුවෙන් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 5.17

**රාජා වෙලේගම මයා.** (මොනරාගල)
(திரு. ராஜா வெலேமக—மொனருகலே)
(Mr. Raja Welegama—Monaragala)

නින්දගම් ඉඩම් පිළිබඳ පණත විවාදයට භාජන වී තිබෙන මේ අවස්ථාවේදී නින්දගම් ඉඩම් විශාල සංඛ්‍යාවක් තිබෙන ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් මගේ අදහස් ප්‍රකාශ කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

මේ පණත මේ ගරු සභාවට හඳුන්වා දුන් අවස්ථාවේදී ගරු ඉඩම් ඇමතිතුමා නින්දගම් ඇති වීමට හේතු වුණු කරුණු රාශියක් ඉදිරිපත් කළා. ඒවාගේම මේ [illegible] සහභාගි වුණු ගරු මන්ත්‍රීවරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නුත් නින්දගම් ඉඩම් පිළිබඳ ඉතිහාසය විස්තර වශයෙන් ඉදිරිපත් කළා. මා බලා පොරොත්තු වන්නේ මා නියෝජනය කරන මොණරාගල ප්‍රදේශයේ නින්දගම් ඉඩම් පිළිබඳ කරුණු කිපයක් ප්‍රකාශ කිරීමටයි.

මොණරාගල ප්‍රදේශයේ නින්දගම් ලැබී තිබෙන්නේ, එදා ජාතියට හතුරුව ප්‍රතිගාමීව කටයුතු කළ අධිරාජ්‍යවාදී රදළ පිරිසට බව මා පළමුවෙන්ම කියන්නට ඕනෑ. 1815 දී ඉංග්‍රීසින් ලංකාව යටත් කර ගත් පසු ඔවුන්ට විරුද්ධව කැරලි පැන නැගුණේ මොණරාගල ප්‍රදේශයෙනුයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

1820 දී දී තිබෙන නින්දගම් ගැන තමුන්නාන්සේ කරුණු දන්නවාද ?

**රාජා වෙලේගම මයා.**
*(திரு. ராஜா வெலேகம)*
(Mr. Raja Welegama)

නින්දගම් ප්‍රශ්නය මගේ ප්‍රදේශයේ බලපාන ආකාරය ගැනයි මා කථා කරන්නේ. 1818 මහා කැරැල්ලට සහභාගි වුණු දේශ ප්‍රේමි ජාතිමාමක ජනතාවගේ ඉඩම් නින්දගම් වශයෙන් ලබා ගත්, අධිරාජ්‍යවාදීන්ට පන්දම් ඇල්లු රදළ පිරිස්වල අයමයි අදත් ඒවා පාලනය කරන්නේ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කවුද ඒ රදළ ඉඩම් හිමියෝ ?

**රාජා වෙලේගම මයා.**
*(திரு. ராஜா வெலேகம)*
(Mr. Raja Welegama)

ඒ අය, නම් වශයෙන් කියන්නට මා කැමැති නැහැ. එදා අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව සටන් කළ අපේ මුතුන්මිත්තන්වත් ඔවුන්ගෙන් පැවැත එන අයටත් මෙහි දී උපහාරයක් දක්වා මගේ කථාව හමාර කිරීමටයි මා අදහස් කරන්නේ.

මොණරාගල ප්‍රදේශය විශාල වශයෙන් ඉඩම් තිබෙන ප්‍රදේශයක් වන නමුත්, යෙදී තිබෙන නොයෙක් අවහිරකම් නිසා ඒ ප්‍රදේශයේ ජනතාවට එම ඉඩම් ලබා ගන්නට බැරි තත්ත්වයක් පවතිනවා. ජල පහසුකම්නුත් සරුසාර පසිනුත් යුත් ඒ ඉඩම් නොයෙක් ආකාරයෙන් බෙදී ගොස් තිබෙනවා. එයින් වැඩි කොට සක් නින්දගම් වශයෙන් පවතිනවා. එවැනිම විශාල කොටසක් අක්කර දහස් ගණනක් දේවාලගම් වශයෙන් පවතිනවා. තවත් කොටස් රජයට අයිති ඉඩම් වශයෙන් වෙන් වී තිබෙනවා. රජයට අයිති ඉඩම්, රජයේ වර්තමාන ප්‍රතිපත්තිය අනුව, අලුත් නින්දගම් ඇති වන අන්දමට බෙදා දී තිබෙන බව ඊයේත් පෙරේයිදාත් ඇති වුණු විවාදයේදී අපට පැහැදිලි වුණු බව කණගාටුවෙන් සඳහන් කරන්නට ඕනෑ. එම නිසා මොන තරම් අඩුපාඩු තිබුණත් අල්ප මාත්‍ර වශයෙන් හෝ ජනතාවට යම්කිසි සහනයක් ලැබේවිය යන බලාපොරොත්තුවෙන් මා මේ පනත් කෙටුම් පතට සහයෝගය දෙන්නට කැමති බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මේ පනත් කෙටුම්පතේ තිබෙන අඩුපාඩු කම් මට ප්‍රථමයෙන් කථා කළ ගරු මන්ත්‍රීවරුන් කිප දෙනෙකුම පෙන්වා දෙන්නට යෙදුණා. එමනිසා මේ අවස්ථාවේ දී එක්තරා විශේෂ කාරණයක් ගැන පමණයි මා ඉඩම් ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නෙ. මේ නින්දගම් පනත් කෙටුම් පත ඉදිරිපත් කරන්නට හේතුව කුමක්ද කියා මට කලින් කථා කළ බලන්ගොඩ මන්ත්‍රීතුමිය (රත්වත්තේ මිය.) විස්තර කරන්නට යෙදුණා. ඒ කෙසේ වෙතත් මේ පනත් කෙටුම්පතේ ඉතිහාසය ගැන කල්පනා කර බලන විට අපට පෙනී යන කාරණයක් තිබෙනවා. 1965 දී මේ ආණ්ඩුවේ පළමුවන රාජාසන කථාවෙන් නින්දගම් ඉඩම් පිළිබඳව පනතක් ගෙනැවිත් නින්දගම් ඉඩම් රජය සතු කරනවාය කියා ප්‍රකාශයක් කළා. ඉන්පසු මේ ගරු සභාවට නින්දගම් ඉඩම් පනත් කෙටුම්පත ඉදිරිපත් කළත් අවුරුදු ගණනක් ගත වන තෙක් එය සාකච්ඡාවට ගන්නට නොහැකි වුණා. එම පනත් කෙටුම්පත පිළිබඳව ආණ්ඩුව මන්දෝත්සාහී ගතියක් දක්වී මේ ප්‍රතිඵලයක් වශයෙන් අපේ ප්‍රදේශවල


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

නින්දගම් ඉඩම්වලට සිදුවී තිබෙන දෙය මා මේ ගරු සභාවට ප්‍රකාශ කරන්නට අදහස් කරනවා. පළමුවන රාජාසන කථාවෙන් නින්දගම් ඉඩම් පිළිබඳව එම ප්‍රකාශය කළාට පසු නින්දගම් ඉඩම් හිමියන් ලඟිලඟියේ ඒ නින්දගම් ඉඩම් වෙනත් අයට පැවරීමටත් විකිණීමටත් කටයුතු කළ බව මා මේ ගරු සභාවට දන්වන්නට සතුටුයි. ඒවාගේම මට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් පෙන්වා දුන් විධියට අපේ ප්‍රදේශවල කිසිම අයිතිකරුවකු නොමැති නින්දගම් ඉඩම් තිබෙනවා. ඒ සමහර ඉඩම්වල මිනිසුන් බලහත්කාරයෙන් පදිංචි වී, වගා කරමින් අවුරුදු පහළොව, විස්ස, තිහ ඒවා භුක්ති විඳිමින් සිටිනවා. දැන් මේ පනත අනුව නියම වශයෙන් ඒ නින්දගම් ඉඩම් මැණ නිරවුල් කරදීමට පුළුවන්කම ලැබෙනවා. එම නිසා අද ඒ ප්‍රදේශවල නින්දගම් ඉඩම් අයිතිකරුවන් ව්‍යාපාරයක් ගෙන යනවා. අද ඒ ප්‍රදේශවල නින්දගම් ඉඩම් විශාල කැබලි වශයෙන් අක්කරය රුපියල් සියයට දෙසීයට විකුණනවා. තවත් සමහරු බොරු සන්නස් ඉදිරිපත් කරමින් නොයෙක් නොයෙක් ඉඩම්වලට අයිතිකම් කියමින් ඒවා විකිණීමට කටයුතු කරගෙන යනවා. මේ තත්ත්වය නිසා මා නියෝජනය කරන කොට්ඨාශයේ සමහර උදවියට දැන් මහ මඟට බසින්නට සිද්ධ වී තිබෙනවා. තවත් සමහරුන්ට උසාවි යන්නට, නඩු මාර්ගයට බසින්නට පවා සිද්ධ වී තිබෙනවා. එමනිසා මේ අවස්ථාවේදී ගරු ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මෙම පනත් කෙටුම්පත අද නැත්නම් වෙනත් දිනයක සම්මත වුණත් මේ පනත 1965 සිට, එනම් නින්දගම් ඉඩම් පිළිබඳව පළමුවන රාජාසන කථාවෙන් ප්‍රකාශයක් කළ දිනයේ සිට, බලපාන අයුරින් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුයි. එහෙම නැතිව මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ දිනයේ සිට නැත්නම් මේ පනත් කෙටුම්පත සම්මත වූ දිනයේ සිට ක්‍රියාත්මක වන විධියට මෙය සම්මත කළොත් සමහර විට අර මා කලින් සඳහන් කළ හේතූන් උඩ කරන ලද විකිණීම් නිසාත් වෙනත් දූෂණ ක්‍රියාවන් නිසාත් නොයෙකුත් කරදරවලට භාජන වූ ඒ දුක් විඳින ජනතාවට අසාධාරණයක් වෙනවා.

ඉඩම් ඇමතිතුමාගේ අවධානය යොමු කළයුතු තවත් කාරණයක් තිබෙනවා. විහාර දේවාලගම් නිසාත් අපේ ප්‍රදේශවාසීන්ට විශාල අවහිරයක් ඇතිවී තිබෙනවා. කොයි පැත්තෙන් බැලුවත් තිබෙන්නෙ විහාරගම් නැත්නම් දේවාලගම්. මා සිතන හැටියට ඒ ප්‍රදේශයේ රුහුණු මහ කතරගම දේවාලයට අයිති අක්කර 50,000ක් පමණ තිබෙනවා. ඒවා දේවාලගම් ඉඩම් වශයෙන් නීතිගතවී තිබුණත්, ඒවාගේම මහා භාරකාරතුමාගේ භාරකාරත්වය යටතේ තිබෙනවාය කියා සඳහන් වී තිබුණත් ඇත්ත වශයෙන්ම අද ඒ ඉඩම් කපුරාළලාගේ නැත්නම් දේවාලවල ලේකම්ලාගේ නැත්නම් විදානෙලාගේ නින්දගම් හැටියටයි තිබෙන්නෙ. ඒ අයට ඕනෑ හැටියට ඒ ඉඩම් බදු දෙනවා. ඒ අයට ඕනෑ හැටියට බදු අය කරනවා. ඒ අයට සිතුනු වේලාවට බදු කරුවන් අස් කරනවා. නැත්නම් නැවතත් පත් කරනවා. ඒ සම්බන්ධවත් යම්කිසි නීතියක් සම්පාදනය කරන මෙන් මා ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ ඉඩම් සම්බන්ධවත් නීතියක් පිළියෙල නොකර මේ නින්දගම් ඉඩම් ප්‍රශ්නය නිසා අද විපතට පත්ව සිටින ජනතාව සම්පූර්ණයෙන්ම මුදා ගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැති බව මා මතක් කරන්නට සතුටුයි.

ගරු කථානායකතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. අවසාන වශයෙන් මා තවත් කාරණයක් කියන්ට කැමතියි. මේ පනත නිසා නින්දගම් අහෝසි වෙයි කියා අපි යම් බලාපොරොත්තුවක් ඇති කර ගන්නව නම්, ඒ බලාපොරොත්තුව වඩා ශෝකජනක තත්ත්වයක් මේ විශේෂ බදු ඉඩම් ක්‍රමය නිසා ඇති වන බව ඊයේ පෙරේදා මේ ගරු සභාවේ පැවති විවාදයෙන් අපට පැහැදිලි වෙනව. විශේෂ බදු ක්‍රමය යටතේ දුන්න ඉඩම් පිළිබඳව කරුණු පැහැදිලි කරමින් ගරු ඉඩම් ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනව, මෙසේ බෙදා දුන්න ඉඩම් යළි ගන්ට බැහැ කියා. මේ ප්‍රකාශය "ලංකාදීප" පත්‍රයේ මුල් පිටුවේ ප්‍රධාන ප්‍රවෘත්තිය වශයෙන් පළ වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
කොහොමද ගන්නෙ?

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)
ඒ නිසා අපේ භයක් තිබෙනව, මේ පනත නිසා නින්දගම් නැති වුණත් විශේෂ බදු ක්‍රමය නිසා අළුත් ක්‍රමයේ නින්දගම් ක්‍රමයක් ඇති වෙයි කියා. අන තුරු ඇඟවීමක් වශයෙන් ගරු ඉඩම් ඇමතිතුමාට මා ඒ බව මතක් කරනව. අද මොනරාගල ප්‍රදේශයේ ගිහින් බැලුවොත් පෙනී යනවා ඇති, "ඕස්ට්‍රේලියාන්ඩ්" "ඕක් ගෙලන්තය" "ජැපර්ජිලන්ඩ්" ජැපර්ජිගෙ ලන්තය ආදි වශයෙන් නොයෙක් විධියේ බෝඩ් ලෑලි ඉඩම් යයාවල සවි කර තිබෙන බව.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
වුවමනා නම් ඒ ඉඩම්, ඉඩම් අත් කර ගැනීමේ ආඥාපනත යටතේ රජයට අත් කර ගන්න පුළුවන්. එහෙම නැතුව හිතු වක්කාර විධියට ගන්ට බැහැ.

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
Mr. Raja Welegama)
තමුන්නාන්සේ ඒක කරයි කියා අපට අවංකව හිතන්ට බැහැ. තමුන්නාන්සේ ඊයෙ ඉදිරිපත් කළ අදහස අනුව මේ විශේෂ බදු ඉඩම් ලබාගත් පිරිස තුළ තිබුණු භය දුරුවෙලා ඒ ප්‍රදේශවල ජන තාවට තවත් හිරිහැර කරන්ට පටන් ගනියි කියා අපේ ලොකු භයක් තිබෙ නව.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
මම කිව්වෙ හිතුවක්කරා අත්දමට ගන්ට බැහැ කියායි.

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)
කවර රජයකට හෝ මේ ආණ්ඩු ක්‍රම පනත යටතේ නම් මේ ඉඩම් ආපසු ගන්ට බැරි බවයි කියා තිබෙන්නෙ. "මේ ආණ්ඩු ක්‍රම පනත යටතේ" කියා පැහැ දිලි වශයෙන් කියා තිබෙනව.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
මම කිව්වෙ හිතුවක්කාර අත්දමින් ගන්නට බැහැ කියායි. [බාධාකිරීමක්]

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)
එදා කිව්වෙ මේ ඉඩම් අවුරුදු 25 කට පවරා දුන්න බවයි. තමුන්නාන්සේලා මේ වැඩ පිළිවෙල අවංකව ක්‍රියාත්මක කරයි කියා මා විශ්වාස කරන්නෙ නැහැ. නින්දගම් පනත මේ ගරු සභාවට ඉදිරි පත් කරල මේ රටේ ජනතාවට මහ සෙතක් කළාය කියමින් මහ ලොකුවට කථා කළත් මේ විශේෂ බදු ක්‍රමය මගින් අළුත් විධියේ නින්දගම් ක්‍රමයක් තමුන් නාන්සේලා ඇති කර තිබෙනවාය කියන එකයි මගේ විශ්වාසය. ඒ නිසා ඒ පිළි බඳව මගේ කනගාටුව ප්‍රකාශ කරන අතර අඩුපාඩු රාශියක් ඇතිව වුණත් මේ ඉදිරිපත් කර තිබෙන නින්දගම් පනත යම්කිසි ප්‍රගතිශීලි පියවරක් වශයෙන් මා සලකන නිසා ඒ පිළිබඳව මගේ සතුට ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීවරුනි, අ. භා. 6.30 ට ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්ට අදහස් කරන නිසා ඊට පෙර අනිකුත් කථා අවසාන කරන ලෙස මතක් කරන්ට කැමතියි. අ. භා. 7 ට ඡන්දය විමසනව.

අ. භා. 5.28

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (අගලවත්ත)**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*
(Dr. Colvin R. de Silva—Agalawatta)

හොඳයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ සභාපති ධුරය දරන විට මට කථා කරන්ට ලැබුණු මේ මුල්ම අවස්ථාවේදී තමුන්නාන්සේට මගේ ප්‍රශංසාව පිරිනැමිය යුතුයි කියා මා විශ්වාස කරනව. ඒ නිසා මම එසේ කරන බව මතක් කරනව.

මේ නින්දගම් පනත නමින් හඳුන්වන නින්දගම් පිළිබඳ ව නොවන පනත ගැන වචන ස්වල්පයක් නොව ඊට වැඩි ප්‍රමාණයක් ප්‍රකාශ කිරීමේ අදහසින් මම මෙතැන දවස් තුනක් පමණ සිටි බව මතක් කරන්නට කැමතියි. මේ ප්‍රශ්නය විසඳීමට ප්‍රශ්නයේ ඉතිහාසය ගැනත් යම්කිසි දැනුමක් අවශ්‍ය වන බව කලින් ඇති වුණු නොයෙක් කථාවලින් මේ ගරු සභාවට පැහැදිලි වෙන්ට ඇති. ඉතාම වැදගත් දේපොළ ක්‍රමයේ පරිවර්තනයක් සිදු කිරීමට අවස්ථාව තිබෙද්දී ඉතා සුළු වශයෙන්, එක් කෙනෙකුට පහරක් එල්ල කිරීමේ අදහස ඇතිව සකස් කරන ලද මෙම යෝජනාව ක්‍රමානුකූලව රැවටිල්ලකට පරිවර්තනය කරමින් ඒ රැවටිල්ල අවසානය දක්වාම ගෙන යන්ට තැත් කරන බව මගේ කථාව අවසාන වෙන්ට ප්‍රථමයෙන් මම ඔප්පු කරන්ට උත්සාහ කරනව. ඊට ප්‍රථමයෙන් මෙම ඉඩම් ක්‍රමය ගැනත් ලංකාවේ තිබුණු පැරණි ඉඩම් ක්‍රමයේ මෑත ඉතිහාසය ගැනත් වචනයක් දෙකක් මෙහිදී සඳහන් කළොත් එය වරදක් නැතෙයි කියා මා විශ්වාස කරනවා. අද අප රදළ ක්‍රමයක් හැටියට භාවිත කරන ලංකාවේ මෙම ඉඩම් ක්‍රමය පිළිබඳව මුලින්ම ලෝකයාට වැදගත් වචනයක් කීවේ රොබට් නොක්ස් බවයි මා සිතන්නේ. "ලංකාවේ සියළුම ඉඩම්වල අයිතිකාරයා රජතුමාය ; යම් කෙනෙක් යම් ඉඩමක් භුක්ති විඳිනවා නම් ඔහු එය භුක්ති විඳින්නේ රජතුමාගෙන් යම්කිසි ලැබීමක් ඇති නිසාය ; එම ලැබීමට හේතුව ඔහු වෙතින් යම් කිසි රාජකාරියක් හෝ සේවාවක් රජතුමාට නැතිනම් රජතුමා විසින් පත් කරන ලද කෙනෙකුට ඉටු වන්නට තිබෙන නිසාය.'' යනාදී වශයෙන් සඳහන් කරනු ලැබූ වාක්‍ය තුන හතරක් තුළින් ලංකාවේ එදා පැවති ඉඩම් ක්‍රමයේ සම්පූර්ණ සාරාංශය රොබට් නොක්ස් විසින් ඉදිරිපත් කර තිබෙනවා.

මේ ඉඩම් ක්‍රමය නොයෙකුත් අන්දමට දියුණු වී එක එක විදියට අවුලට පත් වුණු බව අප දන්නවා. ඒකට නොයෙකුත් හේතුන් තිබුණා. එහෙත් ඒවා ඉතිහාසයේ පරීක්ෂණයට අයිති දේවල් හැටියට මා මෙහිදී සාකච්ඡා කරන්නට දැන් කල්පනා කරන්නේ නැහැ. එහෙත් යම් කිසි රටක් තුළ නීතියෙන් වේවා, දේපොල ක්‍රම පිළිබඳව යම් වචන විස්තරයක් භාවිතා කරනවාද, වෙනත් දේපොල ක්‍රම ගැන දැනීමක් ඇති අය ඒ වචනවලින් ම නොමග ගොස්, එම වචන පාවිච්චි කරමින් ම, අර තිබුණු දේපොළ ක්‍රම ක්‍රමානුකූලව නැති කර අළුත් විධියේ දේපොළ ක්‍රම බිහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීමේ තත්ත්වයක් ඇති කර තිබෙන බව අපට නොයෙකුත් රටවල ඉතිහාස යෙන් ඔප්පු වෙනවා. ලංකාවේ එය සිදු වුණා. එක අතකින් රොබට් නොක්ස් ඔය විස්තරය කළාට අනික් අතින් ඔහු විස්තර නොකළ දේවල් වගයක් ද තිබෙනවා. ඒ කාලයේ ලංකාවේ පැවති නීතිය කොහේවත් සම්පූර්ණයෙන් ලියා තිබුණේ නැහැ. ඒ පිළිබඳ චාරිත්‍රයයි තිබුණේ. ලංකාවේ නීතියට අයත්ව තිබුණා, නීතියේම තත්ත්වය දරණ අද අප ඉංග්‍රීසියෙන් භාවිතා කරන "කස්ටම්ස්" කියන දේ. ඒවා යම්කිසි චාරිත්‍ර පුරුදුයි.

උදාහරණයක් වශයෙන් මා එක්තරා කාරණයක් පෙන්වා දෙන්නට උත්සාහ කරන්නම්. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා, තමන් ක්‍රමානුකූලව එම තත්ත්වයට පත් කිරීමට ඉදිරිපත් වුණු පිළිමතලව්වේ වැනි රදළවරුන්ගෙන් ක්‍රමානුකූලව වෙන් වී ඔවුන්ට ඇති බලතලවලට විරුද්ධව වැඩ කළ හෙයින් ඔහුට වෙන රජවරුන්ට වඩා ජනප්‍රිය භාවයක් දරන්නට පුළුවන් වුණා. ඇත්ත කියනවා නම්, ඉංග්‍රීසි ඉතිහාස පොත් නිසා මෙච්චර බැණුම් අහන ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාට තමන් රජකම් කළ මැද කාලයේදී අපේ රටේ සිටි බොහොමයක් රජවරුන් නොදැරූ අන්දමේ ජනප්‍රිය භාවයක් දරන්නට හැකි වූ බව කියන්නට ඕනෑ. ඊට හේතුව, රදළ බලය සමග ගැටී රදළයන්ගේ අයිතිවාසිකම් සීමා කරන්නට පටන් ගැනීමයි. එහෙත් අන්තිමේදී එම රජතුමා එසේ ලැබූ ජනප්‍රිය භාවය ක්‍රමානුකූලව නැති කර ගැනීමට හේතුවුණු එක් ප්‍රධාන කාරණයක් තමයි, මේ චාරිත්‍රය කියන දේ නීතියට අදාල වන බව, නීතියට යොමු වන බව අමතක කිරීම. තවත් මෙන්න මේ විධියේ චාරිත්‍රයක් තිබුණා. එක්තරා දුර පළාතකින් එහා සිට රාජකාරිය පිණිස මහනුවරට කිසිම කෙනෙක් ගෙන්වන්නට බැහැ. නමුත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා සිය අවසාන කාලයේදී මහනුවර අලංකාර කිරීම සඳහා ප්‍රසිද්ධ අලුත් වැඩ ආරම්භ කළ අවස්ථාවේදී එම වැඩ කිරීම සඳහා නීත්‍යනුකූලව-චාරිත්‍රානුකූලව—වෙන්ව සිටි පිරිස ප්‍රමාණවත් නොවූ නිසා, ඔවුන් ලවා තමන්ට වුවමනා වූ වැඩ කොටස ඉෂ්ට කර ගැනීමට බැරි නිසා, දුර පළාත්වලින් රාජකාරිය පිණිස වැසියන් ගෙන්වා දීර්ඝ කාලවල් ඔවුන් නුවර නතර කර ගෙන සිටියා. ඒ හේතු කොට ගෙන ඒ රජතුමාගේ තිබුණ ජනප්‍රියභාවය එක්තරා ප්‍රමාණයකින් හීන වුණා. ඒ ගැන රටවැසියන්ට ඒ කාලයේදී කියන්න කෙනෙක් සිටියේ නැහැ. ඒ ඇයි? ඔවුන්ට යම්කිසි වරදක් කෙරෙනවා නම් ඒ ගැන පැමිණිලි කළත් එය අවසානයේදී මහ නඩුවට—ඒ කියන්නේ රජතුමාට—ඉදිරිපත් කරන්න ඕනෑ. රජතුමාම චාරිත්‍රය කඩ කරමින් නීතියට පයින් ගසමින් ක්‍රියා කරන විට එම වරද නැති කරන්නය, එම නඩුව විසඳන්නය, කියා ඒ රජතුමාගෙන්ම ඉල්ලා සිටීමෙන් වැඩක් නැති බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. නමුත් කිසි අනුමානයක් නැතිව නීතියේ තත්ත්වය දරණ ඒ චාරිත්‍රය කඩ කිරීම හේතු කොට ගෙන ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා තම ගෞරවයට ලොකු තුවාලයක් ඇති කර ගත්තා.

මේ නින්දගම් ක්‍රමය වේවා, රදළ ක්‍රමය වේවා, වැඩවසම් ක්‍රමය වේවා, නිල ක්‍රමය වේවා ඔය කොයි වචනය පාවිච්චි කරමින් අපි මේ ගැන කථා කළත්, පොතේ තිබෙන නීතියට අපේ කල්පනාව සීමා කර ගත්තොත් අපි අඥනයි. මෙහි තව පැත්තක් තිබෙනවා. නින්දගම් අයිතිකාරයා රදළයා නැත්නම් බණ්ඩාරයි. ඔහුට නමින් කොයි තරම් බලය තිබුණත්, චාරිත්‍රය අනුව ඔහුට කරන්න බැරි දේවල් ගොඩක් තිබුණා. ඉංග්‍රීසිකාරයින් ලංකාවට පැමිණි විට ඕවා ගැන සොයන්න ගියේ කාගෙන්ද? සර් ජෝන් ඩොයිලි කියා කෙනෙක් හිටියා. ඔහු විසින් ලියන ලද කුඩා පොතක් තිබුණා. එම පොතෙන් තමයි ඉංග්‍රීසිකාරයිනුත් එදා සිටි ඉතිහාසකාරයිනුත් යන හැමෝම මෙවැනි කරුණු ගැන සොයා ගත්තෙ.

සර් ජෝන් ඩොයිලි ගැන මා මිනිත්තු දෙකකින් පමණ සුළු විස්තරයක් කරන්න ඕනෑ. ඔහු ලංකාවට ආවේ ඉංග්‍රීසි ආණ්ඩුවේ නිලධාරියෙක් වශයෙන් එංගලන්තයෙනුයි. මේ සර් ජෝන් ඩොයිලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

මහතාට මේ රට ගැන විශාල ආලයක් ඇති වීම නිසා රටේ ප්‍රධාන භාෂාව වන සිංහල භාෂාව ඉගෙන ගෙන එහි දක්ෂයෙක් වුණා. මේ රටේ ප්‍රධාන ආගම වන බුද්ධාගම ඉගෙන ගත්තා. ඇත්තටම ඔහුගේ මිත්‍රයන්ට යම්කිසි සැකයක් තිබුණා, ඔහුගේ අන්තිම වයස් කාලයේදී ඔහු බුද්ධාගම්කාරයෙක් වී සිටියාද නැද්ද කියාත්. ඒ ඩොයිලිට වුණත්, මේ රටේ පැරණි සිංහල නීති රීති ගැන, උඩ රට නීති රීති ගැන, චාරිත්‍ර වාරිත්‍ර ගැන සොයන්නට යන්න සිද්ධ වුණේ කවුරුන් ළඟ වද? රදළවරුන් ළඟටමයි. පහත රට සියලු දේම සොයා ගත්තේ කාගෙන්ද? මුදලිවරුන්ගෙන්මයි. නියෝජ්‍ය සභාපතිතුමනි, තමන්ගේ වාසියට උපදෙස් නොදෙන, තමන්ගේ වාසියට නීතිය හැඩගස්වා ගන්නට උත්සාහ නොකරන කිසිම පංක්තියක් හෝ සමාජ තීරුවක් අද වන තුරු ඉපදුණේ නැහැ. ඒ අනුව දෙපැත්තකට තිබුණ පැරණි අන්‍යොන්‍ය යුතුකම් වලින් එක පැත්තක් පමණක් පවතින විධියට ඉංගිරිසි ආණ්ඩුව යටතේ මේ නින්දගම් සහ රදළ දේපොළ පිළිබඳ නීති රීති සකස් කර ගැනීමට ඔවුන්ට පුළුවන් වුණා. මේක කොතැනින්ද අවසන් වුණේ?

සමාවෙන්න, නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවටත්, ඉන්දියාවටත් ඇත්තටම කියනවා නම් මුළු ආසියාවටත් වැදගත් වන එක් වචනයක් තමයි අප නිතර නිතර පාවිච්චි කරන "ගම" කියන වචනය. අප ගම්වාසීන් ගැන, ගැමියන් ගැන කථා කරනවා. "ගම" කියන වචනය ගැන අපි ටිකක් කල්පනා කර බැලුවොත් මේ ප්‍රශ්නයට එය යොමු වන ආකාරයට අපට අවබෝධ කරගත හැකියි. තවද මේ ක්‍රමයට ඉංගිරිසි ආණ්ඩුව යටතේ ඇති වුණ ඉතිහාසය සහ හානිය තෝරාගත හැකියි.

"ගම" කියන එක සෑදී තිබෙන්නේ කොටස් 4 කින් යුක්තවයි. ගම කියා අප භාවිතා කරන ප්‍රදේශය මධ්‍යයේ තිබුණා ගම්වාසීන්ගේ නිවාස. ඒ නිවාස වටා තිබුණා, ගම්වාසීන් විසින් නොයෙක් පොදු ක්‍රම අනුව වැඩ කරන්නා වූ ගොවිපළවල්. ඒ ගොවිපළවල් වටා තිබුණා, අප දැනට සාමාන්‍යයෙන් පාවිච්චි කරන වචනයකින් හැඳින්වෙන දෙයක්. එනම් තණබිම්. ඒ ගම්වාසීන්ගෙන් ඕනෑම කෙනකුට සිය ගවයන් ඒ තණබිමට යැවීමට අයිතියක් තිබුණා. ඒ ගවයන් බලා ගැනීමට ඒ වෙනුවෙන් වෙනම පත් කළ උදවිය සිටියා. ඉන් ඔබ්බෙහි 4 වෙනුවට තිබුණේ කැලෑවයි. ඒ කැලෑව පිළිබඳව අයිතිවාසිකම සියලුම ගම්වාසීන්ට තිබුණ බවත් මා මතක් කළ යුතුයි. තමන්ගේ ගමට අවශ්‍ය වැඩවලට, තමන්ගේ ගෙවල් දොරවල් සෑදීමේ වැඩවලට, තමන්ගේ කුඹුරුවලට වැටකඩුලු බැඳීමේ වැඩවලට ලී දඬු එම කැලෑවෙන් කපා ගැනීමට ගම්මුන්ට සම්පූර්ණ අයිතිවාසිකම් තිබුණා. මේ විධියේ ක්‍රමයක් පැවති රටකට ඉංගිරිසිකාරයා පැමිණුනා. එසේ පැමිණුනේ බොහෝ කාලයක් තිස්සේ එංගලන්තයේ පැවති ආර්ථික දේපොළ ක්‍රමය හිතේ තියාගෙනයි. මෙන්න නොක්ස් කියනවා, මෙන්න ඩොයිලි කියනවා, මෙන්න නොයෙක් අය කියනවා, මෙන්න සියලුම ආණ්ඩුවේ ඒජන්තවරුන් ලියා එවනවා, ලංකාවේ තිබෙන සියලුම බිම් අයිති රජ්ජුරුවන්ටය කියා. එතකොට ඉංගිරිසිකාරයා රට අල්ලා ගත්තාට පස්සේ එදා සිටි රජ්ජුරුවන් වෙනුවට ඉංගිරිසි රජතුමා මේ රටේත් රජ හැටියට පිළිගෙන පැරණි වචනයට අලුත් අදහසක් ගැබ් කර ඊ ළඟට කියා සිටියා, මේ ලංකාවේ බිම් අයිති එංගලන්තයේ රජතුමාටයි කියා. කොහොමද අයිති වුණේ? මතක තබාගන්න නියෝජ්‍ය සභාපතිතුමනි, රදළ ක්‍රමය යටතේ, ලෝක ඉතිහාසයේ "පියුඩල්" නමින් යන ක්‍රමය යටතේ, කිසිම කෙනකුට පුළුවන් කමක් හෝ ශක්තියක් තිබුණේ නැහැ, මේ ඉඩම මගේය නුඹේ නොවේය කියා කියන්න. රදළ ක්‍රමයේ අන්‍යොන්‍ය සම්බන්ධකම තිබුණේ ඉඩම මාර්ගයෙනුයි. මේ විධියට "අයිතිකාරයා" කියන වචනයට අලුත් අදහසක් ගැබ් කර ඉංගිරිසිකාරයෝ කිව්වා ඉඩම රජතුමාගේය කියා.

ඊළඟට තමයි මුඩුබිම් පනතක් ගෙනාවේ. මහ රජතුමාගෙන් ලත් සන්නසකින් හෝ කාගෙන් හෝ ලැබූ ගම් පත්‍රයකින් හෝ ඔප්පුවකින් හෝ වෙනත් අන්දමේ යම්කිසි මාර්ගයකින් හෝ අයිතියක් පෙන්වන්න බැරි ලංකාවෙ තිබෙන සෑම බිම් කොටසක්ම ආණ්ඩුවට අයිතිය යන නීතියක් සකස් කෙරෙව්වා. ඔන්න ඔය නීතිය උඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමයි ලංකාවෙ එතෙක් පැවති ඉඩම් ක්‍රමය නැති බංග කිරීම මුලින්ම ආරම්භ කළේ. ඔය මාර්ගයෙන් සහ ඔය නීති ස්වරූපයෙන් තමයි ධනේශ්වර දේපොළ ක්‍රමය ලංකාවට ප්‍රධාන ලෙස ඇතුළු වූයේ. ඔය ආයුධය පාවිච්චි කරමින් තමයි උඩරට කැලෑ බිම්, හිස් බිම්, මුඩු බිම්, තණ බිම්, ගැමියන්ට අයත්ව තිබුණු බොහෝ ඉඩකඩම් ආණ්ඩුව අත්පත් කර ගත්තෙ. එසේ ලබාගෙන තුට්ටුවට දෙකට, සිලිමට දෙකට ස්වදේශික මෙන්ම විදේශික ධනපතීන්ට, අලුත් වතු කාරයින්ට වතු වැවීම පිණිස ඉඩම් බෙදා හැරියා. අද අප කථා කරනවා උඩ රට ගැන. ඇත්ත වශයෙන්ම උඩරට ඉඩම් ගසා කැවේ ඔන්න ඔය විධියටයි. එම ගසා කෑමට ඉඩ ලැබීම පමණයි, උඩරට ප්‍රදේශ මිලිටරි බලයෙන්, ඉංග්‍රීසි ආණ්ඩුව අල්ලා ගැනීමෙන් සිද්ධ වුණේ. මේ කාරණා අප මතක තබා ගත යුතුයි, මේ ප්‍රශ්නය ගැන කථා කරන විට.

ඊළඟට ප්‍රශ්නයේ තවත් පැත්තක් ගැන සලකා බලමු. රදළ බලය හේතුකොට ගෙන, රදළ ක්‍රමය තුළ, රදළ කොටස්වලට දේපළ හිමි වීමෙන් විශාල ජනකායක් අතරේ විශාල බලයක් ලබාගැනීමට මෙම කොටස්වලට අවස්ථාවක් ලැබුණු බවත් මෙහිදී අමතක කරන්න නරකයි. අප, 1818 කැරල්ල ගැන කථා කරන්න බොහොම කැමතියි. ඇත්ත වශයෙන්ම මෙය බොහොම වැදගත් සිද්ධියක්. අපේ ඉතිහාසයේ රන් අකුරෙන් ලියවිය යුතු සිද්ධියක්. නමුත් ඒ සමගම අප මතක තබාගත යුතුයි එදා ඒ ජනකාය සමග නැගී සිටි, එහි නායකත්වය දැරූ සියලුම රදළවරුන් එසේ නැගී සිටියෙ, තමන් යටතේ සිටින ජනතාව ගසා කෑමට තමන්ට ඇති අයිතිය ආරක්ෂා කර ගන්න බව අමතක කළ යුතු නැහැ. හැම සිද්ධියේම දෙපැත්තක් තිබෙනවා. එමනිසා එම නැගීම නරකයයි මා කියනවා නොවෙයි. එම නැගිටීම, අපේ ඉතිහාසයෙන් අප ලැබූ විශාලම උරුමයක් හැටියට අප කවුරුත් පිළිගත යුතුයි. ඇත්ත එතැනයි.

ඊළඟට මෙරට පාලනය කළ ඉංග්‍රීසි ආණ්ඩුව තමන්ගෙ උසාවි ක්‍රම ලංකාවෙ ඇති කළා. ශ්‍රෙෂ්ඨාධිකරණය, දිස්ත්‍රික් උසාවි, රීක්වෙස්ට් උසාවි ආදිය ඇති කළා. මේවා මගින් අපේ රටේ පවත්වා ගෙන ආ දේපළ ක්‍රමය ගැන තීරණවලට පැමිණීමට සිද්ධ වුණා. එමගින් ඇති කරන තීන්දු, වැඩි වශයෙන්ම මා සඳහන් කළ ආකාරයට වැරදි අදහස් උඩ තීන්දු කර ඇති බවට දස විධියකින් ඔප්පු කළ හැකි වුණත් මේ ගරු සභාවෙ කාලය ඊට ගත කරන්න කැමති නැති නිසා මේ අවසථාවේ දී මා ඒ කාරණය සඳහන් කරන්න යන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීන් පසුව එංගලන්තයෙන් කොමිසමක් ආවා, කෝල්බෲක් කොමිසම යනුවෙන් හැඳින්වෙන. එසේ පැමිණි අවස්ථාවේදී, උඩ රටත්, පාත රටත් එකල පැවති එක්තරා ක්‍රමයක් ඔවුන්ට පෙනී ගියා. බලන්න පැරණි දේ වැරදි අන්දමට පාවිච්චි කරන හැටි. ඉස්සර කාලයේදී මේ රටේ සිටි රජවරුන්ට අයිතියක් තිබුණා, නොයෙකුත් ජනතා කොටස්වලට අයත් පුද්ගලයන් ලවා, අවුරුද්දකට සුමාන දෙකක් පමණ පාරවල් සෑදීම වැනි වැඩ ගන්න රාජකාරි වශයෙන්. ඉංග්‍රීසි ආණ්ඩුව සිය මුළු බලය යොදා, මේ රටේ අළුත් මාර්ග ක්‍රමයක් ඇති කිරීම සඳහා බොහොම ඉවසන්නට බැරි විධියට ඔය රාජකාරි ක්‍රමය පාවිච්චි කරන්නට පටන් ගත්තා. ඒ නිසා ඒක නවත්වන්නටය කියා ඒ කොමිෂන් සභාව රෙකමදාරු කළා. ඒ අනුව 1832 දී ඒ රාජකාරි ක්‍රමය අවලංගු කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රදළ ක්‍රමය යටතේ—වැඩවසම් ක්‍රමය යටතේ—තිබෙන පරවේණි පංගු, නිල පංගු, මාරුවෙන පංගු යන මේ සියල්ලක්ම යම්කිසි සේවයක් කිරීම සඳහා යම්කිසි කෙනකුගෙන්—ගම් ලද්දාගෙන්—වැඩ කරන්නට ලබා ගත් ඉඩම්. 1872 පමණ කාලයේදී ඒ ධනේශ්වර දේපළ ක්‍රමය තව දුරටත් සෑදීම සඳහා—මා එය වැරදිය කියනවා නොවෙයි—වැඩවසම් සේවා කාල ආඥා පනත නීති ගත කළා. මොකක්ද මේ පුද්ගලයන්ට එයින් දී තිබෙන බලය සහ අයිතිවාසිකම? වෙනත් කෙනකු යටතේ—ගම්ලද්දා යටතේ—සේවයක් කිරීම සඳහා—රාජකාරියක් කිරීම සඳහා—යම්කිසි පංගුවක් අත්පත් කරගෙන සිටින කෙනකුට, ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

සේවය වෙනුවට මුදලක් ගෙවන්නට බලය දීමයි එයින් සිදු වුණේ. එදා එසේ ගෙවූ මිනිසුන්ගේ පවුල් මගින් ඇති වූ පරම්පරා අද තිබෙනවා. එදා ඒ අය අවුරුද්දකට රුපියලක් දෙනවාය කිව්වා නම් අද දෙන්නේ මෑතදී වටිනාකම සියයට විස්සකින් අඩු කළ රුපියලක් බව මතක තබා ගන්නට ඕනෑ. එහෙම නැත්නම් නිකම්ම ඉන්නවා වගෙයි, අද ඒ අය ඉන්නේ. මේකයි, අප මතක තබා ගත යුතු ඉතිහාසය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැමෝටම එකක් මතක නැති වෙලා තිබෙනවා. රදළ දේපලක්‍රමය සිංහල පළාත්වලට පමණක් සීමා වූ දේපල ක්‍රමයක්ය කියා සිතාගෙනයි, හැමෝම කථා කළේ. දෙමළ පළාත්වලටත් මෙය අයිතියි. මේ ක්‍රමයම දෙමළ නම්වලින් ගිය බවත්, යන බවත් ආණ්ඩුවට අමතක වී තිබෙනවා. මා ඒ ගැන අමුතුවෙන් කථා කරන්නට යන්නෙ නැහැ. එහෙත් ඒක තිබෙන බව මතක් කරනවා. මේ අතරතුර මේ ඉඩම් ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමේ නොයෙකුත් උත්සාහයන් නොයෙක් වර අප රටේ ඇති වී තිබෙනවා. 1803-1804 කාලයේදී මේ රටට පැමිණි ෆ්‍රෙඩ්රික් නොර්ත් නමැති පළමු වැනි ඉංග්‍රීසි ආණ්ඩු කාරයා මේ රටේ පැවතුණු ඉඩම් ක්‍රමය විශාල ලෙස ප්‍රතිසංස්කරණය කිරීමට නීතිරීති සකස් කළා. ඒ ලිපි කියැවූ කෙනකු හැටියට මම කියන් නම්. 1804දී ඇති කළ නීතිය අනුව ඉඩම් නිරවුල් කිරීමට ඉදිරිපත් වූ ආණ්ඩුවට ලැබුණේ ඉඩම් නිරවුල් කිරීමක් නොව ඊට අවුරුදු 25කටත් පසුව පවා නින්දුවට ගෙන එන්නට බැරි වූ විශාල ඉඩම් නඩු සම්භාරයක්. මෑත කාලවලදී ඉඩම් ක්‍රමයෙහි ඉතිරි වූ පරණ රදල ක්‍රමවලින් පහතරට ප්‍රදේශවල තිබෙන අඳේ ක්‍රමය වැනි ක්‍රම ධනේශ්වර ක්‍රමයට හැඩ ගස්සන්නට පුළුවන් විධියට පෙරළන්නට නැත් කිරීමේ නීතිවලින් පවා සිද්ධවෙලා තිබෙන්නේ වගා කරන මිනිහාට ඉඩම් ලැබෙනවාට වඩා උසාවිවල නඩු වැඩිවීමයි. මම එක්තරා කාරණයක් ගැන පමණක් කියන් නම්. අගලවත්තේ කෙනෙක් පහළින්ම පටන් අරන් අඩියෙන් අඩියට ගිහිල්ලා ගොවි කාරක සභාවෙන් නඩු කියලා, එතැනින් කොමසාරිස්තුමාට අපෑල් අරන් අයිතිය ඔප්පු කර, දැන් ඉතින් මම අයිති වී තිබෙන දෙය ගැන කොමසාරිස්වරයාට කියන්නට ඕනෑයයි ඔහු ළඟට ගිය විට ඔහුටත් මටත් කියනවා, "තමුන්නාන්සේ දන්නවා නොවැ. අපේ නීතියෙන් බලයක් දී නැති බව ඒ ඉඩමේ අයිතිය—භුක්තිය—දෙන්නට" යනුවෙන්. තමන්ගේ නඩු තීන්දුව අනුව භුක්තිය දීමට තරම් බලයක් නැති උසාවියක්, උසාවියක් නම් නොවෙයි, රූවටිල්ලක්. ඒවා ගැන නොවෙයි දැන් මා කථා කරන්නේ. ආරාවුල් නිරවුල් කරනවාට වඩා නඩු වැඩි වීමයි කෙරෙන්නේ. ඒවා කවදා ඉවර වේදෝයි මේ ලොවේ කිසිම කෙනෙක් දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කියන්නට යන දේ ගැන කමා කරන්න. මේ නීති පනත් කෙටුම්පත නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන්ද සම්මත කිරීමෙන් සහ අග්‍රාණ්ඩුකාරතුමාගේ අත්සන නැත්නම් අනුඥාව ලබා ගැනීමෙන් පසු ගැසට් පත්‍රවලින් ප්‍රකාශයට පත් කරනු ලැබීමත් සමගම මේ ආණ්ඩුව ඇත්තෙන්ම මෙය ක්‍රියාවේ යොදවන්නට බලාපොරොත්තුවක් ඇතිව සිටිනවා නම් මොකක්ද සිද්ධ වන්නේ ? මට ලැබී තිබෙන කාලය තුළ මම එය පෙන්වා දෙන්නම්. මට නොයෙක් දේවල් කියන්නට තිබෙනවා. එහෙම නොවෙයි නම් මේ ගැන මට තවත් හුඟක් දේවල් විස්තර කරන්නට ආශාවක් නම් තිබෙනවා. ඒ කොයි හැටි වෙතත් ඒ ආශාව නිසා ඒ වෙනුවෙන් කාලය ගත කරන්නේ නැහැ. මා ළඟ තිබෙන පනත් කෙටුම්පතේ මොකක්ද මේ සඳහන් කර තිබෙන්නේ ? සිංහලයෙන් කියනවා, "නින්දගම් පනත් කෙටුම්පත" කියලා. ඉංගිරිසියෙන් තිබෙන්නේ, "A Bill—Nindagama Lands" යන්නයි. නින්දගම් ගැන කථා කරන විට මොකක් ගැනද කථා කරන්නට තිබෙන්නේ ? නින්දගමක්ය කියන්නේ, කොයි විධියට කල්පනා කළත්, මෙයයි. ගම් ලද්දකු හැටියට බණ්ඩාර කෙනෙක් ඇති. එහෙම නැත්නම් වෙන කෙනෙක් ඇති. අනෙක් අතට ඔහු යටතේ ඉඩම්වල වැඩ කටයුතු කරන තවත් කොටසකුත් ඇති. නොයෙක් විධියේ කොටස් සඳහා නොයෙක් උදවිය ඇති. බණ්ඩාර ඉඩම්වල [illegible] ඉන්නවා මුත්තෙට්ටු වැඩ කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නටත්. නිසි කාලයේදී එක්තරා දවස් ගණනක් මුත්තෙට්ටුවේ වැඩ කරන්නට සමහර අය ඉන්නවා. ඒ කොයි ක්‍රමය අනුව වැඩ කරන්නට වුනත් ඒ නීතිය අනුව නම් සුමානයකට දවස් පහක් වැඩ කරන්නට ඕනෑ, මුත්තෙට්ටුවට. එතකොට තමන්ගේ නිල පංගුවට ඉතිරි වන්නේ සුමානයකට දවස් දෙකයි. අනෙක් අතට ඉස්සර කාලයේදී නම්, යුද්ධයක් ඇති වුණාම පංගුවකට ඒ ගම්ලද්දා සමග යුද පිටියටත් යන්නට ඕනෑ.

අ. භා. 6

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order please! Mr. Speaker will now take the Chair.

**අනතුරුව කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair and* MR. SPEAKER *took the Chair.*

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

කථානායකතුමනි, ඔය විධියට එක එක ඉඩම සඳහා ගම්ලද්දාට යම්කිසි වැඩවසම් සේවාවන් කිරීමට ඒ ඉඩම්වල වැඩ කළ අයට සිදු වී තිබුණා. අන්න එයයි. අන්‍යෝන්‍ය සම්බන්ධය. නින්දගම් ක්‍රමය නැති කරන්නට නම් දෙගොල්ලන්ටම ගහන්නට ඕනෑ. මේ නින්දගම් මැකෙන්නෙ, නිල පංගු, ප්‍රවේණි පංගු, මාරු වන පංගු මේ වැඩවසම් සේවාවලින් නිදහස් කරන අතරම බණ්ඩාර ඉඩම්, මුත්තෙට්ටු ඉඩම් කෙළින්ම රජයට ගැනී මෙන් පමණක්ය කියා මා කියනවා. ඊට මෙහා දේවල් කිරීමෙන් නම් නින්දගම් මැකෙන්නේ නැහැ.

එපමණක් නොවෙයි. නින්දගම් ක්‍රමය නැති කිරීමට ගෙනාවාය කියන මේ කෙටුම්පත් පනතේ "නින්දගම" හඳුන්වා තිබෙන්නේ කොහොමද? ඉංග්‍රීසි කාරයා අපේ පරණ දේපොළ නීතියේ වචනවලට වෙනස් අදහස් ගැබ් කළා වාගේ, මේ හත්හවුල් ආණ්ඩුව මොන හත් ඉලව්වක් කරලාද මා දන්නේ නැහැ, වචන විස්තර කිරීමේදී "නින්දගම" කියන වචනයට වෙනත් අදහසක් දී තිබෙනවා. එහි කියා තිබෙන්නේ මොකක් ද? "නින්දගම" නින්දගමක් නොවෙයිලු. "නින්දගම" කියන්නේ "නිල පංගුව" කියන කොටසලු. එහෙමත් කියා ඊට පසුව නැවත කියනවා, "නින්දගම් ක්‍රමය නැති කරනවාය" කියා. මෙයත් හරියට ලංකාවේ ඉඩම් ක්‍රමය ගැන කථා කරන විට "අප කථා කරන්නේ එක කොටසකට පමණක් අයත් ඉඩම්කැබලි ගැන පමණක්ය" කියා, "ලංකාවේ ඉඩම් ක්‍රමය නැති කරනවා" යනුවෙන් නැවතත් කීම වැනි දෙයක්. ඇත්ත වශයෙන්ම මෙය රැවටිල්ලක්. අනෙක් අයට මෙය තේරෙන්නේ නැත යන අදහසින් මේ රැවටිල්ලට, වැටෙන්න ඇති. එහෙත් නීතිය ගැන පළපුරුදුකම් ඇති අයට පමණක් නොව භාෂාව හොඳට තේරුම් ගන්නට පුළුවන් කෙනෙකුට වුණත් මේ රැවටිල්ල පැහැදිලිව පෙනෙනවා. ඒ ඇයි? මේ පනත් කෙටුම් පතේ කියා තිබෙන්නේ මෙහෙම නොවැ :

> "31 ..................'නින්දගම් ඉඩම්' යන්නෙන් මෙම පනත ආරම්භ වීමේ දිනයට පර; නින්දගම් ඉඩමක කැබෙල්ලක් හෝ ඉඩමක් සඳහා සහ එය දරන්නා විසින් සේවා කරන මෙන් ඉල්ලීමට හෝ ඒ සේවාවලට හිලව් වශයෙන් යම් මුදලක් ඔහු ගෙන් ඉල්ලීමට හා ලැබීමට එහි අයිතිකරු හිමිකම් ඇතිව සිටි නින්දගමක යම් ඉඩමක් හෝ එහි යම් කැබෙල්ලක් හෝ කොටසක් අදහස් වේ;"

නින්දගම් කියන්නේ නින්දගම් කොට සක්ලු. මේක රැවටීමක් : "නිල පංගු ක්‍රමය. වැඩවසම් සේවා සඳහා තිබෙන පංගු ක්‍රමය අප නැති කරනවා, එහෙත් නින්දගම් ඉඩම් අයිතිකරුවන්ගේ අනෙක් සියලු ඉඩම් හිමිකම් අප ආරක්ෂා කර දෙනවා" කියා නොකියන්නේ ඇයි? එය නොවෙයිද මේ පනත් කෙටුම්පතින් අදහස් කරන්නේ ?

මේ පනත් කෙටුම්පතේ ඇතුළත් වී තිබුණු "දරන්නා", "මාරු වන පංගු කාරයා" යන වචන වැදගත් විධියට වෙනස් කිරීම ගැන අපේ සතුට පළ කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නවා. එහෙත් විරුද්ධ පාර්ශ්වයේ අප හිතන දේ, කියන දේ එකක්වත් මේ පනතින් නම් ඉෂ්ට නොවන බව ඒ සමගම කියන්න කැමතියි. මේ පනත් කෙටුම්පත එලෙසින්ම සම්මත වුණොත් වන්නේ නඩු මගට බැසීම හැර වෙන මොකක්වත් නොවන බව මම පෙන්වන් නම්.

ඓතිහාසිකව දැන් ශත වර්ෂයක් මුළුල්ලේම මේ පංගුකාරයා තමාගේ පංගුව ධනේශ්වර ක්‍රමයේ නීතිරීති අනුව අනුන්ට දී තිබෙනවා. රදල ක්‍රමයට හා වැඩවසම් ක්‍රමයට ඉඩම් උගස් ක්‍රමයක් නැහැ. ධනේශ්වර ක්‍රමය විසින් දේපොළ පැත්තෙන් ඇති කළ ආයුධයක් තමයි, මේ ඉඩම් උගස් ක්‍රමය. එතකොට නිල පංගුවේ ඇති පරවෙන අයිතිවාසිකම ඒ නිල පංගුකාරයා විසින් කාට හෝ උගස් කළාම මෙතන අපට දකින්නට ලැබෙන්නේ එක්තරා සම්මිශ්‍රණයක්. ධනේශ්වර ක්‍රමය විසින් පැරණි රදල ක්‍රමයේ ඇති යම්කිසි දේපොළ ක්‍රම අල්ලා ගෙන කර කවා අර්ධ ධනේශ්වර දේපොළ ක්‍රමයක් වශයෙන් හැඩගැසුවා. මේ අනුව දැන් ශත වර්ෂයක් මුළුල්ලේ අපේ රටේ නිල පංගුකාරයෙකුට හෝ පරවෙනි පගුංකාර යෙකුට තමන්ගේ ඒ පංගුව අනුන්ට විකුණන්නට බලය තිබෙනවා. කීදෙනෙකු මගින් දැන් විකිණී ඉවරද කියා අපි දන්නේ නැහැ. අනුන්ට වැඩ කිරීමට බාර දෙන්න අයිතිය තිබෙනවා; බාර දීලත් තිබෙනවා. අද මේ නිලකාරයන් නමින් යන පංගුකාරයන් වැනි අය තමන්ගේ පංගුව අසලටවත් යන්නේ නැතිව ඒවා යේ වැඩ කරන අයගෙන් නොයෙක් වාසි ගන්නවා. ඉතින් නිල පංගුවේ නිදහස නිල පාංගුකාරයාට තිබෙනවාය කියා නීතියක් හැදු විට එතන නඩුවක් පමණක් නේද තිබෙන්නේ ? මේ නිල පංගුකාරයා කවුද කියා සොයන්නට උසාවියට යන්න ඕනෑ. අනුන්ට විකුණු අයිතිවාසිකම් මේකට ගැළපෙන්නේ කෙසේද කියා දන්න නීතිඥයෙක් මේ රටේ නැත කියා මා කියනවා. ඉතින් උසාවියට යන්න ඕනෑ.

කෙනෙක් ආරාවුල් ඉඩමක් විකුණන්නට පැමිණි විට අපි නිතරම කියනවා සල්ලිවලට නඩුවක් ගන්න කැමති නැතෙයි කියා. මෙන්න අපි දුප්පතුන්ට නඩු නැගි දෙන්න හදනවා. එසේ නම් මෙයින් ඉටු වන්නට යන්නේ කුමක්ද ? ඉටු කරන්න හදනවාය කියන්නේ මෙයයි මේ වැඩවසම් ක්‍රමය නැති කර ඒවාට යට වී සිටින අය පංගුවෙන් නිදහස් කර ඔවුන්ට ඒවා අයිති කරන ක්‍රමයක්ලු. එහෙත් අයිති කරන්නට යන්නේ අයිති විය යුතු අයට නොවෙයි. දෙන්නට යන්නේ ඒවා වැඩ කරන, එතන පදිංචි වී ඉදගන ඒවා වගා කරන අය නවත් පැහෙන ක්‍රමයකටයි. ඒ නිසා මා එකක් කියනවා. මේ නීතියට විරුද්ධ වන්නට මගේ කිසිම බලාපොරොත්තුවක් නැහැ. මේ උහුලන්නට බැරි ඉඩම් ක්‍රමය පිළිබඳව නමින්වත් ටිකක්වත් සහනයක් දෙන්නට ආණ්ඩුවක් ඉදිරිපත් වන්නට ලැහැස්ති නම් එය දෙන්න. එහෙත් මේ දීමනාවට අපේ වගකීමක් නැහැ. මා මේ සියලුදේම මනින්නෙ එක ප්‍රතිපත්තියකින් බව කියා මගේ පොරොන්දුව අනුව මගේ කථාව අවසාන කරන්න බලාපොරොත්තු වෙනවා. මේ ඉඩම් ප්‍රශ්නය ගැන අපේ විප්ලවකාරී ව්‍යාපාරයේ සටන් පාඨයක් ඉංගිරිසියෙන් ඉදිරිපත් කරනවා. ඉතිහාසයේ ඉඩම් පිළිබඳ සටන් ඔය පාඨය යටතේ ගෙන ගොස් තිබෙනවා. එය ඉංගිරිසියෙන් කියන්නේ මෙහෙමයි : “ Land to the tillers of the Soil.”

ඇත්තටම වගා කරන්නාට ඉඩම අයිති කිරීම අවශ්‍යයි. කවුරුන් යටතේ වගා කර නවාද, කාගේ අවසරයෙන් වගා කරනවාද යන මේවා සියල්ලම අමතක කොට උදැල්ල ගෙන පොළොව කොටා ගොවිතැන් කරන මිනිහා විසින් පොළවට ගසන උදලු පාරත් සමගම ඔහු ගොවිතැන් සඳහා යොදවා ගන්නා ඉඩම් ප්‍රමාණය ඔහුට අයිති විය යුතුය යන ප්‍රතිපත්තිය පිළිගන්නා අප පක්ෂය මෙම පනතෙන් මෙම ඉඩම් ප්‍රශ්නය නොවිසඳෙන බව විශ්වාස කරනවා. උදැල්ල ගෙන වැඩ කරන මිනිසාට ඉඩම් දෙනවා වෙනුවට අනුන්ගේ උදැල්ලෙන් රැකෙන අයට ඉඩම් අයිති කර දීම මෙම පනත සකස් කිරීමේ අදහසද යනු සොයන්නට මා උත්සාහ කරන්නේ නැහැ. එහෙත් එසේ සිදු වන බව පෙන්වීම මට ප්‍රමාණවත් වන බව මතක් කරමින් මා ගේ කථාව පටන් ගත් වචනයෙන්ම එය අවසාන කරන්නට අදහස් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ ආණ්ඩුව මෙළ නින්දගම් පනත සාදන්නට කල්පනා කෙළේ රදළ ක්‍රමය හෝ නින්දගම් ක්‍රමය හෝ වැඩවසම් ක්‍රමය හෝ යන මේ එකක්වත් මේ රටෙන් මකා දැමීමේ අදහසින් නොවෙයි. බලංගොඩ අතුරු මැතිවරණයේදී අපට පිළිතුරු සැප යීමට ඉඩක් නැති වන අවසාන මොහොතේදී "උඹලාට මෙන්න මේ ඉඩම්වලට ඔප්පු හම්බ වෙනවා" යයි කියමින් එහි ඡන්දදායකයන්ට අනියම් පගාවක් දීමේ මාර්ගයක් වශයෙන් මහවලතැන්න වලව්ව ගැන පමණක් කල්පනා කොට සකස් කරන ලද පනතක් හැටියට මේ පනත ගැන මුළු ලෝකයම දන්නවා. මේ තත්තව යෙන් මෙය සකස් කළ නිසයි, අද මේ ඵල විපාක ලැබී තිබෙන්නේ. එහෙත් මෙහිදී එකක් කියන්නට කැමතියි. තනි කාණුවේ තුවක්කුවකින් එක් කෙනකුට වෙඩි උණ්ඩයක් එල්ල කරන්නාක් මෙන් නොව මැෂින් තුවක්කුවක් එල්ල කරන විට "උඟට වෙඩි තබාපන්" කීවාම, මූටත් වදිනවා. ඒ වාගේ "මැතිනියට එල්ල කර පන්" කීවාම මඩුවන්වල මැතිනියටත් එල්ල වන බව පසුව මතක් වී තිබෙනවා. එසේ හෙයින් පසුගිය අවුරුදු දෙක හමාර මුළුල්ලේම මෙය පාර්ලිමේන්තුවට ඉදිරි පත් කරම්දෝ නොකරම්දෝ අත්හිටවම් දෝ යනුවෙන් කල්පනා කරමින් වැනි වැනි සිටි බව අප දන්නවා.

අලුතෙන් වාරිමාර්ග ඇති කරන්නට කලින් ඒ ඒ තැන්වල අලුතෙන් වාරිමාර්ග ඇති කරන බව සමහරුන්ට මුලින් දැන ගන්නට ලැබීමෙන් ඔවුන් ඒ අදාළ ප්‍රදේශ වලට ගොස් ගැමි ජනතාවගේ ඉඩම් තුට්ටු වට දෙකට නැත්නම් කරවලයාට මාරු කර ගන්නා බව මේ අතරතුර අප දන්නවා. ඒ විධියට එක් කොටසකට ඉඩම් ලබා ගන්නට ඉඩ සැලසූ අතර තවත් කොටසකට කීවේ මොකක්ද? "විකුණාපන් බං ඉඩම්, එකතු කරපන් බං සල්ලි, මේ නීතියේ විකිණීම ගැන සඳහන් වන්නේ නැහැ" යනුවෙන් කියමින් තවත් කොටසකට වෙනත් පැත්තකින් ඉඩ සලසා දුන්නා. ඉඩම් වික්කේ කාටදැයි සොයන්නට මා අදහස් කරන්නේ නැහැ. ඒ වාගේම කවුරුත් ඉඩම් නොමිලයෙ දුන්නාද නොදුන්නාදැයි සොයන්නටත් මා අදහස් කරන්නේ නැහැ. අප ඒවා සොයන්නේ මොකටද? අප දන්නේ මෙපමණයි කවුද හෝ මේ රටේ ඉඩම් ක්‍රමය ජනතාවට පිළිගන්නට පුළුවන් වන විධියේ ඉඩම් ක්‍රමයක් හැටියට සකස් කිරීමේ කටයුත්ත සිදු වන්නේ ජනතාව නැඟිට ඉඩම් අත්පත් කරගෙන, ඊට පසුව එදාට තිබෙන නීති සාදන ආයතන යට ඇඟිල්ල දිගු කොට "දැන් ඉතින් මේක නීතිගත කරන නීතියක් හදා පල්ලා" යනුවෙන් කියන දවසටයි. ඒ දිනය අපට දකින්නට ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Acting Leader of the Opposition will be winding up for the Opposition. The Hon. Minister of Communications also wants to speak. We have to divide the time available. So, kindly do not take too much time.

අ. භා. 6.15

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்லே)*
(The Hon. Hurulle)

මේ පනත පිළිබඳ විවාදයේදී කථාවක් කිරීමට මා බලාපොරොත්තු නොවූ නමුත් මේ සම්බන්ධයෙන් නොයෙක් අසත්‍ය ප්‍රකාශ කෙරී තිබෙන නිසා ඒවායේ සත්‍යය කුමක්ද යන වග ප්‍රකාශ කිරීම මගේ යුතුකමක්යයි මා කල්පනා කරනවා. පරම්පරාවෙන් මට ලැබුණු නින්දගම් මා විසින් අකුරණ මුස්ලිම් පිරිසකට විකුණුවාය යන ඉඟියක් වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) එතුමාගේ කථාවේදී කළා. මේ සභා ගර්භය තුළ එතුමා එදා ඒ විධියේ ප්‍රකාශයක් කළත්, දැනට සුමාන දෙකකට ප්‍රථම මගේ කොට්ඨාශයේ කහටගස්දිගිලියේ පැවැත්වුණු ප්‍රචාරක රැස්වීමේදී ඒ ප්‍රකාශය එතුමා කෙළේ නැහැ. එහිදී එතුමා කිව්වේ, හුරුල්ලේ ඇමතිතුමාගේ නින්දගම් ඉඩම් ටික ධනපතීන්ට විකුණූ බවයි. ඒ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව විශාල සංඛ්‍යාවක් සිටින නිසයි ඒතුමා ඒ රැස්වීමේදී, මෙහිදී කළ ප්‍රකාශයට වඩා වෙනස් ප්‍රකාශයක් කෙළේ. පරම්පරාවෙන් මට ලැබුණු එකම නින්දගමක්වත් එවැනි කෙනකුට නොවිකුණූ බව මා කියන්නට කැමතියි. එවැනි අය මගෙන් එම ඉඩම් විශාල ප්‍රමාණයකට ඉල්ලූ නමුත්, මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු හුරුල්ලේ]

යුතුකම් දන්න නිසා, එවායින් සමහර ඉඩම් පරම්පරාගතවම ඒවායෙහි පදිංචිව සිටින ජනතාවට නොමිලයේ දුන්නා. තවත් සමහර ඉඩම්, ඒවායේ වටිනා කමෙන් සියයෙන් කොටසකටත් වඩා අඩු මිලට ඔප්පු පිට දී තිබෙන බව මා කියන්නට කැමැතියි.

නින්දගම්වල ඉතිහාසය ගැනත් කරුණු ටිකක් මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. 1953 ඔක්තෝබර් මාසයේ 2 වැනිදා, එවකට තිබුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මෙම නින්දගම් ක්‍රමය අහෝසි කළ යුතුයයි කියා ඒ පිළිබඳව කරුණු සොයා බලා රජයට වාර්තා කිරීම පිණිස කොමිෂන් සභාවක් පත් කළා. එය, නින්දගම් තිබෙන ප්‍රදේශවලට ගොස් සාක්ෂි විමසා ඒහි වාර්තාව 1956 පෙබරවාරි මාසයේ 13 වැනිදා රජයට ඉදිරිපත් කළා. ඊට පසු, 1956 මහා මැතිවරණය ඇති වුණා. ඒ අවුරුද්දේ අප්‍රේල් මාසයේදී එවකට තිබුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඒ මහා මැතිවරණයෙන් පරාජයට පත් වුණා. එදා සිට, මේ රජයෙන් මේ නින්දගම් ඉඩම් පනත ඉදිරිපත් කරන තුරු අනෙක් කිසිම ආණ්ඩුවක් මේ කොමිෂන් සභාවේ නිර්දේශයන් ගැන කල්පනා කෙළේ නැහැ; එම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අදහස් කෙළේ නැහැ. අප මේ පනත ඉදිරිපත් කරන බව 1965 දී, අපේ පළමුවන රාජාසන කථාවේදීම ප්‍රකාශ කළා. අප මේ පනත ඉදිරිපත් කෙළේ බලංගොඩ අතුරු මැතිවරණය නිසායයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කිව්වා. එහෙත්, 1965 අපගේ පළමුවන රාජාසන කථාව කරන අවස්ථාවේදී බලංගොඩ ආසනය හිස් වී නොතිබුණු බව තමුන්නාන්සේ දන්නවා.

අපේ පරම්පරාවට නින්දගම් ලැබුණේ ඒ අය සිංහල රජදරුවන්ට පක්ෂපාතව ක්‍රියා කළ නිසයි. තවත් නින්දගම් කොටසක් තිබෙනවා. ඒ, සිංහල රජදරුවන්ට විරුද්ධව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට පක්ෂව කටයුතු කළ අයට ලැබුණු නින්දගම්. ඒ අයට ඉංග්‍රීසීන්ගෙන් නින්දගම් ලැබුණා. ඒ දෙවන නින්දගම්වල සිංහල රජ දරුවන් විසින් දුන් නින්දගම්වලට වඩා විශාල වෙනසක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, උතුරු මැද පළාතේත් ඒවාගේම වෙනත් ප්‍රදේශවලත්—සබරගමුවේ හැර—තිබෙන නින්දගම් විශාල ගණනක අද ඉතිරි වී තිබෙන්නේ කුඹුර සහ ගංගොඩ පමණයි. එනම් කුඹුර හා ගොඩ ඉඩම පමණයි. එදා අධිරාජ්‍යවාදීන් විසින් ක්‍රියාවේ යෙදවූ මුඩු බිම් පනත නිසා එවැනි ප්‍රදේශවල මහජනතාවට භුක්ති විඳින්නට තිබුණු හේන් යායවල් පවා රාජසන්තක වුණා. නමුත් සබරගමු ප්‍රදේශයේ ඉඩම් පිළිබඳව වෙන ආකාරයකට භුක්තිය තහවුරු කර දී තිබෙනවා. එසේ ඒ ඉඩම්වල භුක්තිය තහවුරු කර දී තිබෙන්නේ සිංහල රජ දරුවන් විසින් නොවෙයි, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසිනුයි. මේ ඉඩම් ලැබුණේ කෙසේද කියා මා පැහැදිලි කරන්නම්. ඒ පිරිසට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගෙන් නින්දගම් ලැබුණේ මේ නිසයි.

කැප්පෙටිපොළ වීරයාගේ කැරැල්ල ගැන තමුන්නාන්සේ දන්නවා. ඒ කැරැල්ල සාර්ථක වේ ගෙන යන අවස්ථාවේදී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට බලන්ගොඩ ප්‍රදේශය මැදින් දිව යන්නට සිද්ධ වුණා. ඒ අවස්ථාවේදී බ්‍රිතාන්‍ය යුද්ධ හමුදාවට මස් සපයන මුස්ලිම් ජාතිකයන්ට හරක් මස් සපයන්නට බැරි වුණා. හරක් මස් දුන්නේ නැහැ. මුස්ලිම් ජනතාවත් එදා ඒ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව සිංහල ජාතියට පක්ෂව එසේ කටයුතු කළා. නමුත් යම්කිසි පුද්ගලයකු සමග තවත් නායකයින් කීප දෙනෙකු එකතු වී ඒ කැරැල්ල අසාර්ථක කිරීම පිණිස කටයුතු කළා. එම නිසා ඔවුන්ට රත්නපුර දිස්ත්‍රික්කයෙන් විශාල නින්දගම් ප්‍රමාණයක් ලැබුණු බව මා මතක් කරන්නට සතුටුයි. ඒ සමගම තවත් කාරණයක් මතක් කළ යුතුව තිබෙනවා. මගේ බිරිඳගේ පරම්පරාවටත් ඌව ප්‍රදේශයෙන් නින්දගම් ඉඩම් ලැබී තිබුණා. කැප්පෙටිපොළ වීරයාගේ කැරැල්ලට පසුව ඒ පරම්පරාවේ සිටි සියළු දෙනාම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් සිරභාරයට ගෙන මොරිෂියස් දූපතට පිටුවහල් කළා. සිංහල රජදරුවන්ගෙන් ඒ පරම්පරාවේ අයට ලැබී තිබුණු නින්දගම් ඉඩම් සියල්ලම රාජසන්තක කළා. අන්න ඒ ආකාරයටයි අපේ පරම්පරාවල් කටයුතු කර තිබෙන්නෙ. නමුත් සිංහල ජාතියට ද්‍රෝහිකම් කළ පිරිසගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නින්දගම්වල අයිතිය පනතකිනුත් තහවුරු කර දී තිබෙනවා. ඒ පනත කුමක්ද කියා මා තමුන්නාන්සේට කියන්නම්. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී බලය තහවුරු කිරීමේ ඒ පනත නීති පොතේ 391 වන ඡේදයේ තිබෙනවා. ඒ පනතේ 22 වන කොටසේ මෙහෙම සඳහන් වෙනවා :

"22. All lands also now belonging to the following chiefs whose loyalty and adherence to the lawful Government merits favours, viz. :

Mollegodde Maha Nileme,
Mollegodde Nileme,
Ratwatte Nileme,
Kadoogamoone Nileme,
Dehigamme Nileme,
lately Dessave of Welasse,
Mulligamme Nileme.
Ekiniilegodde Nileme,
Mahawalatene Nileme, "—

ඒ නම අප හොඳින් මතක තබා ගත යුතුයි.

—" Doloswalle Nileme,
Eheyleyagodde Nileme,
Katugaha the elder,
Katugaha the younger,
Damboolane Nileme,
Godeagedera Nileme,
Gonegodde Nileme, formerly Adikaram of Bintenne,

shall be free of duty during their lives, and that their heirs shall enjoy the same free of duty, excepting with regard to such as paid pingo duty, which shall now and hereafter pay one-tenth to the Government of the annual produce, unless when exempted under the next clause.

23. All lands belonging to chiefs holding offices either of the superior or inferior class, and of inferior headmen, shall during the time they are in office be free of duty."

මේ ද්‍රෝහිකම් කළ පිරිසට ලැබුණු නින්දගම්වල අයිතිවාසිකම් හා ඒවායේ බුක්තිය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් නීතියෙන්ම ඔවුන්ට තහවුරු කර දී තිබෙනව. එහෙත් සිංහල ජාතියට පක්ෂපාතව කට යුතු කළ පිරිසගේ නින්දගම්වලින් කොට සක් රාජසන්තක කළා පමණක් නොවෙයි, ඒ පරම්පරාවේ පිරිස අන්දමන් දූපත්වලටත්, මොරිෂියස් දූපතටත් පිටුවහල් කර යැව්ව. ඉතිරි ඒවා—විශේෂයෙන් උඩරට ඉඩම් රාශියක්—මුඩුබිම් පනත යටතේ අධිරාජ්‍යවාදීන් විසින් රජයට අත් කර ගත්තා.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය මේ රට පාලනය කළ කාලයේදී අපේ නැසීගිය පළමුවෙනි අගමැතිතුමා වන ඩී. එස්. සේනානායක මැතිතුමා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් ඒ ආණ්ඩුවේ කටයුතු කළ බව තමුන්නාන්සේට මතක ඇති. ඒ කාලයේදී එතුමාට පෙනී ගියා, මුඩුබිම් පනත නිසා අපේ සිංහල ජනතාවගේ ඉඩම් සියල්ලක්ම විදේශිකයන්ට අත්පත් වුණු බව. විශේෂයෙන්ම මේ නිසා උඩරට ජනතාවට සිදු වුණා, ඉතා සුළු බිම් ප්‍රදේශයක පදිංචි වෙන්න. ඒ කුඩා ගම්මාන වටේටම සමා ගම්වලට අයත් වතු යායවල් තිබුණා. ඒ කාලයේදී යම් කෙනෙකුට ආණ්ඩුවෙන් ඉඩමක් ලබා ගන්නට ඕනෑ නම් ඔහු වෙන්දේසියකට ඉදිරිපත් විය යුතු බව තමුන්නාන්සේ දන්නව. ඒ වෙන්දේසි ක්‍රමය නිසයි, රජයේ ඉඩම් සියල්ලක්ම වගේ ධනපතියන් අතට පත් වුණේ. අදත් ධනපතින් අතේ තිබෙන වතු යාය වල් තමුන්නාන්සේලාට දකින්ට ලැබෙන්නෙ ඒ නිසයි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් මේ මුඩුබිම් පනත යටතේ මේ අන්දමට ඉදිරියටත් ඉඩම් දීමට ක්‍රියා කළොත් කව දාවත් මේ රටේ දුප්පත් මිනිහෙකුට ඉඩම් කැබැල්ලක් ලබා ගන්නට බැරි වන බව එදා නැසීගිය ඩී. එස්. සේනානායක අගමැතිතුමාට අවබෝධ වුණා. ඒ නිසා එතුමා විසින් ඒ අධිරාජ්‍යවාදීන්ගේ කාල යේදීම වැදගත් පනතක් සම්මත කර ගන්ට යෙදුණා. එනම් අදත් පවතින ඉඩම් ආඥාපනතයි. රජයේ ඉඩම් බෙදා දීමේදී පළමුවෙන් ඉඩම් නැති දුප්පත් පිරිසටත්, දෙවනුව මධ්‍යම පන්තියේ පිරිසටත් ඉඩම් දී ඉතුරු වූ අනවශ්‍ය ඉඩම් තිබෙනව නම් ඒවා ධනපතියන්ට බෙදා දිය යුතු බව ඒ පනතේ සඳහන් කර තිබෙනව. උතුරු මැද පළාත හා වියළි කලාපයේ වෙනත් ප්‍රදේශ දිහාත් බලන විට දුප්පත් ජනතාවට අද තමන්ගේ කියා ඉඩමක් තිබෙන නිසා අද අපට සන්තෝෂවන්ට පුළුවන් වී තිබෙන්නෙ නැසීගිය අගමැතිතුමා විසින් ඇති කරන්ට යෙදුණු ඒ වැඩ පිළිවෙල නිසයි. අද අපේ රටේ දුප්පත් ජනතාවට තමන්ගේය කියන්නට පුළුවන් ඉඩමක් තිබෙනවා. ඩී. එස්. සේනානායක මැතිතුමාගේ එම පනත නිසා අද අපේ රටේ දුප්පත් ජනතාවට කියන්නට පුළුවනි, "මට ගෙයක් හදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු හුරුල්ලේ]

ගන්නට ඉඩමක් තිබෙනවාය; මට වී ටිකක් වපුරා ගන්නට නැතිනම් වෙනත් බෝගයක් වපුරා ගන්නට ඉඩමක් තිබෙනවාය" යනාදී වශයෙන්, දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) කිව්වා. මේ ඉඩම් දීමේ ක්‍රමයෙන් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව දුප්පත් ජනතාවගේ ආර්ථික තත්ත්වය නගා සිටෙව්වේ නැතෙයි කියා. එහෙත් අද අපේ රජරට ප්‍රදේශය බලන විට අපට පෙනෙනවා තමන්ට බිම් අඟලක්වත් නැතුව සිටි පවුල් රාශියක් අද එහි සතුටින් වාසය කරන බව. ඒ උදවිය මෙම ඉඩම් ආඥාපනත යටතේ තමන්ට ඉඩම් ලබාගෙන තිබෙනවා. අද ඒ උදවිය එම ඉඩම්වල ගෙවල් හදාගෙන තිබෙනවා. වී මෝල් පවා සවි කරගෙන අද ඒ උදවිය විශාල ආදායම් පවා ලබන නිසා ඇතැම් දෙනා ආදායම් බදු පවා ගෙවන බව කියන්නට ඕනෑ. එයින් ඔප්පු වන්නේ නැද්ද, මේ දුප්පත් පිරිස ආර්ථික තත්ත්වයෙන් උසස් බවට පත් කළ බව. මා මෙම කතාව කරන්නට අදහස් කළේ විශේෂයෙන්ම වලපනේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. එම්. හේරත් මයා.) විසින් කරන ලද අසත්‍ය ප්‍රකාශය හේතුකොට ගෙනයි.

අ. භා. 6.32

**මෛත්‍රීපාල සේනානායක මයා.** (මැදවච්චිය)

*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*

(Mr. Maithripala Senanayake—Medawachchiya)

ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශවය වෙනුවෙන් අවසාන කතාව කරන්නට නියමව තිබුණේ විරුද්ධ පාර්ශවයේ නායිකාව වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියටයි. එහෙත් තවමත් එම මැතිනිය අසනීප තත්ත්වයෙන් සිටින නිසා එතුමිය වෙනුවෙන් මා කතා කරන්නට ඉදිරිපත් වන්නේ විශේෂයෙන් නින්දගම් හිමිකාරියක වශයෙන් එතුමියගේ සහයෝගයද මෙම පනතට දෙන බව මට මෙම අවස්ථාවේදී ප්‍රකාශ කරන්නටය කියා දන්වා එවා තිබෙන බවද ප්‍රකාශ කරමිනුයි.

මෙම පනත කොතෙක් දුරට සාර්ථක වේවිද යන්න පිළිබඳව විරුද්ධ පාර්ශවය වෙනුවෙන් පවත්වන ලද කථාවෙන් කථාවලින් එළිදරව් වුණා. එසේ හෙයින් එම කතාවලින් ඉදිරිපත් කරන ලද තර්ක නැවත වරක් ප්‍රකාශ කරමින් මෙම සභාවේ කාලය ගත කරන්නට මා අදහස් කරන්නේ නැහැ. එහෙත් මා එකක් කිව යුතුයි. ප්‍රවාහන ඇමතිතුමා කොතෙක් දුරට කියා සිටියත් අද මේ ඉදිරිපත් කර තිබෙන්නේ මොන විධියේ පනතක්ද යන්න අපට තේරුම් ගොස් තිබෙනවා. පසුගිය බලංගොඩ අතුරු මැතිවරණ කාලයේදී මහවල තැන්නටම ගොස් රැස්වීම් පවත්වා, "මේ ඉඩම් අරගෙන තමුන්නාන්සේලාට දෙනවාය" යනුවෙන් ප්‍රචාරය කොට අවසානයේ මේ ඉදිරිපත් කර තිබෙන්නේ මොන විධියේ පනතක්ද යන්න අපට තේරුම් ගන්නට පුළුවනි. ඒවායේ අයිතිය ඒවායේ වැඩ කරන ජනතාවටම ලබා දෙන්නට මෙම පනතින් බලාපොරොත්තු වෙනවා නම් මා එක අභියෝගයක් කරන්නට කැමතියි. මෙම පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පැවැත්වෙන කාරක සභා අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් අප ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන යම් යම් සංශෝධන තමුන්නාන්සේලා භාර ගන්නට ඕනෑ. එසේ භාර ගත්තොත් අපට විශ්වාස කරන්නට පුළුවනි, අතුරු මැතිවරණ කාලයේදී තමුන්නාන්සේලා එවැනි ප්‍රකාශ ඉදිරිපත් කළේ මහජන ඡන්ද ලබා ගැනීම සඳහා පමණක්ම නොව ඇත්ත වශයෙන්ම මේ රටේ පොදු මහජනතාවට ඒ මගින් යම්කිසි අයිතියක් ලබා දීමේ අදහසින්ද වන බව. ගරු ප්‍රවාහන ඇමතිතුමා කිව්වා, නින්දගම් දෙන ලද ක්‍රමය පිළිබඳව. රජදරුවන්ගේ කාලයේදී රජයට පක්ෂපාතව සිටි උදවියට නින්දගම් දුන් හැටි එතුමා කිව්වා. ඊළඟට අධිරාජ්‍ය වාදීන්ට පක්ෂපාතීව කටයුතු කළ අයට ලැබුණ නින්දගම් ප්‍රවාහන ඇමතිතුමා කිව්වා, නින්දගම් වර්තමාන මහජනතාවට ද්‍රෝහීකම් කරපු උදවියටත් නින්දගම් ඉඩම්වලින් නොලැබුණත් වෙනවෙනත් මාර්ගවලින් සැප සම්පත් ලැබී තිබෙන බව මෙම අවස්ථාවේදී නොකියාම බැරි බව මා නිර්භයව ප්‍රකාශ කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපේ නායිකාව වෙනුවෙන් මා විශේෂයෙන් ප්‍රකාශ කළයුතු දෙයක් තිබෙනවා. මැතිනියගේ නින්දගම් සම්බන්ධව කිසිම ප්‍රශ්නයක් ඇත්තේ නැහැ. මහවලතැන්න නින්දගමක් නොවෙයි. මහවලතැන්න මැතිනියගේ මැයනින් වහන්සේගේ ගම නිසා මහවලතැන්නේ මහජනතාව මුලා කොට ඔවුන්ගේ ඡන්දය ලබා ගන්නට යම් විධියක උපක්‍රමයක් යෙදුවත් එය නින්දගමක් නොවන බව ප්‍රකාශ කරන්නට කැමතියි. මේ විධියට බොරු ප්‍රචාරය කළාට මේ රටේ මහජනතාව රවටන්නට ඒ මගින් අවස්ථාවක් ලැබෙන්නේ නැති බව පැහැදිලිව ප්‍රකාශ කළ යුතුයි. අපේ අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) විසිනුත් දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) විසිනුත් මෙම පනතෙහි තිබෙන දුර්වලතාවයන් පැහැදිලිව පෙන්වා දුන්නා. මෙම පනතින් මහජනතාවට සහනයක් සලසා දෙන්නට රජය බලාපොරොත්තු වෙනවා නම් එහි මේ මේ අන්දමේ වෙනස්කම් කරන්නට ඕනැය කියා ඒ දෙපොලගේ කතාවලින් පැහැදිලිව එළිදරව් කරන්නට යෙදුණා. ඒ නිසයි අපි අභියෝග කරන්නෙ. ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන සංශෝධනවලින් දෙකක් පමණක් වැඩි කාලයක් මිඩංගු කරන්නේ නැතිව මේ ගරු සභාව ඉදිරිපිට තැබීමට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම පළමුවැනි පිටුවේ——

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You can read them but you cannot go into them.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

I will not.

"1 වෙනි පිටුවේ 8 වෙනි පේළියේ 'සම්බන්ධයෙන්' යන වචනයට පසුව 'කළ' යන වචනයට පෙර පහත සඳහන් වචන එකතු කරන්න: 'වැඩ වසම් ක්‍රමය යටතේ හිමිකම් සහ"

ඊළඟට මූලික වශයෙන් කළ යුතු සංශෝධනය මෙයයි:

"1 වැනි පිටුවේ 23 පේළියේ 3 වැනි වගන්තියට 3(1) අංකය යොදා පහත සඳහන් අලුත් වගන්තිය 24 වන පේළිය අගට එකතු කරන්න:

(2) (i) විහාරගම් හෝ දේවාලගම් ඉඩම්,

(ii) මෙම වගන්තියේ (1) වන උප වගන්තියට අදාළ වන ඉඩම්, හෝ

(iii) ආගමික කටයුත්තක් සඳහාම වෙන් වශයෙන්ම පාවිච්චි කරන ඉඩම්,

නොවන රාජකීය ප්‍රදානයක් වශයෙන් සන්නසකින්, ඕලාපතකින් හෝ ඔප්පුවකින් හෝ වෙනත් ලේඛනයකින් ඕනෑම කෙනෙකුට හෝ නින්ද හිමියෙකුට, ඒ ප්‍රකාරයටම 1866 සන්නස් හා පැරණි ඔප්පු ආඥා පනත යටතේ ලියාපදිංචි කර හෝ උසාවියේ තීරණයකින් හෝ ඉඩම් නිරවුල් ආඥා පනතේ (463 වන අධිකාරය) 4(1) (ඒ) උප වගන්තියේ විධිවිධානයන් යටතේ හෝ දෙනු ලැබූ පරිපාලනාත්මක තීරණයක් යටතේ හෝ දරණ එම හිමිකමට යටත්ව හා 1866 ඔක්තෝබර් මස 8 වන දින ඒ නයින් ඕනෑම පුද්ගලයෙකු හෝ පුද්ගලයන් විසින් මුල් ප්‍රදාන ලැබුම්කරුවන්ගෙන් ලත් පාරම්පරික හිමිකම අනුව අයිතිය දරණ ඉඩම්, එම ඉඩම්,

(අ) 1966 ඔක්තෝබර් මස 8 වන දින, කැලෑ මුඩුබිම්, පදිංචි නොවූ හෝ නොවවන ලද ඉඩම් හෝ,"

විශේෂයෙන්ම මැතිවරණ කාලයේදී දුන් පොරොන්දුව නිසා මේ දිනයේ සිට මෙය ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ නිසා අපි අභියෝග කරනවා මෙම දිනය ඇතුළත් වන මේ සංශෝධනය භාර ගන්නය කියා. ඊළඟට මා නැවත වරක් කියවන්නම්:

"(ආ) 1966 ඔක්තෝබර් මස 8 වන දිනට පෙර යම්කිසි වාසභූමියක් හෝ කර්මාන්ත හෝ වාණිජ කටයුත්තක් සඳහා නොයෙදූ වැවිලි නොකළ බණ්ඩාර ඉඩමක් වේ නම්,

මෙම පනතේ 6 වන වගන්තියේ සඳහන් නියමිත දිනයේ සිට රජයේ ඉඩම් වශයෙන් විය යුතු අතර ඒවායේ අයිතිය ලංකාණ්ඩුව වෙත පැවරිය යුතුයි."

මේ යෝජනාව ඉදිරිපත් කිරීමට අපි අදහස් කරනවා.

තවත් යෝජනා කීපයක් තිබෙන නමුත් මා මේ අවස්ථාවේදී ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ඔය දැන් ඉදිරිපත් කළ යෝජනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

දෙක පමණක් මේ වේලාවේදී ගරු සභාවට පැහැදිලිව ඒත්තු ගන්වන්න කැමතියි. දැනට රජයේ ප්‍රතිපත්ති මහජනතාවට ප්‍රකාශ කර තිබෙන පිළිවෙළට නම්, අපට තේරෙන හැටියට, මේ පනතින් මේ රටේ ඉඩම් කට්ටිකරුවන්ට කිසිම සහනයක් බලාපොරොත්තු වන්නට බැරි බව ප්‍රකාශ කරන අතර අඩු ගණනේ අප විසින් ඉදිරිපත් කළ මේ සංශෝධන දෙක පිළිගන්නේ නම් යම් විධියක සහනයක් ඒ ජනතාවට ලැබෙන බව අපේ විශ්වාසයයි. එසේ නොවුණොත් මේ පනත හේතුකොටගෙන මූලික වශයෙන් සිදු වන්නේ මොකක්ද? අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා ඉතා පැහැදිලි ලෙස ප්‍රකාශ කළා, මෙම පනත නිසා නඩු හබ වැඩි වෙනවා මිසක් වෙන මොනම සහනයක්වත් ඉඩම් කට්ටිකරුවන්ට අත් පත් වන්නේ නැත කියා. අප එය පැහැදිලි වශයෙන්ම මතක් කර දිය යුතුව තිබෙනවා.

කාල වේලා නොමැති නිසා අවසාන වශයෙන් අපේ ප්‍රවාහණ ඇමතිතුමා කී වචනයක් ගැන කරුණු දෙක තුනක් කිය යුතුව තිබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

May I interrupt please? මට උත්තර දෙන්න වෙලාව තිබෙන්න ඕනෑ. මට පැය භාගයක් දෙනවා කියා පොරොන්දු වී තිබෙන නිසා——

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

What am I to do? When the Hon. Minister got the chance to reply he said that the Hon. Minister of Communications wanted to speak.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)

It was arranged earlier.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

We had lengthy speeches from the Opposition without a single Member from the Government side speaking.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The last speaker from the Opposition is the hon. Member for Medawachchiya and he is on his feet now. He has the right of reply. The Hon. Minister has already interrupted him.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

ප්‍රවාහණ ඇමතිතුමා එක ප්‍රකාශයක් කළා. එතුමා කිව්වා එතුමාට පාරම්පරිකව ලැබුණ නින්දගම් සමහරක් නිකන් දුන්නාය, සමහරක් වටිනාකමෙන් සියයට එකක් පමණක් අය කර ඒ තිලකාරයන්ටම දුන්නාය කියා. අපි දැනගන්න කැමතියි, කොහෙද ඒ ඉඩම් තිබෙන්නේ, ඒ ගම්වල නම් මොනවාද, ඒවා කාටද දුන්නේ යනාදී විස්තර.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)

තමුන්නාන්සේ එහෙනේ ඉන්නේ. ඉතින් සොයාගන්න බැරියැ.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

මා එහෙ ඉන්න නිසා තමයි කියන්නේ. මම දන්නවා තමුන්නාන්සේ මහජනතාව රවටන්න බොරු කියන බව.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I do not think you should say "බොරු".

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)
තමුන්නාන්සේ ඒ විස්තර ඇතුළත් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න. මා රජ රට මනුෂ්‍යයෙක් නිසායි දන්නේ. එවැනි දෙයක් කෙරී තිබෙනවා නම් අපිත් දැන ගත යුතුයි.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹூருல்ல)*
(The Hon. Hurulle)
හොඳයි මම ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නම්.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)
එදා ඉඩම් ඇමතිතුමාගේ පළමුවෙනි කථාවෙදි කිව්වා, "ඔව්, අපේ පක්ෂයේ ඇමති කෙනෙක් නින්දගම් නිකම්ම දී තිබෙනවාය, එවැනි ඇමති කෙනෙක් අපේ පක්ෂයේ ඉන්නවාය" කියා. අද මේ ඇමතිතුමා කියනවා, කොටසක් නිකම් දුන්නාය, කොටසක් සියයට එකක වටිනාකමට දුන්නාය කියා. අප අභියෝග කරනවා ඇමතිතුමාට, කොයි ගමද දුන්නේ, කාටද දුන්නේ, කොයි ප්‍රදේශයේද තිබෙන්නේ, කොයි තුලානේද තිබෙන්නේ කියා—

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹூருல்ல)*
(The Hon. Hurulle)
ඔව් මම ඉදිරිපත් කරන්නම්.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)
ඇමතිතුමාගේ ගමත් මගේ ගමත් හැතැප්ම විසි ගණනක එහා මෙහායින්නුයි පිහිටා තිබෙන්නේ. එම නිසා ඔය කියන ඉඩම් කොහේද තිබෙන්නේ, කාටද දුන්නේ කියා මේ ගරු සභාවට විස්තර ඉදිරිපත් කරන ලෙස මම අභියෝග කරනවා.

මෙම පනත ස්ථාවර කාරක සභාවකට පවරනවා ඇත කියා අප බලාපොරොත්තු වන නිසා ඒ නිසි අවස්ථාවේදී සංශෝධන ඉදිරිපත් කිරීමට අපි අදහස් කරන අතර එසේ අප විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන පිළිගන්නේ නම් මෙවැනි පනතකින් ජනතාවට ලැබේවි යයි බලාපොරොත්තු විය හැකි සහනය ලබාගැනීමට පුළුවන් වනවා ඇතැයි ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 6.45

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ගරු කථානායකතුමනි, මා මුලින්ම කියන්න ඕනෑ මට පැය භාගයක් අවශ්‍යයි කියා. එම නිසා 7න් පසුව තවත් මිනිත්තු 15ක් මට ලබා දෙන්නය කියා, මා ඉල්ලනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
I am sorry I cannot allow further time. It was agreed that the vote should be taken at 7 o'clock and on that basis we were going on. The Government side should arrange their speakers in time. They did not do that.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
We did so but the Chair could not control one speaker. It does not matter.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
He was allowed to go on because there were no speakers—[*Interruption.*]—Please do not interrupt.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ගරු කථානායකතුමනි, මේ පනත නින්දගම් ඉඩම් පනතයි. නින්දගම් පනතක් නොවෙයි. "නින්දගම් ඉඩම්" යනුවෙනුයි මෙය හඳුන්වන්නේ. "නින්ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

ගම් ඉඩම් යනුවෙන් අදහස් කරන්නේ මොනවාද කියා මෙහි විස්තර කර තිබෙනවා. ඊට පිටින් යන්නේ නැහැ.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

ඒ අපි කිව්වට පස්සේ. මුලින් කිව්වේ නින්දගම් පනත කියායි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

නැහැ, නැහැ. මෙය මුලින්ම මුද්‍රණය කර තිබෙන්නේ "නින්දගම් ඉඩම්" පනත යනුවෙනුයි. Nindagam Lands නොහොත් නින්දගම් ඉඩම් සම්බන්ධ වයි මේ පනත සකස් කර තිබෙන්නේ. මෙහි 2 වෙනි සහ 3 වෙනි වගන්තිවල මෙසේ විස්තර කර තිබෙනවා. මම ඒ කොටස කියවන්නම්:

"2. යම් නින්දගම් ඉඩමක් දරන්නකුගෙන් හෝ එහි බදු කරුවකුගෙන් එහි අයිතිකරුට ලැබිය යුතු සේවා මෙයින් නැති කරනු ලබන අතර, ඒ අනුව—

(අ) ඒ ඉඩම් දරන්නකුගෙන් හෝ බදුකරුවකුගෙන් ඒ සේවා කරන මෙන් ඉල්ලීමට හෝ ඒ සේවාවලට හිලව් වශයෙන් (අය විය යුතු හෝ මතුවට අය විය හැකි) යම් මුදලක් ඉල්ලීමට හෝ බාර ගැනීමට එවැනි කිසිම අයිතිකරුවකුට හිමිකම් නො ලැබිය යුතුය ; තවද

(ආ) එවැනි කිසි ඉඩම් දරන්නකු හෝ බදුකරුවකු ඒ සේවා කිරීමට හෝ එවැනි මුදලක් ගෙවීමට බැඳී නො සිටිය යුතු ය."

"3. යම් නින්දගම් ඉඩමක් දරන්නකු හෝ එහි සෑම බදු කරුවකුම එහි අයිතිකරු වශයෙන් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ."

මේවායි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නින්දගම් ඉඩම් පනතේ පරමාර්ථය. කව්ද කීවා වාගේ, සර්ව ලෝකයම විනාශ කරන දෙයක් නොවෙයි. එහෙම දෙයක් මෙයින් කෙරෙන්නෙ නැහැ. සීමාසහිත බලතල ඇති පනතක් පමණයි මෙය. "නින්දගම් ලෑන්ඩ්ස් බිල්" නැති නම් නින්දගම් ඉඩම් පනත යනුවෙන් මේ පනත හඳුන්වනවා. මා දන්නෙ නැහැ දෙමළෙන් මොනවා කියනවාද කියා.

අනික් වැදගත් කාරණය නම්, සින්නක්කර ඉඩම් වන්දි නොගෙවා, රාජසන්තක කළ යුතුය යන අදහස මේ ආණ්ඩුව බාර ගන්නෙ නැහැ. ඒ අදහසම එස්. ඩබ්ලිව්. ආර්. ඩී බණ්ඩාරනායක මහතාත් දැරුවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ දෙවන ආණ්ඩුවත් ඒ අදහස 1960 සිට පිළිගත්තා. නමුත් දැන් ඒ ප්‍රතිපත්ති වෙනස් කර තිබෙනවාදැයි මා දන්නෙ නැහැ. කොහොම වුණත් අපේ ආණ්ඩුව සමසමාජ පක්ෂයෙ දේශපාලන ප්‍රතිපත්ති භාර ගන්න හෝ ඒ අයගේ අදහස් ඉෂ්ට කරන්න සූදානමක් නැහැ. කෙසේ වුණත් මෙම පනත බල පාන්නෙ, කුඹුරු අක්කර විසිපන්දහසකට සහ ගොඩ ඉඩම් අක්කර විසිපන්දහසකටයි. මෙම අක්කර පණස් දහස, නින්දගම් ඉඩම්වල වටිනාම හරියයි. ඒවාට මෙම පනත බල පානවා, ඒ අනුව ඒ ඉඩම් නින්දගම් අයිතිකරුවන්ට අහිමි වෙනවා. මේ කොටස කැලෑ, මූකලාන් ලඳු හෝ නොවෙයි. මෙම ඉඩම් ප්‍රමාණයෙන් වැඩි කොටසක් අයත්ව තිබෙන්නෙ මඩුවන්වල නින්දගම්වලට මිස මහ වලතැන්න නින්දගම් වලට නෙවෙයි. එම නිසා වැඩි පාඩුව මඩුවන්වලට මිස මහවලතැන්නට නොවෙයි.

ඊළඟට පංගුකාරයින් සොයන්නෙ කොහොමද කියන ප්‍රශ්නයකුත් මතු කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැම දිස්ත්‍රික්කයකම පංගු ලැයිස්තු තිබෙනවා. එය සකස් කර ඇත්තෙ "සර්විස් ටෙනුවර් ඕඩිනන්ස්" කියන පනත යටතේයි. එම නිසා නින්දගම් පංගුකාරයින් සොයා ගැනීම අමාරු නැහැ. බොහෝ අය මිය ගොස් පරම්පරා ගැන තොරතුරු සොයා ගැනීම අමාරු නිසා, මේවා ගැන බෙදුම් නඩු පැවරීම වැළැක්වීම සඳහා නිරවුල් කරලීම සඳහා, මණ්ඩලයක් පත් කර තිබෙනවා. එසේ මණ්ඩලයකින් නිරවුල් කළේ නැති නම් බෙදුම් නඩු පවරා ගෙන නොයෙකුත් ආරාවුල් ඇති කර ගන්න පුළුවනි. දිස්ත්‍රික් උසාවි ගොස් බෙදුම් නඩු කීම ඇතිවීම වැළැක්වීමයි මෙම මණ්ඩලය පත් කිරීමෙන් අදහස් කළේ.

ඒ හැරෙන්නට මෙම පනතින් බලය තිබෙනවා, රෙගුලාසි සෑදීමට; මෙම මණ්ඩලයට අවශ්‍ය පරිදි කටයුතු කරන්න,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවශ්‍ය ලියාපදිංචි කිරීම් කරන්න. ඔප්පු ලිවීම ආදිය කරන්න, බලය පැවරෙන සේ නීතිරීති සකස් කරන්න පුළුවනි. ඒ ඒ අවශ්‍ය අවස්ථාවන්හිදී රෙගුලාසි මෙම ගරු සභාවට ඉදිරිපත් කර සම්මත කර ගන්නවා ඇති. එවිට එම රෙගුලාසි ගැන වාද විවාද කිරීමට අවකාශ සැලසෙනවා ඇති.

මෙම පනත විහාර දේවාලගම් ඉඩම් කෙරෙහි බල නොපාන බව මා මෙයට පෙරත් සඳහන් කළා. යම්කිසි අවිශ්වාස යක් මේ සම්බන්ධයෙන් තිබෙනවා නම්, ප්‍රශ්න මතු වුණ විට අපට අවශ්‍ය සංශෝධන ඇති කරන්න පුළුවනි. මෙබඳු සංශෝධන ඇති කිරීම බොහොම සුළු දෙයක්. අවශ්‍ය නම් ඒ ඒ වෙලාවට එබඳු සංශෝධන කළ හැකියි.

වලපනේ මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කාරණා වගයක් සඳහන් කළා. එතුමා වැරදි වැටහීමකින් කථා කළ බව පෙනී ගියා. එතුමාට ඒ අවස්ථා වෙදි මා කීවා, නම් වශයෙන් සඳහන් කරන්න මා අකමැති බව. එතුමා සඳහන් කළ දේවල් අසත්‍ය බව, බොරු බව, මා පෙන්නා දුන්නා. අනික, මා පිහියෙන් ඇණ නින්දගමක් ගත්තාය කියාත් කීවා. මා දැන් ඔප්පු කරන්නම්, එතුමා ඒ අවස්ථාවේදී කී දේවල් අසත්‍ය බව. මා කී එක් කාරණයක් ගැන සන්නස් දැන් ගරු සභාවට ඉදිරිපත් කරන්න කැමතියි. සන්නස්වල කොපි මා ළඟ තිබෙනවා. මා කීවේ සත්‍යයක් බව ඔප්පු කිරීමට මා ඒ කොපි කිහිපයක් ඉදිරිපත් කරනවා. මා ඒ වෙලාවෙ කිව්වා—නැවත නත් කියන්නෙ නැහැ—නින්දගම් නොයෙක් අයට රජවරුන්ගෙන් ලැබු නාය, නැවත 1818 කැරැල්ලට ආධාර කරන්නට ගිය අයට ලැබුනාය කියා.

ගරු කථානායකතුමනි, මම පිහියෙන් ඇණලා මේ ආසනය ගත්තය කිව්වා. ඔබ තුමා ඒ කථාවට විරුද්ධ වුනා. මම ඒ වෙලාවෙත් සභානායක, දැනුත් සභා නායක. මට අළුත් දෙයක් ලැබුණෙ නැහැ. ඉංග්‍රීසීන්ට සේවය කළ යම් යම් අයට නින්දගම් ලැබුණා. මහවලතැන්න

නින්දගම් ලැබුනෙ නැත කියා මැදවච්චි යේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) කිව්වා. ලැබුනා.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)
මහවලතැන්න නින්දගමක් නොවෙයි කිව්වා. ලැබුනෙ නැත කිව්වෙ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඉංග්‍රීසීන්ගේ කාලයේදී දුන් සන්නස් දෙකක් මා ඉදිරිපත් කරනවා.

*The documents tabled are as follows :*

No. 4

| Royal Ensign |
|---|

"No. 65.

By His Excellency General Sir Robert Brownrigg, Baronet & Knight Grand Cross of the Most Honourable Military Order of the Bath, Governor & Commander in Chief in and over the British Settlements and Territories in the Island of Ceylon with Dependencies thereof.

(Seal) Robt. Brownrigg.

To all To whom These Presents Shall Come Greeting

Whereas the loyalty and good conduct of Mahawelatenne Wikremesinghe Chandrasekere Senewiratne Mudianse ———— have entitled him to some mark of Royal Favour and Munificence, and it is our desire to mark the sense We entertain of the same by a permanent Grant of Lands which by enduring to his Posterity shall ... a proof for the future, of the estimation in which their Ancestor was held, Now Know Ye; that we have by virtue of the Powers in us vested by ... Majesty, granted, assigned and set over, and ... by these presents grant, assign and set over unto the said Mahawolatenne Wikremesinhe Chandrasekere Senewiratne Mudianse the Muttettu Fields of the Village Moraheyla being Twentynine Ammonams in Extent ———————— with the Rights and appurtenances formerly enjoyed according to Custom by the Chief or Grantee of the said Village Moraheyla ———— being the Property ... in the possession of Our Sovereign Lord the King ... To have and to hold the said Muttettu Fields being Twenty Nine Ammonams in Extent situated in the Village Moraheyla

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

in Uduwak-Gampaha of the Kadawattu Korale in the Desavony of Saffra ... am ———— with its Rights & appurtenances unto the said Mahawolatenne Wickremesinhe Chandarasekere Senawiratne Mudianse ———— His Heirs and Assigns for ever in full right as Parveny or heritable Property, free of duty to ———— Government subject to all the existing Laws and Customs in respect to Esc.... or Forfeiture, and to such other General Regulations as may from time to time be enacted by the Authority of Government.

Given at Colombo in the said Island of Ceylon this Twenty Ninth day of January in the Year of our Lord one thousand Eight hundred and Twenty.

By His Excellency's Command

(Sgd.) .......

"No. 191.

By His Exc. .. Lieutenant General Sir .... Barnes Knight Comm. .... Most Honourable Military .... Bath, Governor and Com. .... Chief in and over the B. ........ ments and Territories in .... of Ceylon with the Depende ....

(Seal) Signed/E. Bar ........

To all to whom these presents .... come Greetings.

Whereas the loya .... good conduct of the late Ratwa ........ wardane Senevi-ratne Pan .... a Abeyakon Wahale Mudianse Secon .... Adikar have entitled him to some mark of Royal Favour and Munificen .... and it is our desire to mark the sense w .... entertain of the same by a permanent Grant of Lands which by enduring to his Posterity shall be a proof for the future of the estimation in which their Ancestor was held, Now Know Ye, that we have by virtue of the Powers in us vested .... His Majesty granted .... .... d set over and do by these .... .... ant, assign and set over .... Widow of the said .... Adikar in trust for .... the said Adikar who are .... .... ow to be hereafter divided .... them in the same manner .... paternal Property the Lands .... .... ned in the annexed List in .... of Thirty nine Ammunums ...... ghts, and appurtenances for .... enjoyed according to Custom .... Chief or Grantee of the said .... to have and to hold the said Lands mentioned .... the .... nexed List in Extent of .... Ammonums Three Pelahs .... Kurunis with their Rights .... ap .... tenances u .... to the said ....Rat-watte Adikar .... eirs of the said Adikar .... be hereafter .... in the same .... the .... .... ernal .... and .... as Parveny or .... .... to the condition of .... the produce of the same in .... One Tenth annually (....) agreed .... the present Grantee or his Heirs ...... A

and the Revenue Dep .... of Government in place of .... Service and Subject also to all .... existing laws and Customs .... to Escheat or Forfeiture and to .... other General Regulations as .... from time to time be enacted .... the Authority of Government.

Given at Colombo .... the said Island of Ceylon this Tenth day of September in the Year of Our Lord One Thousand Eight Hundred and Twenty eight.

By His Excellency's Command

Signed :/ Thos. Eden."

**ඉදිරිපත් කරන ලද සන්නස්**

......රත්වත්තෙ අදිකාරම් මහත්මයිංනෝ දූනට ලාබාලව සිටින්නා වූ උරුමක්කාරයින්ඩ පියවුරු මෙන් අයිති වුනු කුඹුරු......මිංමතු......බෙදා දීමට නියමව මෙම රත්වත්තෙ......අදිකාරම් මහත්මයි නෙත් මහත්මයින්ට බෙදා දුන්න ගම් පඟුවෙ කුඹුරුවල ගනන—......අමුනුගම තිබෙන දොඹකුඹුර මුල් බිජු පැල තුනයි—පට්ටියෙ කුඹුර අමුනයි—ගොනනෑපාන පැල තුනයි—නාපානගෙදරවෙල පැල දෙකයි—මාතලෙ මැදසිය පත්තුවෙ වැලිග...... තිබෙන දොඩන් මැවියාව එක අමුනයි—හිඹ්ගහ පිටිය පැලයි—මැදවෙල පැලයි—......ගොඩකුඹුර පැලයි—කුරුනි පහයි. දඹගහ හින්න පැල එකයි—.........ලියද්ද පැලයි—නාරන්වෙල පැලයි—......... කොටුව දෙ පැලයි—වැවෙකුඹුර......දෙපැලයි—නෙවුල්ගහ කොටුව දෙපැලයි—......පැල තුනයි—මාතලෙ ලග්ගල කෝරලේ රඹුක්කොළවෙ තිබෙන උක් අත්තෝවෙල මුල් බිජු අමුනු පහයි—මුත්තෙට්ටු වෙල අමුනු පහයි—......පිටියේවෙල අමුනු තුනයි—මැලල්ගොල්ලෙවෙල තුනුමුනයි—......වෙලකුඹුර අමුනයි—......අමුනු හතරයි—බිත්තැත්තේ...... වත්තෙ තිබෙන නෙළුන්මල්ල......මැදවෙල කුඹුර අමුනු තුනයි—......කොටුව අමුනයි—මෙකුම කුඹුරු වල මුල් බිජු තරම වී තිස්නම අමු......තුන් පැල කුරුනු පහයි————

